# අ.පො.ස. (උ.පෙළ) විභාගය - 2018

# ඇගයීම් වාර්තාව

# 71 - සිංහල

Curriculum
Assessment
&
Evaluation
Teaching
Learning
N E T S

පර්යේෂණ හා සංවර්ධන ශාඛාව,
ජාතික ඇගයීම් හා පරීක්ෂණ සේවාව,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව.

# අ.පො.ස. (උ.පෙළ) විභාගය - 2018

# ඇගයීම් වාර්තාව

# 71 - සිංහල

**පර්යේෂණ හා සංවර්ධන ශාඛාව**
**ජාතික ඇගයීම් හා පරීක්ෂණ සේවාව,**
**ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව.**

**සියලු ම හිමිකම් ඇවිරිණි.**

**සිංහල**

ඇගයීම් වාර්තාව - අ.පො.ස. (උපෙළ) විභාගය - 2018

# හැඳින්වීම

අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය, ශ්‍රී ලංකාවේ ජ්‍යෙෂ්ඨ ද්විතීයික අධ්‍යාපනයේ අවසාන සහතිකකරණ විභාගය යි. ජ්‍යෙෂ්ඨ ද්විතීයික අධ්‍යාපනය අවසානයේ සිසුන්ගේ සාධන මට්ටම සහතික කිරීම මෙම විභාගයේ ප්‍රධාන අරමුණ වුව ද ජාතික විශ්වවිද්‍යාලයවලට, වෙනත් උසස් අධ්‍යාපන හා වෘත්තීය පුහුණු ආයතනවලට මෙන් ම ජාතික අධ්‍යාපන විද්‍යාපීඨවලට සුදුස්සන් තෝරා ගැනීම ද මෙම විභාගයේ ප්‍රතිඵල මත සිදු කෙරෙන බැවින් සාධන පරීක්ෂණයක් වශයෙන් මෙන් ම තේරීමේ පරීක්ෂණයක් වශයෙන් ද අ.පො.ස. (උ.පෙළ) විභාගය, ඉතා වැදගත් තත්ත්වයක් උසුලයි. එමෙන් ම තෘතීයික මට්ටමේ රැකියා සඳහා ද ප්‍රවේශ සුදුසුකම් සහතික කෙරෙන විභාගයක් වශයෙන් මෙය පිළිගැනේ. 2018 වර්ෂයේ දී මෙම විභාගය සඳහා 218191ක් පාසල් අපේක්ෂකයෝ ද, 48920ක් පෞද්ගලික අපේක්ෂකයෝ ද පෙනී සිටියහ.

මෙම විභාගයෙන් උසස් සාධන මට්ටමක් ලබා ගැනීම සඳහා සිසුහු ද ඔවුන්ගේ එම අපේක්ෂා සපුරාලීම සඳහා ගුරුවරු හා දෙමව්පියෝ ද දැඩි වෙහෙසක් දරති. මෙම ඇගයීම් වාර්තාව සකස්කර ඇත්තේ ඔවුන්ගේ එම අපේක්ෂා ඉටුකර ගැනීම පිණිස ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවෙන් සහාය ලබා දීමක් වශයෙනි. මෙම ඇගයීම් වාර්තාවේ ඇතුළත් තොරතුරු විභාග අපේක්ෂකයන්ට, ගුරු භවතුන්ට, විදුහල්පතිවරුන්ට, ගුරු උපදේශක මහත්ම මහත්මීන්ට, විෂයභාර අධ්‍යක්ෂවරුන්ට, දෙගුරුන්ට හා අධ්‍යාපන පර්යේෂකයින්ට එක සේ ප්‍රයෝජනවත් වනු නො අනුමාන ය. එබැවින් මෙම වාර්තාව වැඩි පිරිසකගේ පරිශීලනය සඳහා යොමු කිරීම වඩාත් සුදුසු වේ.

මෙම ඇගයීම් වාර්තාව I, II හා III යනුවෙන් කොටස් තුනකින් සමන්විත වේ. අ.පො.ස. (උ.පෙළ) සිංහල විෂයයෙහි විෂය අභිමතාර්ථ හා විෂය සාධනය පිළිබඳ තොරතුරු මෙම වාර්තාවේ I කොටසෙහි අඩංගු වේ. ඒ යටතේ විෂයය සඳහා පෙනී සිටි අපේක්ෂකයන් සංඛ්‍යාව, ඔවුන් ශ්‍රේණි ලබා ගෙන ඇති ආකාරය, දිස්ත්‍රික් මට්ටමින් පාසල් අපේක්ෂකයන් ශ්‍රේණි ලබා ගෙන ඇති ආකාරය, පන්ති ප්‍රාන්තර අනුව ලකුණු ව්‍යාප්තිය යන විෂය සාධනය පිළිබඳ සංඛ්‍යානමය තොරතුරු ද සිංහල විෂයයේ I හා II පත්‍රවල ප්‍රශ්න තෝරා ගෙන ඇති ආකාරය, එම ප්‍රශ්නවලට හා එම එක් එක් ප්‍රශ්නයෙහි කොටස්වලට ලකුණු ලබා ගෙන ඇති ආකාරය සවිස්තරාත්මක ව දැක්වෙන විෂය සාධනය පිළිබඳ විශ්ලේෂණයක් ද අන්තර්ගත වේ. අ.පො.ස. (උ.පෙළ) 2018 විභාගයේ සිංහල විෂයයෙහි I හා II ප්‍රශ්න පත්‍රවල ප්‍රශ්න හා එම ප්‍රශ්නවලට අපේක්ෂකයන් පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු මෙම වාර්තාවේ II කොටසෙහි අඩංගු වෙයි. ඒ යටතේ I හා II ප්‍රශ්න පත්‍රවල ප්‍රශ්න සඳහා අපේක්ෂිත පිළිතුරු, ලකුණු දීමේ පටිපාටිය, පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ, නිගමන හා සංවර්ධනාත්මක යෝජනා අන්තර්ගත වේ. ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ පර්යේෂණ හා සංවර්ධන ශාඛාව මගින් උත්තර පත්‍ර ඇගයීමේ නිරත වූ ප්‍රධාන, අතිරේක ප්‍රධාන හා සහකාර පරීක්ෂකවරුන් විසින් ඉදිරිපත් කරනු ලබන තොරතුරු, නිරීක්ෂණ, අදහස් හා යෝජනා ද සම්භාව්‍ය පරීක්ෂණ න්‍යාය (Classical Test Theory) හා අයිතම ප්‍රතිචාර න්‍යාය (Item Response Theory) යොදා ගනිමින් අපේක්ෂකයන්ගේ ප්‍රතිචාර විශ්ලේෂණය මගින් ලබා ගත් තොරතුරු ද මෙම ඇගයීම් වාර්තාව සකස් කිරීම සඳහා පදනම් කර ගෙන ඇත.

ප්‍රශ්න පත්‍රවල එක් එක් ප්‍රශ්නයට පිළිතුරු සැපයීමේ දී අපේක්ෂකයන් සැලකිලිමත් විය යුතු කරුණු ද ඉගෙනුම් ඉගැන්වීම් කාර්යය පිළිබඳ අදහස් හා යෝජනා ද මෙම වාර්තාවෙහි III කොටසෙහි ඇතුළත් කර ඇත. විවිධ නිපුණතා හා එම නිපුණතා මට්ටම්වලට ළඟා වීම සඳහා ඉගෙනුම් හා ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කර ගත යුතු ආකාරය පිළිබඳ ව මෙයින් මහත් පිටිවහලක් ලැබෙනු ඇතැයි සිතමි.

ඉදිරියේ දී සම්පාදනය කරනු ලබන ඇගයීම් වාර්තාවල ගුණාත්මක වර්ධනයක් ඇති කිරීම සඳහා ඵලදායී අදහස් හා යෝජනා අප වෙත යොමු කරන ලෙස කාරුණික ව ඉල්ලමි. මෙම වාර්තාව සැකසීම සඳහා අවශ්‍ය තොරතුරු සැපයූ ප්‍රධාන, අතිරේක ප්‍රධාන පරීක්ෂකවරුන්ට හා සහකාර පරීක්ෂකවරුන්ටත්, උනන්දුවෙන් හා සක්‍රිය ව දායක වූ සැකසුම් කමිටු සාමාජිකයන්ටත්, වගකීමෙන් කටයුතු කළ ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ට හා මෙම කාර්ය මණ්ඩලයටත් මාගේ හෘදයංගම ස්තුතිය පළ කරමි.

බී. සනත් පූජිත
විභාග කොමසාරිස් ජනරාල්

2020.05.28
පර්යේෂණ හා සංවර්ධන ශාඛාව
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
පැලවත්ත, බත්තරමුල්ල.

| | | |
|---|---|---|
| **උපදේශකත්වය** | : | බී. සනත් පූජිත<br>විභාග කොමසාරිස් ජනරාල් |
| **මෙහෙයවීම හා සංවිධානය** | : | ගයාත්‍රි අබේගුණසේකර<br>විභාග කොමසාරිස්<br>(පර්යේෂණ හා සංවර්ධන) |
| **සම්බන්ධීකරණය** | : | එස්. ප්‍රනවදාසන්<br>නියෝජ්‍ය විභාග කොමසාරිස්<br>(පර්යේෂණ හා සංවර්ධන- පාසල් විභාග) |
| **විෂය සම්බන්ධීකරණය** | : | පී.ඩී.එන්. මැණිකේ<br>සහකාර විභාග කොමසාරිස් |
| **සංස්කරණය** | : | මහාචාර්ය රත්න විජේතුංග<br><br>පූජ්‍ය ආචාර්ය මොරකන්දේගොඩ අරියවංස හිමි<br>ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය<br>රුහුණ විශ්වවිද්‍යාලය<br><br>ශ්‍රියානි අබේවික්‍රම<br>ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවය I (විශ්‍රාමික)<br><br>ඊ.ආර්.නිමල් ප්‍රේමකුමාර<br>ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය (විශ්‍රාමික)<br>ජාතික අධ්‍යාපන ආයතනය |
| **සැකසුම් කමිටුව** | : | වාසනා පයාගල<br>ගුරු සේවය I<br>නාලන්දා විද්‍යාලය<br>කොළඹ 10<br><br>ධම්මික පරාක්‍රම<br>ගුරු සේවය I<br>ක/ විද්‍යාරත්න පිරිවෙන් විද්‍යායතනය, හොරණ<br><br>ආර්.කේ.ජී.එල්. පද්මසිරි<br>ගුරු උපදේශක (ගුරු සේවය I)<br>කොට්ඨාස අධ්‍යාපන කාර්යාලය - නක්කාවත්ත |

| | | |
|---|---|---|
| | | මංගලිකා අබේගුණවර්ධන<br>ගුරු සේවය I<br>මාර/ තල්පාවිල ම.ම.වි<br>දෙවිනුවර, මාතර |
| | | බී.එම්.කේ. බණ්ඩාරනායක<br>ගුරු සේවය I<br>ගම්/හේමමාලී මහා විද්‍යාලය<br>ගම්පහ |
| **පරිගණක පිටපත සැකසුම** | : | ඉෂානි කෞෂල්‍යා රුහුණගේ<br>පරිගණක දත්ත සටහන් ක්‍රියාකරු |
| **පිටකවරය නිර්මාණය** | : | ඒ.එල්.කේ. චතුරාණි<br>කළමනාකරණ සේවා නිලධාරි |

# ඇතුළත පිටු

පිටු අංකය


**I කොටස**

**1. විෂය අභිමතාර්ථ හා විෂය සාධනය පිළිබඳ තොරතුරු**

**1.1** විෂය අභිමතාර්ථ 1

**1.2** විෂය සාධනය පිළිබඳ සංඛ්‍යානමය තොරතුරු

1.2.1 විෂයය සඳහා පෙනී සිටි අපේක්ෂකයන් සංඛ්‍යාව 2
1.2.2 අපේක්ෂකයන් ශ්‍රේණි ලබා ගෙන ඇති ආකාරය 2
1.2.3 ප්‍රථමවරට පෙනී සිටි පාසල් අපේක්ෂකයන් ශ්‍රේණි ලබා ගෙන ඇති ආකාරය - දිස්ත්‍රික්ක අනුව 3
1.2.4 ලකුණු ලබා ගෙන ඇති ආකාරය - පන්ති ප්‍රාන්තර අනුව 4

**1.3** විෂය සාධනය පිළිබඳ විශ්ලේෂණය

1.3.1 I ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රශ්න තෝරා ගෙන ඇති ආකාරය 5
1.3.2 I ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රශ්න සඳහා ලකුණු ලබා ගෙන ඇති ආකාරය 5
1.3.3 I ප්‍රශ්න පත්‍රය සඳහා සාධනය 6
1.3.4 II ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රශ්න තෝරා ගෙන ඇති ආකාරය 7
1.3.5 II ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රශ්න සඳහා ලකුණු ලබා ගෙන ඇති ආකාරය 7
1.3.6 II ප්‍රශ්න පත්‍රය සඳහා සාධනය 8

**II කොටස**

**2.** ප්‍රශ්න හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු

**2.1** I ප්‍රශ්න පත්‍රය හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු

2.1.1 I ප්‍රශ්න පත්‍රයේ ව්‍යුහය 10
2.1.2 I ප්‍රශ්න පත්‍රය සඳහා අපේක්ෂිත පිළිතුරු 11
2.1.3 I ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා 31

**2.2** II ප්‍රශ්න පත්‍රය හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු

2.2.1 II ප්‍රශ්න පත්‍රයේ ව්‍යුහය 33
2.2.2 II ප්‍රශ්න පත්‍රය - I කොටස 34
2.2.3 II ප්‍රශ්න පත්‍රයේ I කොටස සඳහා අපේක්ෂිත ලකුණු දීමේ පටිපාටිය 36
2.2.4 II ප්‍රශ්න පත්‍රයේ I කොටසට එක් එක් ප්‍රශ්නයෙහි වරණ තෝරා ඇති ආකාරය - ප්‍රතිශත ලෙස 37
2.2.5 II ප්‍රශ්න පත්‍රයේ I කොටසට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා 38
2.2.6 II ප්‍රශ්න පත්‍රයේ I කොටසට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ (වර්ගීකරණය අනුව) 41
2.2.7 II ප්‍රශ්න පත්‍රයේ II කොටස හා අපේක්ෂිත පිළිතුරු, ලකුණු දීමේ පටිපාටිය, පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ, නිගමන හා යෝජනා 43
2.2.8 II ප්‍රශ්න පත්‍රයේ II කොටසට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා 63

**III කොටස**

**3.** පිළිතුරු සැපයීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු හා යෝජනා

3.1 පිළිතුරු සැපයීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු 64
3.2 ඉගෙනුම් හා ඉගැන්වීම් ක්‍රියාවලිය පිළිබඳ අදහස් හා යෝජනා 66

# I කොටස

## 1. විෂය අභිමතාර්ථ හා විෂය සාධනය පිළිබඳ තොරතුරු

### 1.1 විෂයයෙහි අභිමතාර්ථ

- ලේඛන ව්‍යවහාරය පාදක කොටගෙන මනා අවබෝධයෙන් යුතු ව ශ්‍රවණය, කථනය, පඨනය (කියවීම), ලේඛනය යන චතුර්විධ භාෂා කුසලතා සංවර්ධනය කිරීම
- ලිඛිත ප්‍රකාශන නිරවුල් ව හා අවබෝධයෙන් යුතු ව ඉදිරිපත් කිරීම සඳහා නිවැරදි භාෂා කුසලතා වර්ධනය කිරීම
- ලේඛන ව්‍යවහාරය ආශ්‍රිත ව අක්ෂර, පද, වාක්‍ය හා අර්ථ භාවිතය පිළිබඳ පරිචයක් ඇති කිරීම
- කාලීන සමාජ පරිසරයේ පවත්නා වස්තු හා සිදුවීම් පිළිබඳ නිරවුල් අවබෝධය වර්ධනය කිරීම
- සංශ්ලේෂණ හා විශ්ලේෂණ කුසලතා වර්ධනය කිරීම
- විවිධ මානව චර්යා හා ජීවන වෘත්තීන්ට අදාළ ව ප්‍රායෝගික ව භාෂාව භාවිත කිරීමේ කුසලතා වර්ධනය කිරීම
- සංස්කෘතික දායාද, සාම්ප්‍රදායික ආචාර ධර්ම, ජීවන දෘෂ්ටි, ආකල්ප හා ඇගයීම් පිළිබඳ කුසලතා සිංහල භාෂා සාහිත්‍යය පාදක කොට ගෙන වර්ධනය කිරීම
- සාහිත්‍ය නිර්මාණ පරිශීලනය මගින් ලබා ගත් පරිචය හා අත්දැකීම් ආශ්‍රයෙන් සාහිත්‍ය රසඥතා වර්ධනය හා නිර්මාණකරණය සඳහා යොමු කිරීම

## 1.2 විෂය සාධනය පිළිබඳ සංඛ්‍යානමය තොරතුරු

### 1.2.1 විෂයය සඳහා පෙනී සිටි අපේක්ෂකයන් සංඛ්‍යාව

| මාධ්‍යය | පාසල් | පෞද්ගලික | එකතුව |
|---|---|---|---|
| සිංහල | 54323 | 13035 | 67358 |

වගුව 1

### 1.2.2 අපේක්ෂකයන් ශ්‍රේණි ලබා ගෙන ඇති ආකාරය

| ශ්‍රේණිය | පාසල් අපේක්ෂකයන් | | පෞද්ගලික අපේක්ෂකයන් | | එකතුව | ප්‍රතිශතය |
|---|---|---|---|---|---|---|
| | සංඛ්‍යාව | ප්‍රතිශතය | සංඛ්‍යාව | ප්‍රතිශතය | | |
| A | 7104 | 13.07 | 1084 | 8.32 | 8188 | 12.16 |
| B | 15730 | 28.96 | 2832 | 21.73 | 18562 | 27.56 |
| C | 18933 | 34.85 | 4495 | 34.48 | 23428 | 34.78 |
| S | 9054 | 16.67 | 3139 | 24.08 | 12193 | 18.10 |
| F | 3502 | 6.45 | 1485 | 11.39 | 4987 | 7.40 |
| එකතුව | **54323** | **100** | **13035** | **100** | **67358** | **100.00** |

වගුව 2

**1.2.3 ප්‍රථම වරට පෙනී සිටි පාසල් අපේක්ෂකයන් ශ්‍රේණි ලබා ගෙන ඇති ආකාරය - දිස්ත්‍රික්ක අනුව**

| දිස්ත්‍රික්කය | පෙනී සිටි සංඛ්‍යාව | විශිෂ්ට සම්මාන සාමර්ථ්‍යය (A) ලැබූ | | අධි සම්මාන සාමර්ථ්‍යය (B) ලැබූ | | සම්මාන සාමර්ථ්‍යය (C) ලැබූ | | සාමාන්‍ය සාමර්ථ්‍යය (S) ලැබූ | | සමත් (A+B+C+S) | | අසමත් (F) | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % |
| 1. කොළඹ | 2980 | 204 | 6.85 | 633 | 21.24 | 1144 | 38.39 | 697 | 23.39 | 2678 | 89.87 | 302 | 10.13 |
| 2. ගම්පහ | 4359 | 538 | 12.34 | 1024 | 23.49 | 1519 | 34.85 | 886 | 20.33 | 3967 | 91.01 | 392 | 8.99 |
| 3. කළුතර | 2716 | 421 | 15.50 | 773 | 28.46 | 825 | 30.37 | 476 | 17.53 | 2495 | 91.86 | 221 | 8.14 |
| 4. මහනුවර | 3122 | 292 | 9.35 | 715 | 22.90 | 1161 | 37.19 | 650 | 20.82 | 2818 | 90.26 | 304 | 9.74 |
| 5. මාතලේ | 1411 | 188 | 13.32 | 397 | 28.14 | 473 | 33.52 | 260 | 18.43 | 1318 | 93.41 | 93 | 6.59 |
| 6. නුවරඑළිය | 909 | 62 | 6.82 | 210 | 23.10 | 362 | 39.83 | 215 | 23.65 | 849 | 93.40 | 60 | 6.60 |
| 7. ගාල්ල | 3348 | 468 | 13.98 | 962 | 28.73 | 1078 | 32.20 | 546 | 16.31 | 3054 | 91.22 | 294 | 8.78 |
| 8. මාතර | 2493 | 340 | 13.63 | 681 | 27.32 | 764 | 30.65 | 454 | 18.21 | 2239 | 89.81 | 254 | 10.19 |
| 9. හම්බන්තොට | 1835 | 226 | 12.32 | 486 | 26.49 | 650 | 35.42 | 301 | 16.40 | 1663 | 90.63 | 172 | 9.37 |
| 10. යාපනය | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| 11. කිලිනොච්චි | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| 12. මන්නාරම | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| 13. වව්නියාව | 51 | 4 | 7.84 | 19 | 37.25 | 16 | 31.37 | 6 | 11.78 | 45 | 88.24 | 6 | 11.76 |
| 14. මුලතිව් | 18 | 1 | 5.56 | 6 | 33.33 | 6 | 33.33 | 4 | 22.22 | 17 | 94.44 | 1 | 5.56 |
| 15. මඩකලපුව | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| 16. අම්පාර | 896 | 102 | 11.38 | 214 | 23.89 | 335 | 37.39 | 189 | 21.09 | 840 | 93.75 | 56 | 6.25 |
| 17. ත්‍රිකුණාමලය | 297 | 25 | 8.42 | 61 | 20.54 | 110 | 37.04 | 74 | 24.92 | 270 | 90.91 | 27 | 9.09 |
| 18. කුරුණෑගල | 3885 | 610 | 15.70 | 1095 | 28.19 | 1367 | 35.19 | 635 | 16.34 | 3707 | 95.42 | 178 | 4.58 |
| 19. පුත්තලම | 1540 | 149 | 9.68 | 450 | 29.22 | 574 | 37.27 | 268 | 17.40 | 1441 | 93.57 | 99 | 6.43 |
| 20. අනුරාධපුරය | 2403 | 277 | 11.53 | 582 | 24.22 | 903 | 37.58 | 459 | 19.10 | 2221 | 92.43 | 182 | 7.57 |
| 21. පොළොන්නරුව | 943 | 149 | 15.80 | 243 | 25.77 | 318 | 33.72 | 174 | 18.45 | 884 | 93.74 | 59 | 6.26 |
| 22. බදුල්ල | 2058 | 160 | 7.77 | 515 | 25.02 | 874 | 42.47 | 408 | 19.83 | 1957 | 95.09 | 101 | 4.91 |
| 23. මොනරාගල | 1407 | 120 | 8.54 | 368 | 26.15 | 526 | 37.38 | 271 | 19.26 | 1285 | 91.33 | 122 | 8.67 |
| 24. රත්නපුරය | 2603 | 297 | 11.41 | 702 | 26.96 | 923 | 35.46 | 464 | 17.83 | 2386 | 91.66 | 217 | 8.34 |
| 25. කෑගල්ල | 2311 | 321 | 13.89 | 661 | 28.60 | 792 | 34.27 | 417 | 18.05 | 2191 | 94.81 | 120 | 5.19 |
| **සමස්ත දිවයින** | 41585 | 4954 | 11.91 | 10797 | 25.96 | 14720 | 35.39 | 7854 | 18.88 | 38325 | 92.16 | 3260 | 7.83 |

1.2.4 ලකුණු ලබා ගෙන ඇති ආකාරය - පන්ති ප්‍රාන්තර අනුව


| පන්ති ප්‍රාන්තරය | සංඛ්‍යාතය | සංඛ්‍යාත ප්‍රතිශතය | සමුච්චිත සංඛ්‍යාතය | සමුච්චිත සංඛ්‍යාත ප්‍රතිශතය |
|---|---|---|---|---|
| 91-100 | 1 | 0.00 | 67358 | 100.00 |
| 81-90 | 1413 | 2.10 | 67357 | 100.00 |
| 71-80 | 13828 | 20.53 | 65944 | 97.90 |
| 61-70 | 18885 | 28.04 | 52116 | 77.37 |
| 51-60 | 14920 | 22.15 | 33231 | 49.33 |
| 41-50 | 9490 | 14.09 | 18311 | 27.18 |
| **31-40** | **5717** | **8.49** | **8821** | **13.10** |
| 21-30 | 2626 | 3.90 | 3104 | 4.61 |
| 11-20 | 397 | 0.59 | 478 | 0.71 |
| 01-10 | 80 | 0.12 | 81 | 0.12 |
| 00-00 | 1 | 0.00 | 1 | 0.00 |

වගුව 4

උදා:- (31 - 40 පංති ප්‍රාන්තරය ගතහොත්)

මෙම විෂයය සඳහා 31 - 40 ප්‍රාන්තරය තුළ ලකුණු ලබා ගත් සංඛ්‍යාව 5717කි. එය ප්‍රතිශතයක් වශයෙන් 8.49%කි. ලකුණු 40 හෝ ඊට අඩුවෙන් ලබා ඇති අපේක්ෂයන් සංඛ්‍යාව 8821ක් වන අතර, එය ප්‍රතිශතයක් වශයෙන් 13.10%කි.

### 1.3.1 I ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රශ්න තෝරා ගෙන ඇති ආකාරය





මෙම ප්‍රස්තාරයෙන් තොරතුරු ලබා ගන්නා ආකාරය පහත සඳහන් උදාහරණයෙන් පෙන්වා දී ඇත.

උදා:-මෙහි 1 ප්‍රශ්නය අනිවාර්ය වුව ද ප්‍රශ්නයට පිළිතුරු සැපයීමට උත්සාහ දරා ඇත්තේ අපේක්ෂකයන්ගෙන් 98%ක් පමණි. අඩු ම ප්‍රතිශතයක් තෝරා ගෙන ඇත්තේ 4 ප්‍රශ්නය වන අතර එය තෝරා ගෙන ඇත්තේ අපේක්ෂකයන්ගෙන් 28%ක් පමණි. අංක 2 සිට 8 දක්වා වූ ප්‍රශ්න අතුරෙන් අභිමත ප්‍රශ්න හතරක් තෝරා ගෙන පිළිතුරු සැපයිය යුතු ය.

ප්‍රස්තාරය 1 (RD/16/02/AL පෝරමයෙන් ලබා ගත් තොරතුරු ඇසුරින් සකස් කරන ලදි.)

### 1.3.2. I ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රශ්න සඳහා ලකුණු ලබා ගෙන ඇති ආකාරය





මෙම ප්‍රස්තාරයෙන් තොරතුරු ලබා ගන්නා ආකාරය පහත සඳහන් උදාහරණයෙන් පෙන්වා දී ඇත.

උදා: මෙහි 1 ප්‍රශ්නය සඳහා වෙන් කර ඇති ලකුණු ප්‍රමාණය 40කි. එම ලකුණුවලින් 76% - 100% ප්‍රාන්තරයේ ලකුණු ගත් අපේක්ෂයන්ගේ ප්‍රතිශතය10%කි. එමෙන් ම වෙන් කර ඇති ලකුණු 0% - 25% ප්‍රාන්තරයේ, ලකුණු ලබා ගත් ප්‍රතිශතය 9%කි.

ප්‍රස්තාරය 2 (RD/16/02/AL පෝරමයෙන් ලබා ගත් තොරතුරු ඇසුරින් සකස් කරන ලදි.)

**අ.පො.ස. (උ.පෙළ) විභාගය - 2018**
**71 - සිංහල - I පත්‍රය**
**ප්‍රශ්නවල පහසුතා දර්ශක**




ප්‍රස්තාරය 3 (RD/16/04/AL පෝරමයෙන් ලබා ගත් තොරතුරු ඇසුරින් සකස් කරන ලදි.)


ඉහත ප්‍රස්තාරයෙන් තොරතුරු ලබා ගන්නා ආකාරය පහත සඳහන් උදාහරණයෙන් පෙන්වා දී ඇත.

මෙහි ඉහළ ම පහසුතාව දක්වා ඇත්තේ පළමු ප්‍රශ්නයේ (ඉ) කොටසෙහි ii අනුකොටසට ය. එහි පහසුතා දර්ශකය 0.92කි. එනම් එහි පහසුතාව 92%කි. එයින් අදහස් වන්නේ අපේක්ෂකයන්ගෙන් 92%ක් එම ප්‍රශ්නයට සාර්ථක පිළිතුරු සපයා ඇති බව යි. .

අවම පහසුතාව දක්වා ඇත්තේ (ඊ) කොටසෙහි (ii) අනුකොටසට ය. එහි පහසුතා දර්ශකය 0.04කි. එයින් අදහස් වන්නේ අපේක්ෂයන්ගෙන් 4%ක පිරිසක් පමණක් මෙම ප්‍රශ්නයට සාර්ථක පිළිතුරු සපයා ඇති නමුත් 96%ක පිරිසක් සාර්ථක ව පිළිතුරු සැපයීමට අසමත් වී ඇති බව යි.

### 1.3.3 I ප්‍රශ්න පත්‍රය සඳහා සාධනය

### 1.3.4 II ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රශ්න තෝරා ගෙන ඇති ආකාරය





ප්‍රස්තාරය 4 (RD/16/02/AL පෝරමයෙන් ලබා ගත් තොරතුරු ඇසුරින් සකස් කරන ලදි.)

මෙම ප්‍රස්තාරයෙන් තොරතුරු ලබා ගන්නා ආකාරය පහත සඳහන් උදාහරණයෙන් පෙන්වා දී ඇත.

උදා:- මෙහි පළමු වන ප්‍රශ්නයේ කොටස් ප්‍රශ්න 20ක් ඇති අතර, එක් එක් ප්‍රශ්නයකට දී ඇති වරණ පහ අතුරෙන් නිවැරදි වරණය තේරිය යුතු ය. ඒ සඳහා එක් ප්‍රශ්නයකට ලකුණු 01 ක බැගින් ලකුණු 20ක් හිමි වේ. 1, 2 හා 3 ප්‍රශ්න අනිවාර්ය ප්‍රශ්න වන අතර එම ප්‍රශ්න සඳහා පිළිතුරු සපයා ඇත්තේ පිළිවෙළින් 96%, 97% හා 96%ක් වශයෙනි.

ප්‍රශ්න අංක 4 - 8 අතුරෙන් ප්‍රශ්න දෙකක් තෝරා ගත යුතු ය. අපේක්ෂකයන්ගෙන් 78%ක පිරිසක් 8 ප්‍රශ්නය තෝරා ගෙන ඇති අතර 7 ප්‍රශ්නය තෝරා ගෙන ඇත්තේ 3%ක් පමණි.

### 1.3.5 II ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රශ්න සඳහා ලකුණු ලබා ගෙන ඇති ආකාරය





ප්‍රස්තාරය 5 (RD/16/02/AL පෝරමයෙන් ලබා ගත් තොරතුරු ඇසුරින් සකස් කරන ලදි.)

මෙම ප්‍රස්තාරයෙන් තොරතුරු ලබා ගන්නා ආකාරය පහත සඳහන් උදාහරණයෙන් පෙන්වා දී ඇත.

උදා: මෙහි පළමුවන ප්‍රශ්නය සඳහා වෙන් කර ඇති ලකුණු ප්‍රමාණය 20කි. එම ලකුණුවලින් 76% - 100% ප්‍රාන්තරයේ එනම් ලකුණු 16 - 20 තෙක් ලබා ගත් අපේක්ෂකයන්ගේ ප්‍රතිශතය 10%කි. එමෙන් ම වෙන් කර ඇති ලකුණු 0% - 25% ප්‍රාන්තරයේ, එනම් ලකුණු 00 - 05 තෙක් ලබා ගත් ප්‍රතිශතය 5%කි.

### 1.3.6 II ප්‍රශ්න පත්‍රය සඳහා සාධනය




ප්‍රස්තාරය 6 (RD/16/05/AL) පෝරමයෙන් ලබා ගත් තොරතුරු ඇසුරෙන් සකස් කරන ලදි.)


ඉහත ප්‍රස්තාරයෙන් තොරතුරු ලබා ගන්නා ආකාරය පහත සඳහන් උදාහරණයෙන් පෙන්වා දී ඇත.

උදා:- I කොටසෙහි 1.5 ප්‍රශ්නයෙහි පහසුතා දර්ශකය 98%කි. එනම් එහි පහසුතාව 98%කි. එයින් අදහස්වන්නේ අපේක්ෂකයන්ගෙන් 98%ක් එම ප්‍රශ්නයට නිවැරදි පිළිතුරු සපයා ඇති බව ය. අවම පහසුතාව 1.6 ප්‍රශ්නය සඳහා දක්වා ඇත. එහි පහසුතා දර්ශකය 0.16ක් වන අතර එයින් අදහස් වන්නේ අපේක්ෂයන්ගෙන් 16%ක පිරිසක් එම ප්‍රශ්නයට නිවැරදි පිළිතුර සපයා ඇති නමුත් 84%ක පිරිසක් නිවැරදි පිළිතුරු සැපයීමට අසමත් වී ඇති බවයි.

**අ.පො.ස. (උ.පෙළ) විභාගය - 2018**

**71 - සිංහල - II පත්‍රය**

**II කොටසේ ප්‍රශ්නවල පහසුතා දර්ශක**





ප්‍රස්තාරය **7** (I) (RD/16/05/AL) පෝරමයෙන් ලබා ගත් තොරතුරු ඇසුරින් සකස් කරන ලදි.)

II පත්‍රයෙහි 2 - 8 දක්වා ප්‍රශ්නවල පහසුතා දර්ශක දැක්වෙන ප්‍රස්තාර පිටු අංක 9, 10 හි දක්වා ඇත.

**අ.පො.ස. (උ.පෙළ) විභාගය - 2018**

**71 - සිංහල - II පත්‍රය**

**II කොටසේ ප්‍රශ්නවල පහසුතා දර්ශක**




ප්‍රස්තාරය **7 -** (II) (RD/16/05/AL) පෝරමයෙන් ලබා ගත් තොරතුරු ඇසුරින් සකස් කරන ලදි.)

පිටු අංක 9 හා 10 ප්‍රස්තාර ඇසුරින් තොරතුරු ලබා ගන්නා ආකාරය පහත සඳහන් උදාහරණයෙන් පෙන්වා දී ඇත.

උදා:- 2 ප්‍රශ්නයෙහි (iv) අනුකොටසෙහි 0.98ක වැඩිම පහසුතා දර්ශකය දක්වා ඇත. එයින් අදහස් වන්නේ අපේක්ෂකයන්ගෙන් 98%ක් එම ප්‍රශ්නයට සාර්ථක පිළිතුරු සපයා ඇති බව ය. එනම් එහි පහසුතාව 98%කි. 3 ප්‍රශ්නයේ (II) කොටස 0.01ක අඩු ම පහසුතා දර්ශකය දක්වා ඇත. එයින් අදහස් වන්නේ අපේක්ෂකයන්ගෙන් 1%ක ඉතා සුළු පිරිසක් පමණක් එම ප්‍රශ්නයට සාර්ථක ව පිළිතුරු සපයා ඇති බව ය. එනම් එහි පහසුතාව 1%කි.

# II කොටස

## 2. ප්‍රශ්න හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු

### 2.1 I ප්‍රශ්න පත්‍රය හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු

#### 2.1.1 I ප්‍රශ්න පත්‍රයේ ව්‍යුහය

- ⋆ කාලය පැය 03කි.
- ⋆ ප්‍රශ්න කියවා තෝරා ගැනීම සඳහා අමතර කියවීම් කාලය මිනිත්තු 10කි.
- ⋆ ප්‍රශ්න අටකින් සමන්විත වේ.
- ⋆ **පළමුවන** ප්‍රශ්නය ඇතුළු ව ප්‍රශ්න **පහකට** පිළිතුරු සැපයිය යුතු අතර පිළිතුරු සඳහා වර්තමාන ලේඛන ව්‍යවහාරය ම යොදා ගත යුතු වේ.
- ⋆ 1 ප්‍රශ්නය කොටස් **හයකින්** සමන්විත වේ. සියලු කොටස්වලට පිළිතුරු සැපයිය යුතු ය. අනෙක් ප්‍රශ්න **හත** අතුරෙන් අභිමත ප්‍රශ්න **හතරක්** තෝරා ගත යුතු වේ.
- ⋆ ප්‍රශ්න අංක 01 ලකුණු = 40
  ප්‍රශ්න අංක 2 - 8 තෙක් එක් ප්‍රශ්නයකට ලකුණු 15 බැගින්,
  ප්‍රශ්න 4 සඳහා (15 X 4) = 60
  1 පත්‍රය සඳහා මුළු ලකුණු (40 + 60) = 100

## 2.1.2 I පත්‍රය සඳහා අපේක්ෂිත පිළිතුරු

**01 ප්‍රශ්නය**

- පහත දැක්වෙන උද්ධෘත පාඨ කියවා, ඒ ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

**1.** (අ) සතරමහමුහුද පැන් විතරටත් බොහෝව' යනාදීන් අනමතග්ගපරියාය සූත්‍රය වදාරත් වදාරත් මුවාත් තබන යකඩෙක මලකඩ ඉගිලෙන්නා සේ ශෝකදුඃඛය තුනී විය. ශෝකදුඃඛය තුනී නියාව දැනලා බුදුහු පටාචාරාවන් බණවාලා 'හෙම්බා පටාචාරාවෙනි, දෙමව්පිය ආදීහු මිය පරලොව යන්නවුන්ට තුමූ ජීවත් ව හිඳත් පිහිට විය නොහෙති. නුවණැත්තවුන් විසින් ශීලවිශුද්ධිය කොටගෙන තමතමන්ට පිහිට වියයුතු ය'යි වදාරා විසිවන මග්ගවග කෙළවර ගාථා දෙකකින් බණ වදාළසේක. දේශනා කෙළවර පටාචාරාවෝ පොළොව පස් විතරටත් බොහෝ කෙලෙසුන් ගෙවා සෝවාන් වීමෙන් ආර්ය ජාතියෙහි පිහිටා ජාතීන් ශුද්ධ කළහ. සංසාර දෝෂය නිසා ඇති නුගුණත් හළහ. නටුවා වූ ලොව්සැපතට ලොවුතුරාසැපතුත් යම්තම් විතරක් ලත්හ.

(i) පටාචාරාවන්ගේ ශෝකදුඃඛය තුනී වූයේ කෙබඳු ආකාරයෙන් ද?

(ii) ශෝකදුඃඛය තුනී වූ පසු බුදුන් වහන්සේ පටාචාරාවට කුමක් වදාළ සේක් ද?

(iii) පටාචාරා තම ජාතිය ශුද්ධ කර ගත්තේ කෙසේ ද?

(iv) **නටුවා වූ** හා **ලොව්සැපත** යන වචනවල අර්ථ සපයන්න. (ලකුණු 04 යි.)

පිළිතුරු

(i) මුවහත් තබන්නා වූ යකඩයක මලකඩ ඉවත් වන්නා සේ / නැති වන්නා සේ

(ii) දෙමාපිය ආදි අය මිය පරලොව යන්නා වූ තැනැත්තන්ට තමා ජීවත් ව සිටිය දීත් පිහිට විය නොහැකි වෙති. නුවණැති අය ශීලය පිරිසිදු කරගෙන තමතමන්ට පිහිට සලසා ගත යුතු ය.

(iii) බොහෝ කෙලෙසුන් දුරු කොට සෝවාන් වීමෙන් ආර්ය ජාතියෙහි පිහිටා

නටුවා වූ - නෂ්ට වූ/ විනාශ වූ/ නැසුණා වූ/ නැසී ගිය/ නැසී ගියා වූ / නැති වූ

(iv) ලොවී සැපත - ලෞකික සම්පත්තිය / ලෝකයේ පවත්නා සැප සම්පත් / ලෝකයට අයත් සැප සම්පත් **(ලකුණු 04යි)**

(ආ) එකල්හි රජ කරන සොත්ථිසේන රජ්ජුරුවෝ තමන් හා එක් ව දුක් ගෙන ඇවිදි සම්බුලාවන්ට අග මෙහෙසුන් තනතුරු පමණක් දී සෙසු නිසි වෘත්තියක් නුදුන්නාහ. එකල්හි රජ්ජුරුවෝ බිසවුන් ඇති බවත් නො දැන සෙසු ස්ත්‍රීන් හා සමග සිත් අලවා කෙලිමින් සෙමින් අභිරමණය කොට ඇවිදිනාහ. සම්බුලාවෝ ද තමන් කෙරෙහි කිසි විචාරයක් නැති හෙයින් දවසින් දවස ලජ්ජාවෙන් හා සපත්නීරෝසයෙන් දුර්වල ව පඬුවන් සිරුරු ඇති ව ඉපිල හුණු නහර බහනින් වෙළඳන ලද ශරීරයක් ඇති ව වාසය කරන්නාහ. ශෝකයෙන් දුර්වල වූ ශරීර ඇති ඒ බිසව් එක් දවසෙක්හි රජ ගෙන් දත් අනුභව කරන්ට ආ මයිල් රජ්ජුරුවන් කරා ගොස් වැඳ එකත්පස් ව උන්නීය. එකල්හි තාපසයෝ ඉතා ම දුර්වල ව ශරීරයක් ඇති මිරිකුණා වූ චක්ෂුරාදී ඉඳුරන් ඇති බිසවුන් දැක, දුර්වල වූ කාරණා විචාරන්නා ව මෙසේ කියත්.

(i) සොත්ථිසේන රජ තමන් හා එක්ව දුක්ගෙන ඇවිදි සම්බුලාවන්ට කෘතගුණ දැක්වූයේ කෙසේ ද?

(ii) බිසව ශෝකයෙන් දුර්වල වූයේ ඇයි?

(iii) රජතුමා සෙසු ස්ත්‍රීන් සමග සිත් අලවා විසීම කතුවරයා ඉදිරිපත් කරන්නේ කෙබඳු ආකාරයෙන් ද?

(iv) **මයිල්** හා **ඉඳුරන්** යන වචනවල අර්ථ සපයන්න. (ලකුණු 04 යි.)

පිළිතුරු (i) සෙසු නිසි වෘත්තියක් නො දී අගබිසව් තනතුර පමණක් දී

(ii) තමන් කෙරෙහි නිසි විචාරයක් නොමැතිවීම නිසා දවසින් දවස ලැජ්ජාවෙන් හා සපත්නීරෝසයෙන් / සපත්නීරෝෂයෙන් දුර්වල ව

(iii) බිසවුන් ඇති බවක් වත් නොදැන වෙනත් කාන්තාවන් සමග සිතින් බැඳී ඔවුන් හා සිනා සෙමින්, අභිරමණය කෙරෙමින්

(iv) මයිල් - මාමා/ මාමණ්ඩි/මයිලණුවන්
ඉඳුරන් - ඉන්ද්‍රියයන් (ඇස, කන, නාසය, දිව, ශරීරය යන ඉන්ද්‍රියයන්)

**(එක් කොටසක් නිවැරදි නම් ලකුණු ½ක් දෙන්න)**

**(ලකුණු 04යි)**

(ඉ) මෙසේ ඒ සොරා ගම මුළුල්ලෙහි ඇවිද එක තැනෙකත් පිටිවහලක් නො ලැබ තෙරුන්වහන්සේගේ සමීපයට ම යෙමි යි සිතා විහාරයට ගොස් "ස්වාමීනි, ගැත්තවුට පිටිවහල් වුව මැනව, මේ පිට බැඳි මළ මිනිය උනා හැර මා සුවපත් කළ මැනවැ"යි කීය. තෙරුන්වහන්සේ ඔහු දැක කම්පා ව ළය පිරුණු ශෝක ඇති ව වහා හුනස්නෙන් නැඟී ඔහු සමීපයට එළඹ පිට බැඳි මළ මිනිය උනා ගෙන ගොස් දුර දමා ඔහු උණු පැනින් නහවා කුලාවෙන් තෙල් ගෙන සකල ශරීරය තෙල් ගල්වා මුගුරෙන් පහළ තැන් තවමින් උන් කල්හි ඕහට බැටදුන් උපාසකයා උදෑසන්හි ම සොරා කොයි ගියේ දෝ හොයි වීචාර වීචාරා සොයා ඇවිදුනේ විහාරයට ගොස් සොරා පිට තෙල් ගා තවමින් උන් තෙරුන්වහන්සේ දැක ඔබ හා සමග කථා කරන්නා වූ උපාසක තෙම,

(i) සොරා විහාරයට ම ගියේ ඇයි?
(ii) විහාරයට පැමිණි සොරා තෙරුන්වහන්සේට කුමක් පැවසූවේ ද?
(iii) විහාරයට ගිය උපාසකයාට දක්නට ලැබුණේ කුමක් ද?
(iv) **පිටිවහලක්** හා **උනා ගෙන** යන වචනවල අරුත් පහදන්න. (ලකුණු 04 යි.)

පිළිතුරු

(i) ගම හැම තැන ම/ ගම පුරා/ ගම මුළුල්ලෙහි ඇවිද පිටිවහලක්/උපකාරයක්/පිළිසරණක්/ පිහිටක් නො ලැබුණු නිසා
(ii) ස්වාමීනි, අසරණ වූ තැනැත්තාට පිටිවහල් වුව මැනවි. මේ පිට බැඳි මළමිනිය ඉවත් කර මා හට පිහිට වන්නැයි පැවසී ය.
(iii) තෙරුන්වහන්සේ සොරාගේ පිටෙහි තෙල් ගල්වා තවමින් සිටි අයුරු/ සොරාගේ පිටෙහි තෙල් ගා තවමින් තෙරුන්වහන්සේ සිටින ආකාරය
(iv) පිටිවහලක් - උපකාරයක්/ පිළිසරණක්/පිහිටක්/උදව්වක්
උනා ගෙන - ගලවා ගෙන/ලිහා ගෙන/ඉවත් කර ගෙන

**(එක් කොටසක් නිවැරදි නම් ලකුණු ½ක් දෙන්න)**

**(ලකුණු 04යි)**

(ඊ) නොසී කරන මිසදිටුවන් බස් අබඳ
නි සී නැණැති සිරි පැරකුම් රජුට නඳ
ර සී ගැඹුරු තෙපලෙන් සැක සිත පසිඳ
දෙ සී සුවාසූ දහසක් දහම් කඳ

එ හිමි කෙලෙස් ගිරි මුදුනින් වැහෙන සොඳ
දහම් අහස් ගඟ දුල දිය දහර වැද
නොමඳ සතොස් අම ඔදසින් පිරි නිබඳ
බැබැළි වෙසෙස් නරනිඳු සඳ කිරි මුහුද

(i) පැරකුම් රජතුමාට නිසී නැණ ඇතැයි කවියා පවසන්නේ කුමක් නිසා ද?
(ii) නරනිඳු සඳ කිරි මුහුද වෙසෙසින් බැබළුණේ ඇයි?
(iii) 'දහම් අහස් ගඟ' යන්නෙහි කාව්‍යාලංකාරය නම් කරන්න.
(iv) **සුවාසූ දහසක් දහම් කඳ** යන්නෙහි අර්ථය පහදා දෙන්න. (ලකුණු 04 යි.)

පිළිතුරු(i) මිථ්‍යාදෘෂ්ටිකයන්ගේ අසම්බන්ධ වචන සිහි නොකරන නිසා
(ii) ඒ ස්වාමීන් වහන්සේ නමැති කෙලෙස පර්වත මුදුනෙන් වැහෙන මනා වූ ධර්මය නමැති ආකාශ ගංගාවේ බබළන දිය දහර වැදීමෙන්
(iii) රූපකාලංකාරය
(iv) අසූහාර දහසක් ධර්මස්කන්ධය/අසූහතර දහසක් ධර්මස්කන්ධය

★ ඡේදයේ ඇතුළත් වචන වෙනුවට ව්‍යවහාරයේ පවතින සමීපාර්ථවත් වෙනත් වචන ලියා ඇත්නම් ලකුණු ප්‍රදානය කරන්න. **(ලකුණු 04යි)**

(උ) පහත සඳහන් උද්ධෘත අතුරෙන් **හතරක** අවස්ථා සම්බන්ධය දක්වන්න.

(i) "සෙසු වුවමනා දවස් නැති හෙයින් අදම වුවමනා ද?"

(ii) "ස්වප්නයෙන් දැකීම් වශයෙන් මහත් දොළක් උපන්නේ ය."

(iii) "ඒ ගමන තොප දක්නා පිණිස එන ගමනකැයි සිතමි."

(iv) "අපේ ගෙවල් ඔක්කොම පිළිස්සුණා යුද්දෙදී"

(v) "රජතුමනි කලබල වෙන්ඩ එපා"

(vi) "ගුණවතී .... ලොකු පුතා ද කෙඳිරි ගෑවේ?" (ලකුණු 08 යි.)

**පිළිතුරු**

(i) සද්ධර්ම රත්නාවලියේ මච්ඡරිය කෝසිය සිටුවරයාගේ කථා වස්තුවෙන් උපුටා ගත් පාඨයකි. කබලුපූවක් කනු කැමැති ව එහෙත් වස්තුව වියදම් වෙති' යි සිතා කිසිවකුට එය නො කියා සිටුවරයා ඇඳෙහි වැතිර සිටි අවස්ථාවේ දී සිටුදේවිය ඇසූ ප්‍රශ්නයකට සිටුවරයා විසින් (සිටුදේවියට) ප්‍රකාශ කරන ලදි.

(ii) ජාතක කථා පොතෙහි අනතර්ගත ඡද්දන්ත ජාතකයෙන් උපුටා ගත් පාඨයකි. චුල්ලසුභද්‍රා ව්‍යාජ ලෙස රෝගී ව ඇඳෙහි වැතිර සිටි අවස්ථාවේ දී බරණැස් රජු විසින් ඒ පිළිබඳ විමසූ විට චුල්ලසුභද්‍රා විසින් රජුට ප්‍රකාශ කරන ලදි .

(iii) සද්ධර්මාලංකාරයෙහි සාලිරාජ කථා වස්තුවෙන් උපුටා ගත් පාඨයකි. අශෝකමාලා දේවිය පිළිබඳ බමුණන්ගෙන් තොරතුරු අසා දැන ගත් දුටුගැමුණු රජ අශෝකමාලා දැකීමට එන බව සාලිරාජ කුමරුට දන්වා යැවූ අවස්ථාවේ කුමරා විසින් අශෝකමාලා දේවියට ප්‍රකාශ කරන ලදි.

(iv) මළගිය ඇත්තෝ නවකතාවෙන් උපුටා ගත් පාඨයකි. දෙවෙන්දොරා සං කියෝතෝවට යාමට පෙර යොත්සුයාහි මොමොකෝගේ නිවසට යන අතරමග දී යුද්ධයට පෙර තමන් මෙහි විසූ බව නොරිකෝ පැවසූ විට "මෙහෙන් ගියේ ඇයි ද"යි දෙවෙන්දොරා සං ඇසූ අවස්ථාවේ දී නොරිකෝ සං විසින් ඔහුට ප්‍රකාශ කරන ලද්දකි.

(v) රත්නාවලී නාට්‍යයෙන් උපුටා ගත් පාඨයකි. අන්තඃපුරය ගිනි ගනිමින් තිබූ අවස්ථාවේ දී එහි දම්වැලෙන් බැඳ දමා සිටි සාගරිකා බේරා ගන්නා ලෙස වාසවදත්තා බිසව උදයන රජතුමාගෙන් ඉල්ලා සිටි විට රජු ගින්න වෙත යාමට සූදානම් වූ අවස්ථාවේ දී විදූෂක (වසන්තක) විසින් රජුට ප්‍රකාශ කරන ලදි.

(vi) ඒ. වී. සුරවීර මහතාගේ "තමන්ගේ දරුවෝ" කෙටිකතාවේ ගුණවතී කන්කැක්කුම සෑදී කෙඳිරිගානු ඇසී, ඒ හඬ තම පුතුගේ ය'යි සිතු ලොකුහාමිනේ විසින් ගුණවතීට ප්‍රකාශ කරන ලදි.

**(ලකුණු 08යි)**

(ඌ) පහත දැක්වෙන කවිපෙළ පිළිබඳ රසාස්වාදයක් කරන්න.

පරපුරක කළු දුඹුල් කඩා පිරිසුදු කරන
සෙවෙල කෑ උළු පිහිලි සෝද සෝදා හරින
අලුත් වැස්සක අසිරි පතා සිටියෙන් නිතින
මෙන්න දැන් දොරකඩට ඇවිත් නිල් දිය ඉසින

ඇදුරු වුණු දොර ජනෙල මානයේ උණුසුමින
සුව සිහිල නිදහසේ උරා බී සැප විඳින
ලෝකයේ පුස්ඹ පිරී තිරෙන ලෙස විවර වුණ
වලව්වට සිවු දිගින් සුළං රැලි විත් නටන

අලුත් වැස්සෙන් පෙඟුණු පින්තූරයෙන් එබෙන
රත් යවට සේ දැවෙන තාත්තාගෙ නෙත් වලින
දීප්තිය නිවී සේදී දුකට කඳුළු එන
රාමුවෙන් බිඳෙන් බිඳ පතිත වී ලිහී යන

ඇතුළු ගැබ නොදුටු අනුමුලු සොයා හඹායන
අලුත් වැහි හැළි වළං උතුරුවා ඇද වැටෙන
මහා පෙට්ටගම 'හායි' ගා මහලු කට අරින
අවලංගු ඔප්පුවල අකුරු බොඳ වී මැකෙන

බමුණු මහසල් කුලයෙ රස්නයෙන් ඉරී තැළුණු
මාන්දම් බිත්ති බඩ නෙරා කොරපොතු ඉහෙන
ලොවට දුන් ගිනි ම යළි ගෙබිම ගිනියම් කරන
අලුත් වැස්සෙන් එගිනි නිවී නිවී සංසිඳෙන

එදා දස දිගින් වැඩී සුළඟට ද වැසු දොරින
ඇතුළු වෙයි ගැමි දනන්ගේ වේදනා මුහුණ
වලව්වේ වියගසින් මිදී රිසි සේ හාන
ගොවි පුතුන් මඩ නාන්නට මටත් අත වනන (ලකුණු 16 යි.)

පිළිතුරු

වැඩවසම් සමාජයේ ඇතැම් ලක්ෂණ බිඳවැටීම හා නව සංස්කෘතියක පිබිදීම මෙම පද්‍ය නිර්මාණයට වස්තු විෂය වී තිබේ. වලව්වට පැමිණි වැස්සක් මුල්කොට ගනිමින් සංක්‍රාන්තිමය අවස්ථාවකට ප්‍රවේශය ලබා ගන්නා කවියා, සමස්ත කාව්‍ය නිර්මාණයෙන් ම නිරූපණය කරන්නේ පහළ ගැමි සමාජ ස්තරය පීඩනයට ලක් කළ ගතානුගතික වැඩවසම් සමාජ ක්‍රමය පරිහානියට පත්වන ආකාරය යි.

වලව්වේ ප්‍රභුවරුන්ගේ දුෂ්ටත්වයෙන් හා බලකාමීත්වයෙන් පරිපීඩිත වූ ජනයා ලබන ආධ්‍යාත්මික වූත්, භෞතික වූත් නිදහස අලුත් වැස්සෙන් සංකේතවත් කෙරෙන අතර එය කාලාන්තරයක් තිස්සේ සමාජය ප්‍රාර්ථනා කළ දෙයක් බව ද කියැවේ. මෙහි විශේෂත්වය වන්නේ පැරණි ප්‍රභු සමාජයේ තරුණ පරම්පරාව නියෝජනය කරන කථකයා ද මෙම පරිවර්තනය හමුවේ උද්දාමයට පත් ව සිටීම යි.

"මෙන්න දැන් දොරකඩට ඇවිත් නිල් දිය ඉසින"

යන්නෙන් ධ්වනිත වන්නේ ඔහු තුළ ඇති වන ප්‍රහර්ෂය යි.

අද්දැකීම ප්‍රතිනිර්මාණය කිරීම සඳහා කවියා සංකේතාර්ථ, රූපකාර්ථ හා ධ්වනිතාර්ථ මුසු වූ සංක්ෂිප්ත භාෂාවක් යොදා ගනියි.

නිදෑ:

''පරපුරක කළු දුඹුල් කඩා පිරිසිදු කරන
සෙවෙල කෑ උළු පිහිලි සෝද සෝදා හරින''

'' දැදුරු වුණු දොර ජනෙල මානයේ උණුසුමින
සුව සිහිල නිදහසේ උරා බී සැප විඳින ''

''රත් යවට සේ දැවෙන තාත්තගෙ නෙත් වලින''

''මාන්දම් බිත්ති බඩ නෙරා කොරපොතු ඉහෙන''

''මහා පෙට්ටගම 'හායි' ගා මහලු කට අරින
අවලංගු ඔප්පුවල අකුරු බොඳ වී මැකෙන''


''වලවුවේ වියගසින් මිදී රිසි සේ හාන
ගොවි පුතුන් මඩ නාන්නට මටත් අත වනන''

අද්දැකීමට උචිත උපමාරූපක භාවිතය මගින් වාක් චිත්‍ර මැවීමට සමත් වන කවියා, නිදහසේ ප්‍රමෝදය සමස්ත කාව්‍යය පුරා විහිදුවා ලයි. එමගින් ගතානුගතිකත්වය ප්‍රතික්ෂේප කරන ප්‍රගතිශීලී ජීවන දෘෂ්ටියක් සහෘදයා වෙත ආරෝපණය කෙරෙයි.

ඉහත කරුණු ඇසුරු කර ගනිමින් රසාස්වාදය ලිවීම අපේක්ෂා කෙරේ.

**(ලකුණු 16යි)**


**2:1:3:1 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :**





මෙය අනිවාර්ය ප්‍රශ්නයක් වන අතර ඒ සඳහා පිළිතුරු සපයා ඇති අපේක්ෂකයන්ගේ ප්‍රතිශතය 98%කි. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 40ක් හිමි වේ.

ඉන් ලකුණු 00 - 10 ප්‍රාන්තරයේ 9%ක් ද
ලකුණු 11 - 20 ප්‍රාන්තරයේ 34%ක් ද
ලකුණු 21 - 30 ප්‍රාන්තරයේ 47%ක් ද
ලකුණු 31 - 40 ප්‍රාන්තරයේ 10%ක් ද

ලෙස ලකුණු ලබා ගෙන ඇත. මෙම ප්‍රශ්නයට ලකුණු 30ට වඩා ලබා ගත් අපේක්ෂකයන් 10%ක් වන අතර 43%ක් ලබා ගෙන ඇත්තේ ලකුණු 21ට අඩුවෙනි.




★ මෙම පත්‍රයේ පළමු වන ප්‍රශ්නය කොටස් හයකින් සමන්විත වේ.අනුකොටස් 23ක් ඇති අතර පහසුතාව 70%ට වඩා වැඩි අනුකොටස් 6ක් ද පහසුතාව 40% - 65% අතර අනුකොටස් 7ක් ද ඇත. පහසුතාව 40%ට පහළ අගයක් ගන්නා අනුකොටස් සංඛ්‍යාව 10කි. ඉන් පහසුතාව 10%ට අඩු අනුකොටස් 2කි.( මේ යටතේ අර්ථාවබෝධය සඳහා අ, ආ, ඉ, ඊ යන කොටස් හතර ද අවස්ථා සම්බන්ධය සඳහා (උ) කොටස ද, රසාස්වාදය සඳහා (ඌ) කොටස ද වෙන් කෙරේ)



## පිළිතුරු පිළිබඳ නිරීක්ෂණ (අවබෝධය)

අර්ථාවබෝධය සඳහා ඇති අ, ආ, ඉ, ඊ යන කොටස් හතරෙහි සැම කොටසක් ම අනුකොටස් හතරකින් යුක්ත වේ. ඒවා තෝරා ගෙන ඇත්තේ නිර්දිෂ්ට පැරණි සාහිත්‍ය ග්‍රන්ථවලිනි. මෙම ප්‍රශ්න ආශ්‍රිත ව අපේක්ෂකයන්ගේ ඉහළ සාධන මට්ටමක් ප්‍රදර්ශනය වනුයේ ඡේදය ඇසුරෙන් ඍජුව ම පිළිතුර ලබා ගත හැකි ප්‍රශ්නවලට පිළිතුරු ලිවීමේ දී ය. ඡේදයේ සංකීර්ණ වාක්‍ය පිළිබඳ ව අවබෝධයෙන් යුතු ව පිළිතුරු ලිවිය යුතු අවස්ථාවල දී හා දුරවබෝධ පදවලට අරුත් සැපයීමේ දී අපේක්ෂකයන්ගේ සාධන මට්ටම පහත වැටී තිබේ.

අපේක්ෂකයන් එක් එක් කොටස්වලට පිළිතුරු ලබා දී ඇති ආකාරය විමසා බැලීමේ දී (ඉ) කොටසේ සියලු අනුකොටස් සඳහා 74%ට වැඩි පහසුතාව ලබා ඇති බව දක්නට ලැබේ. එහෙත් (ආ) සහ (ඊ) අනුකොටස්වලට දක්වා ඇත්තේ අඩු සාධන මට්ටමකි. විශේෂයෙන් ම (ඊ) කොටසේ (i), (ii) අනුකොටස් සඳහා ලබාගෙන ඇත්තේ 10%කට වඩා අඩු පහසුතාවකි. දුරවබෝධ පද යෙදී තිබීමත්, ඇතැම් පිළිතුරු ඍජු ලෙස ලබා ගත නොහැකි වීමත් එයට හේතු වී ඇත.

## නිගමන හා යෝජනා

නිර්දිෂ්ට ජාතක කතා ප්‍රමාණාත්මක ව වැඩි වීමත්, ඒවායේ දීර්ඝ වර්ණනා හෝ අර්ථාවබෝධයට පහසු නොවන යෙදුම් සුලබ වීමත් නිසා ජාතක කථා පරිශීලනයට අපේක්ෂකයන් වැඩි වශයෙන් යොමු නොවීම (අ) සහ (ඉ) කොටස්වලට වඩා (ආ) කොටස අඩු සාධන මට්ටමක් පෙන්නුම් කිරීමට හේතුව ලෙස නිගමනය කළ හැකි ය. එසේ ම ගිරා සන්දේශයේ සම්භාව්‍ය කාව්‍යමය යෙදුම් පිළිබඳ අපේක්ෂකයාගේ දුරවබෝධය (ඊ) කොටසේ සාධන මට්ටම අවම වීමට බලපා ඇති බව නිගමනය කළ හැකි ය. මේ අනුව නිර්දිෂ්ට සම්භාව්‍ය ගද්‍ය පද්‍ය කෘති මැනවින් කියවා අර්ථ අවබෝධ කර ගැනීම කෙරෙහි අපේක්ෂකයන්ගේ පරිචය මීට වඩා ඉහළ මට්ටමක පැවතිය යුතු අතර, අර්ථ අවබෝධ කර ගැනීම සඳහා අවශ්‍ය මාර්ගෝපදේශකත්වය ලබා දීමට ගුරුභවතුන් ද වඩාත් යොමු විය යුතු ය. නිර්දිෂ්ට පැරණි කථා වස්තු උගන්වා අවසන්වන විට විචාර ප්‍රශ්න සාකච්ඡා කිරීමට අමතර ව ඒ ඒ කථාවස්තුවෙන් තෝරා ගත් ඡේද යටතේ ප්‍රශ්න ඉදිරිපත් කර සිසුන්ට පිළිතුරු සැපයීමට අවස්ථාව ලබා දීම වැදගත් ය. සන්දේශ කාව්‍යයේ වර්ණනා අවසානයේ ද මෙම ක්‍රියාකාරකම සිදු කළ හැකි ය. එහි දී මෙවැනි ප්‍රශ්නවලට සාර්ථක ලෙස පිළිතුරු දීමේ හුරුවක් අපේක්ෂකයන්ට ලැබේ. අපේක්ෂකයන් තුළ තර්කණ හා විශ්ලේෂණාත්මක හැකියාව ඇති කිරීම සඳහා අභ්‍යාස කරවීම මගින් ඔවුන්ගේ සාධන මට්ටම් ඉහළ නැංවීමට කටයුතු කළ හැකි ය.

එසේ ම මෙම ගද්‍ය පද්‍ය පාඨ ඇසුරෙන් පිළිතුරු ලිවීමේ දී යොදා ගත යුත්තේ වර්තමාන ලේඛන ව්‍යවහාරය වන බවත්, සම්මත ව්‍යාකරණ රීතිවලට අනුකූල ව එම පිළිතුරු ඉදිරිපත් කළ යුතු බවත්, අපේක්ෂකයන් අවබෝධ කර ගැනීම අවශ්‍ය වේ.

## පිළිතුරු පිළිබඳ නිරීක්ෂණ (අවස්ථා සම්බන්ධය)

(උ) කොටස යටතේ ඇති පාඨවල අවස්ථා සම්බන්ධය දැක්වීමේ දී උපරිමය 39%ක් ද අවමය 12%ක් ද වශයෙන් පහසුතාව ප්‍රදර්ශනය වී ඇත.

මෙහි (i), (ii), (iii) අනුකොටස් පැරණි සාහිත්‍යයෙන් ද, (iv), (v), (vi) අනුකොටස් නූතන සාහිත්‍යයෙන් ද උපුටා ගෙන ඇත. සමස්තයක් ලෙස මෙම කොටස් තුන සඳහා සාධන මට්ටම පවතිනුයේ 30%ට අඩුවෙන් බව පෙනී යයි. නූතන සාහිත්‍යය යටතේ නවකතාවක් ද නාට්‍යයක් ද කෙටිකතා 12ක් ද පද්‍ය නිර්මාණ 23ක් ද නිර්දේශ වී තිබේ. මේවායින් උපුටා ගත් උද්ධෘතවලට පිළිතුරු ලිවීමේ දී අපේක්ෂකයන් ඉහළ සාධන මට්ටමක් පෙන්නුම් කර නැත. (v) කොටස සකස් වී ඇත්තේ නිර්දිෂ්ට රත්නාවලී නාට්‍යය ඇසුරිනි. මෙම කොටසට පහසුතා මට්ටම ප්‍රදර්ශනය වී ඇත්තේ 12%ක් ලෙසිනි. මෙය රත්නාවලී නාට්‍යය ඇසුරින් උපුටා ගත්තක් ලෙස හඳුනා ගත්ත ද නිශ්චිත අවස්ථාව දැක්වීමට අපේක්ෂකයන් අපොහොසත් වීම මෙම තත්ත්වය ඇති වීමට හේතුව ලෙස දැක්විය හැකි ය.

**නිගමන හා යෝජනා**

අවස්ථා සම්බන්ධයට පිළිතුරු ලිවීමේ දී අපේක්ෂකයන්ගේ වැඩි අවධානය දිනා ගෙන ඇත්තේ සද්ධර්ම රත්නාවලිය, සද්ධර්මාලංකාරය හා ජාතක කතා ය. එහෙත් නූතන සාහිත්‍ය කෘති ද නිරන්තරයෙන් පරිශීලනය කිරීමත්, ඒවායේ අවස්ථා සම්බන්ධය හඳුනා ගැනීම හා මතකයේ රඳවා ගැනීමත් අවශ්‍ය වේ.

එසේ මතක තබා ගන්නා අවස්ථා, සිද්ධි ඇසුරෙන් ප්‍රශ්නයට අදාළ කරුණු නිශ්චිත ව ඉදිරිපත් කිරීමත් වැදගත් වේ. එනම් කවුරුන් විසින්, කා හට, කුමක් අරබයා, කෙබඳු අවස්ථාවක ඉදිරිපත් කළේ ද යන්න නිශ්චිත ව, පැහැදිලි ව, නිරවුල් ලේඛන ශෛලියකින් ඉදිරිපත් කළ යුතු ය. නිර්දිෂ්ට පැරණි කථා වස්තු උගන්වා අවසන්වන විට විචාර ප්‍රශ්න සාකච්ඡා කිරීමට අමතරව ඒ ඒ කථාවස්තුවෙන් තොරා ගත් ඡේද යටතේ ප්‍රශ්න ඉදිරිපත් කර සිසුන්ට පිළිතුරු සැපයීමට අවස්ථාව ලබා දීම වැදගත් ය. සන්දේශ කාව්‍යයේ වර්ණනා අවසානයේ ද මෙම ක්‍රියාකාරකම සිදු කළ හැකි ය. එහි දී මෙවැනි ප්‍රශ්නවලට සාර්ථක ලෙස පිළිතුරු දීමේ හුරුවක් අපේක්ෂකයන්ට ලැබේ.

*** අපේක්ෂකයන්ගේ සාධන මට්ටම් අවබෝධ කර ගැනීම සඳහා ඇමුණුම 1 සහ 2 බලන්න. (පිටු අංක 77-78)**

**පිළිතුරු පිළිබඳ නිරීක්ෂණ (රසාස්වාදය)**

(ඇ) කොටස යටතේ රසාස්වාදය සඳහා 56%ක පහසුතාව පෙන්වා ඇත. එය මධ්‍යස්ථ අගයක් ලෙස සැලකිය හැකි ය. කවි පන්තියේ වස්තු විෂය නිසි ලෙස හඳුනා ගනිමින් පද්‍ය රසාස්වාදයේ මූලධර්ම පිළිබඳ අවබෝධයෙන් යුක්ත ව රසාස්වාදයට අපේක්ෂකයන් වැඩි නැඹුරුවක් දක්වා නැත. එසේ ම පද්‍ය නිර්මාණයේ ව්‍යංග්‍යාර්ථ මෙන් ම සංකේත භාවිතය ඇතුළු විවිධ කාව්‍යෝපක්‍රම භාවිත කර ඇති ආකාරය පිළිබඳව ද අපේක්ෂකයන් එතරම් සැලකිලිමත් වී නැත. රසස්වාදයේ දී බොහෝ අපේක්ෂකයන් කවිපෙළ ආරම්භයේ සිට අවසානය තෙක් විස්තර කිරීමට පෙලඹී ඇත. එය අසාර්ථක ව්‍යායාමයකි. මෙහි දී කළ යුතුව තිබුණේ ආකෘතිය හා අන්තර්ගතය කෙරෙහි අපේක්ෂකයාගේ අවධානය යොමු කිරීමත්, එහි දී රසෝද්භාවනය සඳහා නිර්දිෂ්ට කවි පෙළ කෙතරම් යෝග්‍ය වී තිබුණේ ද යන්නත් සලකා බැලීම ය. එම අඩුපාඩුව නිසා අපේක්ෂකයන්ගේ සාධන මට්ටම ඉහළ අගයක් පෙන්වා නැත.

**නිගමන හා යෝජනා**

පද්‍ය රසාස්වාදයේ දී එහි මූලධර්ම පිළිබඳ ව අපේක්ෂකයා ප්‍රමාණවත් අවබෝධයක් ලබා ගැනීම වැදගත් වනවා සේ ම තම අවබෝධය ප්‍රායෝගික ව භාවිත කිරීමේ හුරුවක් ලබා ගැනීම ද අත්‍යවශ්‍ය වේ. බහුතරයක් අපේක්ෂකයන් කවිවල අර්ථ පමණක් ලියා දැක්වීමේ දුබලතාවෙන් මිදිය හැකි වන්නේ මූලධර්ම භාවිතයට ගැනීම ප්‍රගුණ කළ විට ය. ගුරු සිසු දෙපක්ෂයේ අවධානය මේ සඳහා යොමු වීම අවශ්‍ය ය.

***අපේක්ෂකයන්ගේ සාධන මට්ටම් අවබෝධ කර ගැනීම සඳහා ඇමුණුම 3 සහ 4 බලන්න. (පිටු අංක 79-82)**

## 02 ප්‍රශ්නය

**2.** කථා රසය උද්දීපනය කිරීමෙහි ලා **සද්ධර්ම රත්නාවලී** කතුවරයා උපමා භාවිත කොට ඇති ආකාරය නියමිත කථා වස්තු ඇසුරෙන් පැහැදිලි කරන්න.

**නැතහොත්**

"අතීත හා වර්තමාන කථා ඇතුළත් හේතු-ඵලවාදී කථා සම්ප්‍රදාය ජාතක කථාවලට අගනා සන්දර්භයක් ගෙන දෙයි." නියමිත කථා වස්තු ඇසුරෙන් පිරික්සන්න. (ලකුණු 15 යි.)

සද්ධර්ම රත්නාවලියේ නියමිත කථා වස්තු ඇසුරෙන් කථා රසය උද්දීපනය කිරීම සඳහා කතුවරයා උපමා යොදා ගත් ආකාරය පැහැදිලි කිරීම පිළිතුරෙන් අපේක්ෂා කෙරේ.
මෙහි දී අවස්ථා, චරිත, පරිසරය හා චෛතසික ස්වභාවය නිරූපණය සඳහා උපමා යොදා ගත් ආකාරය පිළිතුරෙන් පෙන්වා දී තිබිය යුතු යි. ඒ සඳහා යොදා ගත හැකි නිදසුන් කිහිපයක් පහත දැක්වේ,

- සිටු දියණියන් සිටු මැඳුරෙන් පලා යාමට සැරසෙන අවස්ථාව මෙන් ම එම චරිතයේ ඇති වංචනික සහ දැඩි ස්වරූපය ද අනාවරණය කෙරෙන ආකාරයේ උපමා මාලාවක් යෙදීම.

  "සිටු දුවණියෝ ද දෙවන දවස් කිලුටු අඳහස් සේ ම කිලුටු කඩරෙද්දක් කොයින් දෝ සොයා හැඳගෙන මිඩියන්ගේ ලෙසට ලිහිල් කොට හිසකේ බැඳගෙන රැ දෙවරු වී පැහැරියා සේ ඇඟ මුළුල්ලෙහි ධූලි ගාගෙන කළයක් හැරගෙන පැනට යන කෙල්ලක මෙන්...."

- සිටු දියණියන් දෙමාපියන්ගේ නිවසට යන අතරමග අනපේක්ෂිත ලෙස දෙවන දරුවා ලැබීමට ආසන්න වන අවස්ථාව පරිසර සිද්ධීන් හා සම්බන්ධ කරමින් ඇයගේ කායික මානසික වේදනාවන්හි තීව්‍රතාව ශ්‍රාවකයාට කරුණ රසයෙන් යුක්ත ව විඳ ගත හැකි ආකාරයේ උපමා යොදා ගැනීම.

  " ඒ වේලාවට ම පිට පිට හෙළා විදුලිය ගසන්නා සේ විළිත් පහරනට වන, ආස ගුගුරන්නා සේ හඬ ගසන්නටත් වන. වස්නා වැසි බෝවා සේ ම ප්‍රසවදුකුත් බෝ විය."

- මච්ඡරිය කෝසිය සිටාණන්ගේ මසුරුකම පැහැදිලි කිරීමේ දී එය ප්‍රබල ලෙස ශ්‍රාවකයාහට දැනවීම සඳහා උපහාස රසයෙන් අනූන උපමා යෙදීම.

  " තණ අග ගලා තෙල් බින්දුවක් විතරක් අනුන්ට දීලත් නම් සිතට දුක් බලවත් හෙයිනුත්, නොලබන දුක්පතුන් සේ ම... අනුන්ට දී නොලන හෙයිනුත් තමන් ප්‍රයෝජන නොවිඳිනා හෙයිනුත් උන් ලද සම්පත නම් රකුස්සන් තමන් නොබොන හෙයිනුත් අනුන් බිය නොදෙන හෙයිනුත් රකුසු රකවල තුබූ විලක් වැන්න."

- මච්ඡරිය කෝසිය කථාවේ මුගලන් තෙරුන් කවුළුදොර කෙරේ වැඩ හිඳිනා අවස්ථාවේ ශ්‍රවකයාගේ කුතුහලය තීව්‍ර වන ආකාරයට තෙරුන් වහන්සේගේ ප්‍රාතිහාර්ය පෑම හා සිටාණන් තුළ ඇති වන කැලඹීම උචිත උපමා මගින් නිරූපණය කිරීම.

  " සියලු මාලිගාව දුම්ගෙයක් සේ විය, සිටාණන්ගේ ඇසට දුම් වැදලා කබලු මඳ හෙයින් හඬන්නා සේ...."

- සිටාණන් තුළ ඇතිවන ආශාව ඇඹේණියන් හට පැවසීමට ඇති මැළිකම කෙතෙක් දැයි පැහැදිලි කිරීමට උචිත උපමා යෙදීම.

  " රළු දෙයක් සපා දූක සේ ගලන පරිද්දෙන් ",

  " කෙසිව්දට මහත් දෙයක් කෙසිව්දකින් අදනා කලක් පරිද්දෙන් "

  මීට අමතර ව පිළිතුර සඳහා උචිත වෙනත් නිදසුන් ද දැක්විය හැකි ය.

නැතහොත්

නියමිත ජාතක කථා ඇසුරු කර ගනිමින් හේතුඵලවාදී කතා සම්ප්‍රදාය ඒවාට ඇතුළත් වන ආකාරය විස්තර කිරීම මෙන් ම එ මගින් අගනා කථා සන්දර්භයක් ඇති වන ආකාරය පිළිතුරෙන් පැහැදිලි විය යුතු ය.

ජාතක කථාවල වර්තමාන, අතීත, ගාථා, වෙය්‍යාකරණ, සමෝධාන යනුවෙන් අංග කිහිපයකි. අතීත කථාවේ ඵලය වර්තමාන කථාව වේ. එය පැහැදිලි කෙරෙන්නේ ගාථාවෙනි. සමෝධානය මගින් අතීත වර්තමාන කථාවල සම්බන්ධය ඇති කෙරේ. හොඳ දේ නිසා යහපත් ප්‍රතිඵල ද නොහොඳ දේ නිසා අයහපත් ප්‍රතිඵල ද ලැබෙන ආකාරය මෙම කථා මගින් පෙන්වා දේ.

උදා:

- ඡද්දන්ත ජාතකය

  වර්තමාන කථාවේ දී බුදුන් වහන්සේගේ අලංකෘත ආත්මභාවය දකින මෙහෙණියන්ට ජාතිස්මරණ ඥානය පහළ වෙයි. ඉහත ආත්මයක දී මෙම උත්තමයාට කළ සැහැසිකම් මතක් වේ. එනිසා ඇය හඬා වැටීම හේතු කොට ගෙන බුදුන් වහන්සේ විසින් අතීත කථාව දේශනා කෙරේ. එම කථාව තුළ ද සිදුවීම් විකාශනය හේතුඵල සම්බන්ධතාවෙන් යුක්ත ව ශ්‍රාවක පාඨක විශ්වසනීයත්වය දිනා ගන්නා ආකාරයට සිදු වී තිබේ.

- ගණ්ඩතින්දු ජාතකය

  බුදුන් වහන්සේ කොසොල් රජුට කරන අවවාදයක් ලෙසින් ගණ්ඩතින්දු ජාතකය ඉදිරිපත් කර තිබේ. රජදරුවන් සියලු සත්ත්වයන් කෙරෙහි සර්ව සාධාරණ විය යුතු ආකාරය පැහැදිලි කිරීමට යොදා ගන්නා අතීත කථාවෙහි පඤ්චාල රජු රාජ්‍ය විචාරීමෙහි ප්‍රමාද ව කටයුතු කිරීම නිසා රාජ්‍යත්වයෙන් පිරිහෙන ආකාරයත්, ඔහු පිළිබඳ ව ජනතාවගේ අප්‍රසාදයත් ඉදිරිපත් කෙරෙන්නේ හේතුඵලවාදී කථා වින්‍යාසයක් සහිත ව ය.


- සම්බුලා ජාතකය

  මල්ලිකා දේවියගේ පතිවත රැකීමේ සද්ගුණය පැහැදිලි කිරීමට අතීත කථාව දේශනා කෙරෙන අතර, එ මගින් ද පැහැදිලි කෙරෙනුයේ පුද්ගලයකුගේ චරිත ස්වභාවය කර්මානුරූපී ව භවයෙන් භවයට ගමන් කරන ආකාරය යි. මෙහි වර්තමාන කථාවේ මල්ලිකා දේවිය අතීත කථාවේ සම්බුලා දේවිය යි. හේතුඵල සම්බන්ධයට අනුකූල ව අතීත කථාවේ ද චරිත, අවස්ථා, සිද්ධි නිරූපණය කෙරේ.

- දේවධර්ම ජාතකය

  බහු භාණ්ඩික භික්ෂුව සසුනෙහි පිරිහෙන්ට ඉඩ නො දී අල්පේච්ඡ හා සන්තුෂ්ට භාවයෙහි ද, වීර්යය වැඩීමෙහි ද අනුහස් ප්‍රකාශ කරනු පිණිස පෙර ආත්මභාවයක එම භික්ෂුව දිය රකුසකු සේ ඉපිද දොළොස් වසරක් පුරා ලජ්ජා, භය දෙක සොයමින් කටයුතු කළ ආකාරය බුදුන් වහන්සේ දේශනා කරන්නේ හේතුඵල සම්බන්ධතාව අනාවරණය වන පරිදි ය.


**2 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :**





මෙම ප්‍රශ්නය තෝරා ගෙන ඇති අපේක්ෂකයන්ගේ ප්‍රතිශතය 89%කි. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 15ක් හිමි වේ.

ඉන් ලකුණු 00- 03 ප්‍රාන්තරයේ 7%ක් ද
ලකුණු 04 - 07 ප්‍රාන්තරයේ 16%ක් ද
ලකුණු 08 - 11 ප්‍රාන්තරයේ 44%ක් ද
ලකුණු 12 - 15 ප්‍රාන්තරයේ 33%ක් ද

ලෙස ලකුණු ලබා ගෙන ඇත. මෙම ප්‍රශ්නයට ලකුණු 11ට වඩා ලබා ගත් අපේක්ෂකයන් 33%ක් වන අතර, අපේක්ෂකයන්ගෙන් 23%ක් ලබා ගෙන ඇත්තේ ලකුණු 8ට අඩුවෙනි.




මෙම ප්‍රශ්නය විකල්ප ප්‍රශ්න දෙකකින් සමන්විත ය. මෙම ප්‍රශ්නයට පිළිතුරු සැපයූ අපේක්ෂකයන්ගෙන් 98%ක බහුතරයක් සද්ධර්මරත්නාවලිය ඇසුරෙන් සකස් වූ ප්‍රශ්නය තෝරා ගෙන ඇති අතර 2%ක ඉතා සුළු අපේක්ෂකයන් සංඛ්‍යාවක් ජාතක කතා ඇසුරින් සකස් වූ ප්‍රශ්නය සඳහා පිළිතුරු සපයා ඇත.




පළමු වන විකල්පයෙහි පහසුතාව 65%ක් වන අතර දෙවන විකල්පයෙහි පහසුතාව 58%කි.

### පිළිතුරු පිළිබඳ නිරීක්ෂණ

අපේක්ෂකයන්ගෙන් 89%ක් තෝරා ගෙන ඇති මෙම ප්‍රශ්න සම්භාව්‍ය ගද්‍ය සාහිත්‍යයට අයත් සද්ධර්ම රත්නාවලියෙන් හා පන්සිය පනස් ජාතක කතා පොතෙන් සකස් වී ඇත. මේ යටතේ දී ඇති ප්‍රශ්න දෙකෙන් පළමු ප්‍රශ්නය මගින් කතා රසය උද්දීපනය කිරීමෙහි ලා සද්ධර්ම රත්නාවලි කතුවරයා උපමා භාවිත කොට ඇති ආකාරය විමසුමට ලක් කෙරේ. දෙවන ප්‍රශ්නය යොමු වන්නේ ජාතක කතාවල සන්දර්භය පිළිබඳ ව යි. මෙම ප්‍රශ්න දෙක අතුරෙන් අපේක්ෂකයන් වැඩි තෝරා ගැනීමක් මෙන් ම වැඩි පහසුතාව දක්වා ඇත්තේ පළමු ප්‍රශ්නයට ය. 98%ක තෝරා ගැනීම සහිත එම ප්‍රශ්නයේ පහසුතාව 65%කි. දෙවන ප්‍රශ්නයට දක්වා ඇත්තේ 2%ක තෝරා ගැනීමක් හා පහසුතාව 58%කි. මේ අනුව සද්ධර්ම රත්නාවලි ප්‍රශ්නයට අපේක්ෂකයන් වැඩි පහසුතාවක් ප්‍රදර්ශනය කර ඇති බව පෙනී යයි.

### නිගමන හා යෝජනා

විභාග අපේක්ෂකයන්ට සද්ධර්ම රත්නාවලියෙන් කථා වස්තු දෙකක් ද, ජාතක කතා පොතෙන් කථා වස්තු හතරක් ද නිර්දේශ වී ඇත. ප්‍රමාණය අනුව බලන විට සද්ධර්ම රත්නාවලියට යොමු වීම අපේක්ෂකයන්ට වැඩි පහසුතාවක් වූ බව පෙනී යයි. එසේ ම සද්ධර්ම රත්නාවලියෙහි උපමා භාවිතය ඉතා ප්‍රකට විෂය කරුණකි. එ නිසා අපේක්ෂකයන් එම ප්‍රශ්නය තෝරා ගැනීම ඉහළ අගයක් ගෙන ඇත. එසේ ම එම ප්‍රශ්නය සඳහා ඉහළ සාධන මට්ටමක් ද දක්වා ඇත. ජාතක කථා ආශ්‍රිත ප්‍රශ්නය තෝරා ගත් අපේක්ෂක ප්‍රතිශතය අවම අගයක් ගත්ත ද ඔවුන් සැපයූ පිළිතුරු මධ්‍යස්ථ සාධන මට්ටමක් පෙන්නුම් කරයි. එහෙත් ජාතක කතාවල ප්‍රමාණාත්මක බව මෙන් ම දී ඇති ප්‍රශ්නයේ ස්වභාවය එනම් හේතුඵලවාදි කතා සම්ප්‍රදාය ජාතක කතා සන්දර්භයට බලපා ඇති ආකාරය පිළිබඳ ව විමසීම අපේක්ෂකයන්ට පහසු වූ බවක් නො පෙනේ. එබැවින් මෙවැනි කෘති පිළිබඳ ව ලියැවුණු ශාස්ත්‍රීය පොතපත කියවීමට අපේක්ෂකයන් යොමු වීම වැදගත් වේ.

**3.** **"පුණ්‍ය ශක්තියට හා ආත්ම දමනයට අනුරූප ව පුද්ගලයාගේ මෙලොව හා පරලොව ජීවිත හැඩ ගැසෙයි."**
**සද්ධර්මාලංකාරයේ** නියමිත කථා වස්තු ඇසුරෙන් සාකච්ඡා කරන්න. (ලකුණු 15 යි.)

සද්ධර්මාලංකාරයේ කථා වස්තු මගින් පැහැදිලි කෙරෙනුයේ පුණ්‍ය ශක්තියට හා ආත්ම දමනයට අනුරූප ව පුද්ගලයාගේ මෙලොව හා පරලොව ජීවිත හැඩ ගැසෙන ආකාරය යි. මෙම පිළිතුර ලිවීම සඳහා පහත දැක්වෙන කරුණු යොදා ගැනීම යෝග්‍ය වේ.

සාලිරාජ වස්තුව -

තිස්ස නැවැමියා දන්දීමට ඇති ඇඩි කැමැත්ත හේතුවෙන් අත්පත් කර ගන්නා පුණ්‍ය ශක්තියට අනුව ඊළඟ ආත්මයේ දී දුටුගැමුණු රජුගේ පුත් ව ඉපදීම හා මහත් ආශ්චර්ය ලොවට පහළ කිරීම

උදා:- "ඔවුන් මව්කුසින් බිහිවීම හා සමග සියලු ලංකාද්වීපයෙහි එක පැහැර සුවඳ රත්හැල් වර්ෂ කළේ ය".

- අශෝකමාලා බෝ මළුව ඇමදි කුසලයෙන් යහපත් වූ රූප සම්පත්තියක් ලැබ පූර්ව වාසනා බලයෙන් සාලිරාජ කුමරුට මෙහෙසිය වීම හා ආත්ම දමනය හේතුවෙන් දුටුගැමුණු රජුගේ ආශීර්වාදය ලබා ගැනීම

- ඔවුන් දෙදෙනාගේ ආත්ම දමනය හේතුවෙන් සංවර වූත්, සමගි සම්පන්න වූත්, පවුල් දිවියක් ගත කිරීම හා දන් දී කුසල් රැස් කිරීමේ පුණ්‍ය ශක්තියෙන් ජීවිතාවසානයෙහි තුසිත භවනෙහි ඉපදීම

ආරක්ඛක අභය ස්ථවිර වස්තුව -

- ආත්ම දමනයෙන් හා කුසල් කිරීමෙන් වියුක්ත වීම හේතු කොට ගෙන හරන්තික මෙලොව දී ම නොයෙක් වධබන්ධනයට ලක් වීම

උදා:- "මතු මෙසේ වූ සොර කමක් කෙරෙයි ද නොකෙරෙයිදැ'යි කිය කියා අතින් පයින් ඔහු තළා දුර්වල කොට අමුසොහොනකට ඇදගෙන ගොස්...."

- අභය තෙරුන් වහන්සේ තම ආත්ම දමනය හේතුවෙන් සොරාට උවටැන් කිරීම හා උපාසකයාට අනුශාසනා කිරීම


  "චණ්ඩ පරුෂ නීචගුණ ඇති යම් කිසි බල්ලෙක් සත්පුරුෂ ගුණ ඇති යමක්හුගේ පය කඩා කැයේ වී නම් ඒ මිනිසා නැවත...."

- හරන්තික ඇති කර ගන්නා ආත්ම දමනය හේතුවෙන් සසුන්ගත වීම හා අප්‍රමාද ව භාවනා කිරීමේ ශක්තියෙන් රහත් භාවයට පත්වීම

**(ලකුණු 15යි)**

**3 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :**


**3 ප්‍රශ්නය සඳහා ලකුණු ලබා ඇති ආකාරය**




මෙම ප්‍රශ්නය තෝරා ගෙන ඇති අපේක්ෂකයන්ගේ ප්‍රතිශතය 73%කි. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 15ක් හිමි වේ.

ඉන් ලකුණු 00 - 03 ප්‍රාන්තරයේ 7%ක් ද,
ලකුණු 04 - 07 ප්‍රාන්තරයේ 17%ක් ද,
ලකුණු 08 - 11 ප්‍රාන්තරයේ 51%ක් ද,
ලකුණු 12 - 15 ප්‍රාන්තරයේ 25%ක් ද,

ලෙස ලකුණු ලබා ගෙන ඇත. මෙම ප්‍රශ්නයට ලකුණු 11ට වඩා ලබා ගත් අපේක්ෂකයන් 25%ක් වන අතර, අපේක්ෂකයන්ගෙන් 24%ක් ලබා ගෙන ඇත්තේ ලකුණු 8ට අඩුවෙනි.




මෙම ප්‍රශ්නයෙහි පහසුතාව 63%කි.

**පිළිතුරු පිළිබඳ නිරීක්ෂණ**

මෙම ප්‍රශ්නය තෝරා ගත් ප්‍රතිශතය 73%කි. ඒ අතුරෙන් ලකුණු 11ට වඩා ලබා ගත් ප්‍රතිශතය 24%කි. අපේක්ෂකයන්ගෙන් 76%ක පිරිසකට ප්‍රශ්නයකට හිමි ලකුණින් අඩකට වඩා ලබා ගැනීමට හැකි වී තිබේ. 3 ප්‍රශ්නයට පිළිතුරු ලිවීමේ පහසුතාව 63%ක් වී තිබේ. පුණ්‍ය ශක්තිය හා ආත්ම දමනයට අනුරූප ව පුද්ගලයාගේ මෙලොව හා පරලොව ජීවිත හැඩ ගැසෙන ආකාරය නියමිත කථා වස්තු ඇසුරෙන් විමසීම මෙම ප්‍රශ්නයෙන් අපේක්ෂා කෙරිණි. අපේක්ෂකයන් වැඩි පිරිසක් පිළිතුරු ලිවීම සඳහා මෙම ප්‍රශ්නය තෝරා ගෙන තිබේ. නියමිත කථා වස්තු දෙකකට පමණක් සූදානම් වීම අපේක්ෂකයන්ට පහසුවක් වී ඇත.

**නිගමන හා යෝජනා**

බොහෝ අපේක්ෂකයන් පිළිතුරු ලිවීමේ දී අනුගමනය කර ඇත්තේ තමා දන්නා මෙම කතා විස්තර කිරීමේ ක්‍රමයකි. පුද්ගලයාගේ පුණ්‍ය ශක්තිය හා ආත්ම දමනය මෙලොව පරලොව ජීවිත හැඩ ගැස්වීමට බලපා ඇති ආකාරය අදාළ නිදසුන් මගින් දක්වා ඇති විලාසය එතරම් සතුටුදායක නැත. තමා දන්නා කතාවල ඇති ප්‍රශ්නයට අදාළ වන කරුණු පමණක් කථා වස්තුවලින් තෝරා ගෙන ඉදිරිපත් කිරීමේ හැකියාව වර්ධනය කර ගැනීමට අපේක්ෂකයන්ගේ අවධානය යොමු විය යුතු ය.

- **අපේක්ෂකයන්ගේ සාධන මට්ටම් අවබෝධ කර ගැනීම සඳහා සාහිත්‍ය විචාර ඇමුණුම 5 සහ සාහිත්‍ය විචාර ඇමුණුම් 06 බලන්න. (පිටු අංක 83-86)**

**04** ප්‍රශ්නය

**4.** "රස නිෂ්පත්තියට යෝග්‍ය ආකාරයෙන් තෝරාගත් වර්ණනා කලාත්මක ව ඉදිරිපත් කිරීම නිසා **ගිරා සන්දේශය** සහෘදයාගේ සිත් ඇද ගනී." වර්ණනා **දෙකක් වත්** ඇසුරෙන් විමසන්න. (ලකුණු 15 යි.)

මෙම ප්‍රශ්නයට පිළිතුරු ලිවීමේ දී යටත් පිරිසෙයින් වර්ණනා දෙකක්වත් තෝරා ගෙන කරුණු දැක්වීම අපේක්ෂා කෙරේ. එසේ කරුණු දැක්වීමේ දී තෝරා ගත් වර්ණනා කලාත්මක ව ඉදිරිපත් කිරීමත්, ඒවා රස නිෂ්පත්තියට යෝග්‍ය වන ආකාරයෙන් දක්වා තිබීමත් අවශ්‍ය ය. රස නිෂ්පත්තිය ඇති කිරීමේ දී කවියාගේ පරිකල්පනය, ශබ්දාර්ථ රසයන් සුසංයෝග කර ඉදිරිපත් කර ඇති ආකාරය කෙරෙහි අවධානය යොමු කිරීම අවශ්‍ය වේ.

මෙහි දී යොදා ගත හැකි වර්ණනා කිහිපයක් පහත දැක්වේ.

වන වැනුම :- වනාන්තරයක දක්නට ලැබෙන පරිසරය පිළිබඳ ස්වාභාවික චිත්‍රයක් මැවෙන ආකාරයෙන් හා සරල බස් වහර, විරිත් භාවිතයේ විවිධත්වය යනාදියෙන් රසිකයා තුළ රස නිෂ්පත්තිය සිදු කිරීමට කවියා සමත් වේ.

සැඳෑ වැනුම :- සඳ පායා ඒමේ අපූර්වත්වය, උචිත උපමා, රූපක භාවිත කරමින් වාක් චිත්‍රයට නගා තිබේ.

අම්බලමේ කතා:- කටවහරට යෝග්‍ය වන ආකාරයෙන් සරල, සංවාදාත්මක ස්වරූපයෙන් ම මෙම පද්‍ය ඉදිරිපත් කෙරෙන්නේ රසිකයාගේ සුඛාවබෝධයට ඉවහල් වන පරිදි ය.


දියකෙළි වැනුම :- දිය කෙළියේ යෙදෙන කාන්තාවන්ගේ හැසිරීම් රටාවන් හා දක්ෂතා ඔවුන්ගේ සුන්දරත්වය, ගඟෙහි මැවෙන අසිරිය හා බලා සිටින ජනයාගේ ආකර්ෂණය වැනි කරුණු මගින් වර්ණනාවේ කලාත්මක අගය ඉහළ නැංවේ.

තොටගමු වෙහෙර වැනුම :- තොටගමු වෙහෙර අවට ප්‍රදේශයේ ඇති සෞන්දර්යය හා සාමණේරවරුන්ගේ කාරුණික චර්යාවන් ද කවියා වර්ණනා කරන්නේ රසිකයාගේ චිත්තාකර්ෂණයට ඉවහල් වන පරිදි ය.

පිරිවෙන් වැනුම :- කෝට්ටේ යුගයේ පිරිවෙන් අධ්‍යාපනයේ ස්වරූපය පිළිබඳ තොරතුරු කවියා ඉදිරිපත් කරනුයේ ශබ්දාර්ථ දෙකෙහි සුසංයෝගයෙනි. එය රසිකයාගේ රස නිෂ්පත්තියට හේතු වේ.

මේ හැර පුර වැනුම, රජ වැනුම, මග වැනුම ආදි වෙනත් වර්ණනාවලින් ද උචිත නිදසුන් ඉදිරිපත් කළ හැකි ය. **(ලකුණු 15යි)**


**4 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :**




මෙම ප්‍රශ්නය තෝරා ගෙන ඇති අපේක්ෂකයන්ගේ ප්‍රතිශතය 28%කි. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 15ක් හිමි වේ.

ඉන් ලකුණු 00 - 03 ප්‍රාන්තරයේ 8%ක් ද
ලකුණු 04 - 07 ප්‍රාන්තරයේ 15%ක් ද
ලකුණු 08 - 11 ප්‍රාන්තරයේ 39%ක් ද
ලකුණු 12 - 15 ප්‍රාන්තරයේ 38%ක් ද

ලෙස ලකුණු ලබා ගෙන ඇත. මෙම ප්‍රශ්නයට ලකුණු 11ට වඩා ලබා ගත් අපේක්ෂකයන් 38%ක් වන අතර, අපේක්ෂකයන්ගෙන් 23%ක් ලබා ගෙන ඇත්තේ ලකුණු 8ට අඩුවෙනි.




මෙම ප්‍රශ්නයෙහි පහසුතාව 64%කි.

**පිළිතුරු පිළිබඳ නිරීක්ෂණ**

රස නිෂ්පත්තියට යෝග්‍ය ආකාරයෙන් තෝරා ගත් වර්ණනා කලාත්මක ව ඉදිරිපත් කිරීම හේතුවෙන් ගිරා සංදේශය සහෘදයාගේ සිත් ගන්නා ආකාරය වර්ණනා ඇසුරෙන් විමසා බැලීම මෙහි දී අපේක්ෂකයාට පැවරී තිබිණි. රස නිෂ්පත්තිය සඳහා අර්ථ හා ශබ්ද අලංකාර මැනවින් යොදා ගැනීමත්, ඒ සඳහා කවියා සිය පරිකල්පනය මෙහෙයවන ආකාරයත් උචිත නිදසුන් මගින් පෙන්වා දීම ඉන් අපේක්ෂා කෙරිණි. ඒ අනුව මෙම ප්‍රශ්නය සඳහා 64%ක පහසුතාවක් දක්වා තිබිණි. අපේක්ෂකයන්ගෙන් 28%ක් ප්‍රශ්නය තෝරා ගෙන තිබුණු අතර ලකුණු 11ට වඩා ලබා ගැනීමට සමත් ව ඇත්තේ 38%ක ප්‍රතිශතයකි. අපේක්ෂකයන්ගෙන් 77%ක පිරිසකට ප්‍රශ්නයට හිමි ලකුණින් අඩකට වඩා ලබා ගැනීමට හැකි වී තිබේ.

**නිගමන හා යෝජනා**

I ප්‍රශ්න පත්‍රයේ අඩු ම තෝරාගැනීමක් සහිත ප්‍රශ්නය මෙය වුව ද පසුගිය වසරවලට සාපේක්ෂ ව අපේක්ෂකයන් වැඩි ප්‍රමාණයක් මෙම ප්‍රශ්නයට පිළිතුරු ලිවීමට පෙළඹුණු බවක් දක්නට ලැබේ. 23%ක් අඩු ලකුණු ලබා ගැනීමෙන් පැහැදිලි වන්නේ රස නිෂ්පත්තිය ඇති කිරීමට කවියා යොදා ගන්නා උපක්‍රම දක්වමින් සාර්ථක ලෙස පිළිතුරු සැපයීමට ඇතැම් අපේක්ෂකයන් අපොහොසත් වූ බව යි. මේ නිසා කවි උපුටා දැක්වීම පමණක් නොව ඒවායේ අන්තර්ගත විශේෂ ලක්ෂණ ප්‍රශ්නයට අදාළ ව ලියා දැක්වීමට ද අපේක්ෂකයන් පුහුණුවක් ලබා තිබීම අත්‍යවශ්‍ය කරුණක් බව පෙනේ.

**5.** **"ලෝකයේ පවත්නා දේශ සීමා හෝ වාර්ගික ප්‍රශ්න හෝ මගින් ස්ත්‍රී පුරුෂයන් අතර ඇති වන ප්‍රේම සම්බන්ධතාවන්ට බාධාවක් ඇති නො වේ. එහෙත් ගැටලු පැන නගින්නේ විවාහය පිළිබඳ ප්‍රශ්නයේ දී ය." මළගිය ඇත්තෝ නවකතාව ඇසුරෙන් මේ මතය විභාග කරන්න.** (ලකුණු 15 යි.)

දේශ සීමා හෝ වාර්ගික ප්‍රශ්න මගින් ස්ත්‍රී, පුරුෂ ප්‍රේමයට බාධාවක් ඇති නොවන බව මළගිය ඇත්තෝ නවකතාවේ ප්‍රධාන චරිත වන දෙවෙන්දොරා සං හා නොරිකෝ සංගේ චරිත ක්‍රියා කරන ආකාරයෙන් පැහැදිලි කළ හැකි ය. වෙනත් පෙම්වතුන් මෙන් ඔවුහු ද විවිධාකාරයෙන් ප්‍රේමයේ දුක සතුට වින්දනය කරති. එහෙත් විවාහය පිළිබඳ තීරණාත්මක අවස්ථාවක දී ඔවුන් මුහුණ පාන්නේ විසඳා ගැනීමට අසීරු ගැටලුවකට ය. එහි ස්වරූපය පිළිබඳ කරුණු පිළිතුරට අන්තර්ගත විය යුතු අතර , එහි දී අවධානය යොමු කළ හැකි කරුණු කිහිපයක් පහත දැක්වේ.

- දෙවෙන්දොරා සංගේ චරිතය තුළ ඇති අස්ථාවර හා ආත්ම විශ්වාසයෙන් තොර ස්වභාවය

උදා:- " ඇය මා හා විවාහ වී කවර රටක ජීවත් වන්ට ද කියාවත් මම නොසිතුවෙමි."

" අඳුරු වූ අනාගත මාර්ගය අපට මොහොතකටවත් පෙන්වා දෙන මෙන් මම නකජිමා සංගේ මළගිය ආත්මයෙන් අයැදීමි."

" මං දන්නේ නෑ. මම ගියායින් පස්සේ, ආයෙමත් හොඳට කල්පනා කරලා බලන්න. මං ඉන්න කල් අමාරුනේ තීරණය කරන්න. එහේ ගිහිල්ලා අපට වාසනාවන්ත ජීවිතයක් ගත කරන්න පුළුවන් වේවි ද?"

" අවට සෙවනැලි අතරින් නොරිකෝ මතුව එනු පෙනේ...... මම අවට බලමි. තතමි පැදුරු මෙහි නැත..... මෙහි දී නොරිකෝගේ ආචාරශීලය ශෝභන වීමට ඉඩ නැත. එය හාස්‍යජනක වන්ට ද පුළුවන. "

- නොරිකෝ සං විවාහය කෙරේ දැඩි ලෙස අපේක්ෂා සහගත වීම හා ජපන් සංස්කෘතියෙන් බැහැර වීමට ඇති අකැමැත්ත


  " කිසිම දෙයක් පිළියෙල නොකර ඔබ අහනව මම එන්නෙ කවදා ද කියා. මම කෙහොමද එහෙම එන්නෙ? පළමුව ඔබ ඇවිත් මා සමඟ විවාහ වෙන්න ඕන. "

  " ඇත්ත වශයෙන් ම මගේ සිතත් දෙගිඩියාවේ ක්‍රියා කරනවා. ඔබ මෙන් මම ද අනාගතය සකස් කර ගැනීමට දක්ෂ නැත. ඔබට මෙහේ ඇවිත් මා සමඟ විවාහ වන්නට බැරි ද? .... මම කවදා නමුත් අම්මයි තාත්තයි වාසය කරන නකජීමා සෙහොනට ඇතුල් වෙන්න කැමතියි."

මේ හැර පිළිතුර සඳහා ගැළපෙන වෙනත් නිදසුන් ද ලිවිය හැකි ය.

**(ලකුණු 15යි)**


**5 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :**




මෙම ප්‍රශ්නය තෝරා ගෙන ඇති අපේක්ෂකයන්ගේ ප්‍රතිශතය 49%කි. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 15ක් හිමි වේ.

ඉන් ලකුණු 00 - 03 ප්‍රාන්තරයේ 10%ක් ද
ලකුණු 04 - 07 ප්‍රාන්තරයේ 27%ක් ද
ලකුණු 08 - 11 ප්‍රාන්තරයේ 47%ක් ද
ලකුණු 12 - 15 ප්‍රාන්තරයේ 16%ක් ද

ලෙස ලකුණු ලබා ගෙන ඇත. මෙම ප්‍රශ්නයට ලකුණු 11ට වඩා ලබා ගත් අපේක්ෂකයන් 16%ක් වන අතර, අපේක්ෂකයන්ගෙන් 37%ක් ලබා ගෙන ඇත්තේ ලකුණු 8ට අඩුවෙනි.




මෙම ප්‍රශ්නයෙහි පහසුතාව 57%කි.

**පිළිතුරු පිළිබඳ නිරීක්ෂණ**

මෙම ප්‍රශ්නයට පිළිතුරු ලිවීම සඳහා යොමුවූ අපේක්ෂකයන් ගණන ප්‍රතිශතයක් ලෙස 49%කි. ඒ අතුරෙන් ලකුණු 11ට වඩා ලබා ගත් අපේක්ෂකයන් 16%කි. අපේක්ෂකයන්ගෙන් 10%ක් ලබා ගෙන ඇත්තේ 00 - 03 දක්වා වූ අඩු සලකුණකි. ප්‍රශ්නයට හිමි ලකුණින් අඩකට වඩා ලබාගැනීමට හැකි වී ඇත්තේ අපේක්ෂකයන්ගෙන් 63% ක අපේක්ෂක සංඛ්‍යාවකට පමණි. එසේ ම ප්‍රශ්නයේ පහසුතාව 57%ක් වී ඇත. ලෝකයේ පවත්නා දේශ සීමා හෝ වාර්ගික ප්‍රශ්න මගින් ස්ත්‍රී පුරුෂයන් අතර ඇතිවන ප්‍රේම සම්බන්ධතාවන්ට බාධාවක් ඇති නොවුණ ද විවාහය පිළිබඳ ප්‍රශ්නයේ දී ඔවුන් විවිධාකාර ගැටලුවලට මුහුණ දෙන බව මළගිය ඇත්තෝ නවකතාව මගින් පෙන්වා දීම අපේක්ෂකයන්ට පැවරී තිබිණි. මෙහි දී බොහෝ අපේක්ෂකයන් ප්‍රධාන චරිත ද්විත්වයේ ඇති ප්‍රේමණීය සබඳතාවේ ස්වරූපය පිළිබඳ ව කරුණු ඉදිරිපත් කර තිබුණ ද ඔවුන් විවාහය අබියස මුහුණ දෙන ගැටලු මැනවින් විග්‍රහ කොට දක්වා නො තිබිණි.

**නිගමන හා යෝජනා**

මළගිය ඇත්තෝ නවකතාව මගින් ඉදිරිපත් කරන කතා පුවත ලිවීමට බොහෝ අපේක්ෂකයන් පෙලඹී තිබුණ අතර ප්‍රධාන චරිතවල ස්වභාවය, ඔවුන් මුහුණ දෙන ජීවිත අභියෝග යනාදිය ප්‍රශ්නයට අදාළ ව විශ්ලේෂණය කරන්නටත්, නිදසුන් දක්වන්නටත් මනා හැකියාවක් තිබුණු බව ඔවුන්ගේ පිළිතුරුවලින් ප්‍රකාශ වී නැත. එනිසා නියමිත නවකතාව පිළිබඳ ව ගැඹුරින් අධ්‍යයනය කිරීමටත්, විවිධ පැතිකඩ ඔස්සේ අවස්ථා, සිද්ධි හා චරිත පිළිබඳ ව විග්‍රහ කිරීමේ හැකියාව වර්ධනය කර ගැනීමටත් අපේක්ෂකයන් යොමු විය යුතු ය. ඒ අනුව සමස්ත නවකතාව පිළිබඳ පුළුල් අවබෝධයක් ඇති කර ගත යුතු ය.

**6. මාවතේ දරුවෝ** කෙටිකතාව මගින් දයාසේන ගුණසිංහ කාලීන සමාජ යථාර්ථය හෙළි කිරීමට දැරූ උත්සාහය කොතෙක් දුරට සාර්ථක වී දැයි විමර්ශනය කරන්න. (ලකුණු 15 යි.)

මෙම පිළිතුරෙන් සමකාලීන සමාජ යථාර්ථය කෙටිකතාකරුවා ඉස්මතු කරන ආකාරය දැක්වීම අපේක්ෂා කෙරේ.

අප දකින සමාජය තුළ මිනිසා හැසිරෙන ස්වරූපය මිනිසාගේ සැබෑ ස්වරූපය ම නො වේ. එය හුදෙක් බාහිරින් මවාගත් ලෝකයකි. ඒ මවාගත් ලෝකය තුළ නොපෙනෙන සමාජ යථාර්ථයක් ද වෙයි. එය සැබෑ යථාර්ථය ම වන්නේ ය. එය ඉස්මතු කිරීමට කෙටිකතා රචකයා උත්සුක වූ ආකාරය පිළිබඳ පහත සඳහන් කරුණු ඇසුරෙන් පිළිතුර සකස් විය යුතු ය.

(i) වීදි දරුවන්ගේ ජීවිතය හා බැඳුණු සමාජ යථාර්ථය

ඒ යටතේ;

- එම දරුවන්ගේ ජීවිතවල ඇති අවිනිශ්චිත ස්වභාවය
- ඔවුන්ගේ දූදරු දෙමාපිය සම්බන්ධතාවෙහි දූරස්ථභාවය

(ii) අමනෝඥ දේශපාලන ජීවිතය හා බැඳුණු සමාජ යථාර්ථය

ඒ අනුව ;

- ඇතැම් දේශපාලකයන් දේශපාලනයට ප්‍රවේශ වී ඇති ආකාරය
- පීඩිත මිනිසා කෙරෙහි ඔවුන් දක්වන ආකල්පය

- තම අඹුදරුවන් කෙරෙහි ඔවුන් දක්වන ආකල්පය
- ඔවුන්ගේ ගුඪ ජීවන ස්වරූපය
- දේශපාලනයේ ප්‍රචණ්ඩ ස්වරූපය

(iii) ඉහළ පන්තිය නියෝජනය කරන පවුල්වල සමාජ යථාර්ථය
ඒ අනුව ;

- ඔවුන්ගේ දූදරු දෙමාපිය සම්බන්ධතාවල දුරස්ථභාවය
- මුළු ජීවිත කාලය ම ධනය ඉපයීම ම පරමාර්ථ කොටගත් බව
- අවසාන කාලයේ සාත්තු නිවාසවල ඔවුන් ගත කරන හුදකලා ජීවිතය

(iv) ආර්ථික දරිද්‍රතාව නිසා මෙහෙකාර සේවාවේ නිරත තරුණියන්ගේ ජීවිත යථාර්ථය

- ආයාගේ චරිතයේ ඇති කටුකත්වය හා ඇය මුහුණ දෙන පීඩනය
- ඈ තුළ මතු වන තාරුණ්‍යයේ මනෝභාව


(v) ළමා ලෝකය හා බැඳුණු සමාජ යථාර්ථය

- ළමා ජීවිතවල ඇති කෙළිලොල් බව
- ළමා සිත්සතන් තුළ පවතින නිර්ව්‍යාජ භාවය **(ලකුණු 15යි)**

ආදි කරුණු කෙරෙහි අවධානය යොමු විය යුතු ය.

**6 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :**


**6 ප්‍රශ්නය සඳහා ලකුණු ලබා ඇති ආකාරය**




මෙම ප්‍රශ්නය තෝරා ගෙන ඇති අපේක්ෂකයන්ගේ ප්‍රතිශතය 45%කි. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 15ක් හිමි වේ.

| | | | |
|---|---|---|---|
| ඉන් ලකුණු | 00 - 03 | ප්‍රාන්තරයේ | 10%ක් ද |
| ලකුණු | 04 - 07 | ප්‍රාන්තරයේ | 23%ක් ද |
| ලකුණු | 08 - 11 | ප්‍රාන්තරයේ | 45%ක් ද |
| ලකුණු | 12 - 15 | ප්‍රාන්තරයේ | 22%ක් ද |

ලෙස ලකුණු ලබා ගෙන ඇත. මෙම ප්‍රශ්නයට ලකුණු 11ට වඩා ලබා ගත් අපේක්ෂකයන් 22%ක් වන අතර, අපේක්ෂකයන්ගෙන් 33%ක් ලබා ගෙන ඇත්තේ ලකුණු 8ට අඩුවෙනි.




මෙම ප්‍රශ්නයෙහි පහසුතාව 58%කි.

**පිළිතුරු පිළිබඳ නිරීක්ෂණ**

පිළිතුරු ලිවීම සඳහා මෙම ප්‍රශ්නය තෝරා ගත් අපේක්ෂකයන්ගේ ප්‍රතිශතය 45%කි. ඒ අතුරෙන් 22%ක ප්‍රතිශතයක් ලකුණු 11ට වඩා ලබා ගැනීමට සමත් ව ඇත. ලකුණු 00 - 03 දක්වා අඩු ලකුණු ලබා ගත් ප්‍රතිශතය 10%කි. ප්‍රශ්නයට හිමි ලකුණින් අඩකට වඩා ලබාගෙන ඇත්තේ පිළිතුරු සැපයූ අපේක්ෂකයාගෙන් 67% පමණි. එසේ ම ප්‍රශ්නයේ පහසුතාව 58%ක් වී ඇත. මාවතේ දරුවෝ කෙටිකතාව මගින් කාලීන සමාජ යථාර්ථය හෙළි කිරීමට එහි කතුවරයා දැරූ උත්සාහය කොතෙක් දුරට සාර්ථක වී තිබේ දැයි විමර්ශනය කිරීමට අපේක්ෂකයන්ට පැවරී තිබිණි. පිළිතුරු ලිවීම සඳහා එක් කෙටිකතාවක් පමණක් යොදා ගත යුතු වීම අපේක්ෂකයන්ට පහසු වූ බව පෙනී යයි.

**නිගමන හා යෝජනා**

ලකුණු 15ක් ලබා ගැනීමට අවශ්‍ය කරුණු එක් කෙටිකතාවක් ඇසුරෙන් පමණක් උපුටා ගත යුතු වීම නිසා මෙම කෙටිකතාව පිළිබඳ පුළුල් අවබෝධයක් අපේක්ෂකයන්ට තිබිය යුතු වේ. එහෙත් පසුගිය වසරවල කෙටිකතා කිහිපයක් ඇසුරෙන් පිළිතුරු ලිවීමට සිදු ව තිබීම නිසා අපේක්ෂකයන් තමා ඉදිරිපත් කළ කරුණුවල යම් සීමිත බවක් පෙන්වා තිබිණි. එයට හේතුව ඔවුන් කතා කිහිපයකින් පිළිතුරු ලිවීමට සූදානම් ව සිටීම යි. එනිසා ම කාලීන සමාජ යථාර්ථය විවිධ පැතිවලින් දකින්නටත්, ලියන්නටත් ඔවුන් වැඩි සාමර්ථ්‍යයක් දක්වා නැති බව පෙනී යයි. එබැවින් සියලු ම කෙටිකතා පිළිබඳ පුළුල් අවබෝධයක් අපේක්ෂකයා ලබා තිබීම වැදගත් වේ. විශේෂයෙන් ම හුදෙක් මතුපිටින් පෙනෙන කරුණු පමණක් නොව, ඒවායෙන් ඉදිරිපත් කෙරෙන ජීවන යථාර්ථය අවබෝධ කර ගැනීමට ද, උචිත නිදසුන් මගින්

**07 ප්‍රශ්නය**

**7. "කොළඹ යුගයේ ආරම්භක කවීන්ගේ එක් ප්‍රධාන පරමාර්ථයක් වූයේ තම සහෘදයන් ජාතිකාභිමානයෙන් ඔදවත් කිරීම යි." කවීන් දෙදෙනකුගේ පද්‍ය නිර්මාණ ඇසුරෙන් සාකච්ඡා කරන්න. (ලකුණු 15 යි.)**

කොළඹ යුගයේ ආරම්භක කවීන්ගේ ප්‍රධාන පරමාර්ථයක් වූයේ සහෘදයා තුළ ජාතිකාභිමානය ඇනවීම යි. නිර්දිෂ්ට පද්‍ය නිර්මාණ දෙකක් ඇසුරෙන් මෙයට අදාළ කරුණු ගෙන හැර දැක්වීම පිළිතුරෙන් අපේක්ෂා කෙරේ. නිර්දිෂ්ට පද්‍ය නිර්මාණ අතර ඇති ජී. එච්. පෙරේරා විසින් රචිත "පරලොවට පණිවිඩයක්" සහ ඇස්. මහින්ද හිමියන් විසින් රචිත ' දරුනැළවිල්ල ' නිදසුන් ලෙස යොදා ගත හැකි ය. උපහාස රසය යොදා ගනිමින් සිංහලයා තුළ පැවති පරගැති බව හෙළා දැකීමට "පරලොවට පණිවිඩයක්" පද්‍ය පන්තියෙන් උත්සාහ දරා ඇති ආකාරය නිදසුන් මගින් තහවුරු කළ යුතු ය.

- පරගැති සිරිත් විරිත් උපහාසයට ලක්කිරීම

උදා :- " පිටරටට වදාරයි, කාපු දේවත් වමාරයි "

- දේශීය සංස්කෘතිය අභිභවනය කර බටහිර සංස්කෘතිය ඉස්මතු වීම

උදා :- " සිහල සිරිත දැන් නම් තුට්ටුවක් නෑ වටින්නේ "

- පෙරදිග භාෂා යටපත් කොට ඉංග්‍රීසි බස මතුවීම හා දෙමළ බස ඉගෙනීමේ මතු අවශ්‍යතාව.

උදා :- " උගත යුතු ඉංග්‍රිස් ඒ නමුත් පොඩ්ඩකින් බෑ "
" සිහල බස කමක් නෑ, ඒ උගැන්මෙන් පලක් නෑ "
" දෙමළ බස ටිකක් වත් පාඩුවක් නෑ උගත්තොත් "

- කළු හම ලැබීමෙන් සිදු වන පාඩුව

උදා :- " හම සුදුවට නැත්නම් සායමක් වත් ගෙනෙල්ලා "

පාඨකයා තුළ ජාතිකාභිමානී හැඟීම් ඇනවීම සඳහා ලංකාවේ අතීත ශ්‍රී විභූතියත්, ආදි හෙළයාගේ වීරත්වයත් ගෙන හැර පෑමට ඇස්. මහින්ද හිමිගේ "දරු නැළවිල්ල" පද්‍ය නිර්මාණයෙන් උත්සාහ දරා ඇති ආකාරය නිදසුන් මගින් තහවුරු කළ යුතු ය.

- දරුවකු නළවන නැළවිලි ගීයක ආකාරයෙන් රචනා වුව ද එමගින් පාඨකයා අවදි කිරීමට උත්සාහ දරා ඇති බව

උදා :- මුනි සිරිපා සිඹිමින්නේ
සමනොළ ගිරි පෙදෙසින්නේ

- මවුබිම වෙනුවෙන් සිංහලයා සතු යුතුකම සිහිපත් කර දීම

උදා :- ඒ බව සිහිකොට මෙලොවේ
යුතුකම ඉටු කළ යුතු වේ

- සිංහලයාගේ අතීත ශ්‍රී විභූතිය මතු කිරීම

උදා :- ලස්සන මෙන් මහපොළොවේ
අනුරාපුර ඉදිකෙරුවේ

- මවුබිම වෙනුවෙන් දිවි පිදීමට වුව එඩිතර විය යුතු බව


උදා :- ජාතික රණ දෙරණ මතේ
ගැටී වැටී මළ මොහොතේ

මෙවැනි තවත් උදාහරණ ගෙනහැර දක්වමින් ඉහත මතය සනාථ කළ යුතු ය.

**(ලකුණු 15යි)**

**7 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :**


7 ප්‍රශ්නය සඳහා ලකුණු ලබා ඇති ආකාරය




මෙම ප්‍රශ්නය තෝරා ගෙන ඇති අපේක්ෂකයන්ගේ ප්‍රතිශතය 51%කි. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 15ක් හිමි වේ.

ඉන් ලකුණු 00 - 03 ප්‍රාන්තරයේ 13%ක් ද
ලකුණු 04 - 07 ප්‍රාන්තරයේ 24%ක් ද
ලකුණු 08 - 11 ප්‍රාන්තරයේ 36%ක් ද
ලකුණු 12 - 15 ප්‍රාන්තරයේ 27%ක් ද

ලෙස ලකුණු ලබා ගෙන ඇත. මෙම ප්‍රශ්නයට ලකුණු 11ට වඩා ලබා ගත් අපේක්ෂකයන් 27%ක් වන අතර, අපේක්ෂකයන්ගෙන් 37%ක් ලබා ගෙන ඇත්තේ ලකුණු 8ට අඩුවෙනි.




මෙම ප්‍රශ්නයෙහි පහසුතාව 57%කි.

**පිළිතුරු පිළිබඳ නිරීක්ෂණ**

මෙම ප්‍රශ්නය තෝරා ගත් ප්‍රතිශතය 51%කි. ඒ අතුරෙන් 27%ක ප්‍රතිශතයක් ලකුණු 11ට වඩා ලබා ගෙන තිබිණි. ලකුණු 4ට අඩුවෙන් ලබා ගත් ප්‍රතිශතය 13%කි. ප්‍රශ්නයේ පහසුතාව 57%කි. මෙම ප්‍රශ්නයට අනුව සහෘදයන් ජාතික අභිමානයෙන් ඔදවත් කිරීම කොළඹ යුගයේ කවීන්ගේ පරමාර්ථයක් වූ බව අපේක්ෂකයා නිර්දිෂ්ට පද්‍ය ඇසුරෙන් පෙන්වා දිය යුතු විය. මේ සඳහා යොදා ගත යුතු වූයේ කවීන් දෙදෙනෙකුගේ නිර්මාණ ය. එය අපේක්ෂකයාට පහසුවක් වූ බව පෙනී යයි. එනිසා ම 8-11 අතර ලකුණු ලබා ගැනීමේ ප්‍රවණතාව 36%ක් වී තිබේ.

**නිගමන හා යෝජනා**

නියමිත පද්‍ය පන්ති අතුරෙන් පද්‍ය නිර්මාණ දෙකක් පමණක් පිළිතුර සඳහා යොදා ගත යුතු වීම, අපේක්ෂකයන් බහුතරයක් මෙයට සතුටුදායක ලකුණු ලබා ගැනීමට හේතු වූ බව පෙනේ. එසේ ම පිළිතුර සඳහා යොදා ගත යුතු වූ පරලොවට පණිවිඩයක් හා දරු නැළවිල්ල යන පද්‍ය පන්ති දෙක ම අපේක්ෂකයන්ගේ ආකර්ෂණය දිනා ගත් ජනප්‍රිය කවි පන්ති දෙකකි. එනිසා එම ප්‍රශ්නය අපේක්ෂකයන්ට පහසු වූ අතර වැදගත් වන්නේ වඩාත් ප්‍රශස්ත ලේඛන ශෛලියක් ගොඩ නගා ගැනීම කෙරෙහි අපේක්ෂකයාගේ අවධානය යොමු කිරීම යි. කියවීම, ලිවීම සම්බන්ධ නිරන්තර අභ්‍යාස කිරීම මගින් එම කරුණ සාක්ෂාත් කර ගත හැකි වනු ඇත.

**08 ප්‍රශ්නය**

**8.** පැරණි භාරතීය ප්‍රභූ සමාජයේ දුර්වලතා කලාත්මක ව නිරූපණය කිරීමෙහි ලා **රත්නාවලී** නාට්‍යයේ කතුවරයා දරන ප්‍රයත්නය කොතෙක් දුරට සාර්ථක වී දැයි නිදසුන් සහිත ව විමසන්න. (ලකුණු 15 යි.)

රත්නාවලී නාට්‍යයෙහි අපට හමුවන පැරණි භාරතීය ප්‍රභූ චරිත කිහිපයකි. ඒ අතුරෙන් මෙහි ප්‍රධාන චරිතය වන උදයන රජුගේ චරිතයේත්, ඔහුගේ අනුශාසකයා ද, මිතුරා ද වන විදූෂක හෙවත් වසන්තකගේ චරිතයේත් ගැබ් වූ දුබලතා කලාත්මක ලෙස නිරූපණය කරන්නට නාට්‍ය රචකයා සමත් වෙයි.

උදයන රජු :- සංස්කෘත නාට්‍ය නියමයන්ට අනුව නිරූපිත මෙම චරිතය කෙළිලොල්, විනෝදකාමී හා කාමාසක්ත ලක්ෂණවලින් සමන්විත වේ. එහෙත් වගකීමෙන් තොර ව කටයුතු කරන එම චරිතය

ප්‍රේක්ෂකයා තුළ විමතියක් ද, කුතුහලයක් ද හාස්‍ය හා උපහාස රසයක් ද දනවයි. එම චරිතයට ආවේණික වූ මේ ස්වභාවය එහි දිස්වන දුබලතා ලෙස ද කෙනෙකුට ඉදිරිපත් කළ හැකි ය. එයට නිදසුන් පහත දැක්වේ.

- පළමු අංකයේ දී රජු සේවිකාවන්ගේ සරදමට ලක්වීම.

  උදා:- " රජතුමනි, අන්න බිසොවුන් වහන්සේ, ඔබ වහන්සේට නියෝග කරනවා. නෑ නෑ ගෞරවයෙන් දැනුම් දෙනවා...."

- සාගරිකා කෙරෙහි ප්‍රේමයෙන් බැඳුණු රජ තම බිසව ඉදිරියේ වංචනික ලෙස හැසිරීම.

  උදා:- " දේවිය සැක හිතන්ඩ එපා. මේ මම නිකම්ම හිතල ඇඳපු රූපයක් මිස කවදාවත් ම දැකපු කෙනෙක් නෙමෙයි."


- තම බිසවට දක්වන බිය හා යටහත් බව.

  උදා:- " දේවිය, වංචාව අතට ම අහුවුණාට පස්සේ මම මොනවා කියන්න ද? එහෙම වුණත් ......" (දෙපාමුල වැටෙමින්)

- විදූෂක චරිතය මගින් ද නිරූපණය කෙරෙන්නේ තම තනතුරට හිමි වගකීම් ඉටු කිරීමට වඩා රජුගේ සිතැඟි ඉටු කර ගැනීමට අනුබල දීම යි.

  උදා:- i. රජුගේත් සාගරිකාගේත් සම්බන්ධය සඳහා කටයුතු කිරීම
  ii. සාගරිකා පිළිබඳ රජුගේ හැඟීම් උත්තේජනයට අනුබල දීම
  iii. වාසවදත්තා බිසවට වංචා කිරීම
  iv. **සේවිකාවන්ගේ සරදමට ලක්වීම**
  v. **සැළලිහිණියා කෙරෙහි ද්වේශ සහගත වීම**


**8 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :**




මෙම ප්‍රශ්නය තෝරා ගෙන ඇති අපේක්ෂකයන්ගේ ප්‍රතිශතය 28%කි. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 15ක් හිමි වේ.

ඉන් ලකුණු 00 - 03 ප්‍රාන්තරයේ 12%ක් ද
ලකුණු 04 - 07 ප්‍රාන්තරයේ 25%ක් ද
ලකුණු 08 - 11 ප්‍රාන්තරයේ 46%ක් ද
ලකුණු 12 - 15 ප්‍රාන්තරයේ 17%ක් ද

ලෙස ලකුණු ලබා ගෙන ඇත. මෙම ප්‍රශ්නයට ලකුණු 11ට වඩා ලබා ගත් අපේක්ෂකයන් 17%ක් වන අතර, අපේක්ෂකයන්ගෙන් 37%ක් ලබා ගෙන ඇත්තේ ලකුණු 8ට අඩුවෙනි.





මෙම ප්‍රශ්නයෙහි පහසුතාව 53%කි.

**පිළිතුරු පිළිබඳ නිරීක්ෂණ**


මෙම ප්‍රශ්නය තෝරා ගෙන ඇති ප්‍රතිශතය 28%කි. ඒ අතුරෙන් 17%ක් ලකුණු 11ට වඩා ලබා ගෙන ඇති අතර ලකුණු 4ට අඩුවෙන් ලබා ගත් පිරිස 12%කි. ප්‍රශ්නයේ පහසුතාව 53%ක් ලෙස දක්වා ඇත. ප්‍රශ්නයට හිමි ලකුණින් අඩකට වඩා ලබාගැනීමට හැකි වී ඇත්තේ අපේක්ෂකයන්ගෙන් 63%ක පිරිසකට පමණි. මෙම ප්‍රශ්නයෙන් අපේක්ෂා කෙරුණේ පැරණි භාරතීය ප්‍රභූ සමාජයේ දුර්වලතා කලාත්මක ව නිරූපණය කිරීමට රත්නාවලී නාට්‍ය කතුවරයා දැරූ ප්‍රයත්නයේ සාර්ථකත්වය විමසීම යි. මෙහි දී අපේක්ෂකයා එහි ප්‍රධාන චරිතවල දුබලතා හඳුනා ගෙන, රචකයා එම දුබලතා කලාත්මක ව නිරූපණය කර තිබේ ද යන්න උචිත නිදසුන් මගින් ඉදිරිපත් කළ යුතු විය. එහෙත් උදයන රජුගේ, විදූෂකගේ හා ඇතැම් අවස්ථාවල වාසවදත්තා බිසවගේ දුබලතා පිළිබඳ පුළුල් අවබෝධයක් බොහෝ විට පිළිතුරුවලින් ප්‍රදර්ශනය නොවුණු බව දැකිය හැකි ය.

**නිගමන හා යෝජනා**

කිසියම් කෘතියක් විභාගය සඳහා නිර්දේශ වන විට එම කෘතියේ සමස්තය දැකීම අනිවාර්ය අවශ්‍යතාවක් වේ. බොහෝ විට අපේක්ෂකයන් තුළ දැකිය හැකි දුබලතාවක් වනුයේ තම පිළිතුර අංග සම්පූර්ණ කිරීම සඳහා අවශ්‍ය කරුණු පිළිතුරට ඇතුළත් නො කිරීම යි. මෙහි දී ප්‍රභූ සමාජය නියෝජනය කරන චරිත කිහිපය පිළිබඳ ව ම අවධානය යොමු කළ යුතු ව තිබිණි. එහෙත් 46%ක පමණ ප්‍රතිශතයක් මධ්‍යස්ථ ලකුණු මට්ටමක් (8-11) ලබා ගැනීමෙන් පැහැදිලි වන්නේ උසස් සාධන මට්ටමක් ලබා ගැනීමට ඔවුන් අපොහොසත් වූ බව යි. ප්‍රශ්නය තෝරා ගත් ප්‍රතිශතය ද අඩු අගයක් ගනී. එබැවින් සංස්කෘත නාට්‍ය රස විඳීමටත් ඒවායින් නිරූපිත ප්‍රභූ සමාජයේ ලක්ෂණ හඳුනා ගැනීමටත් අපේක්ෂකයන් යොමු වීම වැදගත් ය. සීමිත කාලයක් තුළ අවශ්‍ය කරුණු පිළිතුරට ඇතුළත් කර ගැනීමෙහි ලා නිරන්තර අභ්‍යාසකරණය ද අවශ්‍ය වේ.


අ.පො.ස. (උ.පෙළ) විභාගය - 2018
71 - සිංහල
I ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න සඳහා වරණීකරණය අනුව පහසුතාව
ඵලඥෆලප්‍රති
ප්‍රශ්න අංක
76%
65%
71%
44%
53%
42%
48%
39%
75%
92%
91%
84%
9%
4%
44%
31%
32%
39%
31%
27%
12%
29%
56%
65%
58%
63%
64%
57%
50%
57%
53%
(i) (ii) (iii) (iv)
(අ)
(ආ)
(ඉ)
(ඊ)
(උ)
(ඌ)
හෝ
1
2
3
4
5
6
7
8
100
90
80
70
60
50
40
30
20
10
0

1 ප්‍රශ්නයේ අනුකොටස් 23 අතුරෙන් 40%කට වඩා අඩු පහසුතා ලබා ඇති අනුකොටස් 10ක් ම ඇත. අනුකොටස් 16ක් පැරණි ගද්‍ය පද්‍ය සාහිත්‍යාවබෝධය ඇසුරෙන් සකස් වී ඇති අතර ඉන් 4ක ම පහසුතාව 40%කට අඩු ය. තව ද නිර්දිෂ්ට ග්‍රන්ථ අවස්ථා සම්බන්ධය ඇසුරෙන් අනුකොටස් 6ක් ඇති අතර එහි සමස්ත පහසුතාව 28%කි. 1හි (ඉ) කොටස රසාස්වාදය ඇසුරෙන් සකස් කර ඇති අතර එහි පහසුතාව 56%කි. ප්‍රශ්න අංක 2 සිට 8 තෙක් ප්‍රශ්න අතුරෙන් ප්‍රශ්න 3ක් සම්භාව්‍ය සාහිත්‍ය ග්‍රන්ථ ඇසුරෙන් ද ඉතිරි ප්‍රශ්න 4 නූතන ගද්‍ය පද්‍ය සාහිත්‍ය ග්‍රන්ථ ඇසුරෙන් ද සැකසී ඇති අතර ඒවායේ පහසුතාව 53% සිට 65% අතර විසිරී පවතී.




සමස්ත පහසුතාව සැලකීමේ දී 28%ක් වන අඩු ම පහසුතාව නිර්දිෂ්ට ග්‍රන්ථ අවස්ථා සම්බන්ධය ඇසුරෙන් සැකසූ ප්‍රශ්නවලට ලබා දුන් පිළිතුරුවලට ලැබී ඇත. එමෙන් ම 54% වන ඊළඟ පහසුතාව පැරණි ගද්‍ය පද්‍ය සාහිත්‍යය ඇසුරෙන් සැකසූ අවබෝධය ප්‍රශ්නවලට ලැබී ඇත. එබැවින් ඉහත කරුණු කෙරෙහි වැඩි අවධානයක් ඉගෙනුම් ඉගැන්වීම් කාර්යයේ දී යොමු කළ යුතු ය.

## 2.2 II ප්‍රශ්න පත්‍රය හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු

### 2.2.1 II ප්‍රශ්න පත්‍රයේ ව්‍යුහය

කාලය පැය 03කි.

ප්‍රශ්න කියවා තෝරා ගැනීම සඳහා අමතර කියවීම් කාලය මිනිත්තු 10කි.

මෙම ප්‍රශ්න පත්‍රය කොටස් **දෙකකින්** සමන්විත ය.

I කොටස - මෙම කොටසට වරණ 5 බැගින් වූ බහුවරණ ප්‍රශ්න 20කි. ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සැපයිය යුතු ය. එක් ප්‍රශ්නයකට ලකුණු 01 බැගින් ලකුණු 20කි.

II කොටස - අර්ධ ව්‍යුහගත රචනා වර්ගයේ ප්‍රශ්න 7කි. 2 හා 3 ප්‍රශ්න ඇතුළු ව ප්‍රශ්න හතරකට පිළිතුරු සැපයිය යුතු ය. මෙම කොටසේ 2 හා 3 ප්‍රශ්නවලට ලකුණු 25 බැගින් ද සෙසු ප්‍රශ්නවලට ලකුණු 15 බැගින් ද ලැබේ.

| | | |
|---|---|---|
| 2 හා 3 ප්‍රශ්න සඳහා (ලකුණු 25 බැගින්) | - 25 × 2 | = 50 |
| තෝරාගත් ප්‍රශ්න දෙක සඳහා (ලකුණු 15 බැගින්) | - 15 × 2 | = 30 |
| II කොටස සඳහා මුළු ලකුණු | - 50 + 30 | = 80 |

| | | |
|---|---|---|
| II පත්‍රය සඳහා මුළු ලකුණු | I කොටස | = 20 |
| | II කොටස | = 80 |
| | 20 + 80 | = 100 |

## 2.2.2. II ප්‍රශ්න පත්‍රය - I කොටස

**1.** එක් එක් ප්‍රශ්නයට වඩාත් ම ගැළපෙන පිළිතුර තෝරා ගෙන, **එයට හිමි අංකය වරහන තුළ ලියන්න.**

1.1. **අඝෝෂාක්ෂර** පමණක් අන්තර්ගත වරණය තෝරන්න.

(1) ක, ච, ට, ත, ප, ස (2) ග, ඝ, ජ, ඣ, ද, ධ
(3) ඞ, ඤ, ණ, න, ම, ස (4) ය, ර, ල, ව, ශ, ෂ
(5) ඝ, ඣ, ඪ, ධ, භ, ක (……)

1.2. **නිවැරදි අක්ෂර වින්‍යාසය** සහිත පද පේළිය තෝරන්න.

(1) විමර්ශණය, කණාමැදිරි, ලතැවිල්ල, තුෂ්ණීම්භූත, කාළගුණය
(2) විමර්ශනය, කණාමැදිරි, ළතැවිල්ල, තුෂ්ණීම්භූත, කාලගුණය
(3) විමර්ශනය, කනාමැදිරි, ළතැවිල්ල, තුශ්ණීම්භූත, කාලගුණය
(4) විමර්ෂණය, කණාමැදිරි, ලතැවිල්ළ, තුස්ණීම්බූත, කාළගුණය
(5) විමර්ෂනය, කනාමැදිරි, ලතැවිල්ල, තුෂ්ණීම්භූත, කාලගුණය (……)

1.3. **අකාරාදි පිළිවෙළ අනුව නිවැරදි ව ලියා ඇති** පද පේළිය තෝරන්න.

(1) අලියා, මුවා, සිංහයා, මුගටියා (2) හාවා, වලහා, ව්‍යාඝ්‍රයා, ඌරා
(3) ගොනා, හිවලා, උගුඩුවා, කටුස්සා (4) බළලා, බූරුවා, රිළවා, වඳුරා
(5) මීයා, අශ්වයා, බල්ලා, කොටියා (……)

1.4. පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් **නිරවද්‍ය ප්‍රකාශය** තෝරන්න.

(1) 'ෙ' යනු 'එ' යන්න නියෝජනය කරන පිල්ලම යි.
(2) 'ඓතිහාසික' යනුවෙන් කොම්බු දෙක සහිත ව ලිවීම නිරවද්‍ය ය.
(3) ව්‍යඤ්ජනයක් සමඟ මෙන් ම ස්වරයක් සමඟ ද කොම්බු දෙක යෙදේ.
(4) සම්භාව්‍ය ගද්‍ය රචනාවන්හි 'ඓ' යන්න වෙනුවට 'අයි' යන්න ද භාවිත වේ.
(5) 'ඓ' යනු 'අ + එ' යන අක්ෂර සන්ධි වීමෙන් සැකසුණු අකුරකි. (……)

1.5. **යංශය, රේඵය, රකාරාංශය** හා **ගයනුකිත්ත** සහිත වචන **අනුපිළිවෙළින්** යෙදී ඇති පද පේළිය තෝරන්න.

(1) නාට්‍ය, ගර්භ, සංක්‍රමණ, චෞර (2) වාක්‍ය, ප්‍රතාප, මෞර්ය, නිර්මාණ
(3) වර්ග, ක්‍රීඩා, වාච්‍ය, රෞරව (4) ප්‍රධාන, දිව්‍ය, තර්ක, ශෞර්ය
(5) කෞතුක, ප්‍රමාණ, දුර්ග, නිත්‍ය (……)

1.6. එකිනෙකට **අනුරූප වන සේ වචන යුගල යෙදී ඇති** වරණය තෝරන්න.

(1) ආගමික සහජීවනය, වෛද්‍ය උපාධිය, අසල්වැසි රාජ්‍යය, විධායක ජනාධිපති
(2) වීර කාව්‍යය, ජාතික අනුරාගය, අශ්ව රථය, මානව හිමිකම්
(3) ධාවන පථය, කඳු තරණය, චිත්‍ර කලාව, තාරකා විද්‍යාව
(4) ජංගම සේවාව, සිප් සතර, රාත්‍රී භෝජනය, මඟුල් නැකත
(5) මහ මඟ, ව්‍යවස්ථා සංශෝධනය, මිනිස් ශරීරය, ස්වර්ග සම්පත්ති (……)

1.7. **තත්සම වචන පමණක්** යෙදී ඇති වරණය කුමක් ද?

(1) පාලක, ආචාර්ය, වාහන, පරණ (2) චතුර, අංක, නාග, වංක
(3) ආකර, දේව, හම, සමණ (4) විකාර, බාලක, නිවාස, මිතු
(5) සකල, කෝප, රාග, සග (……)

1.8. මුලින් දී ඇති පදයට **විරුද්ධාර්ථයක් නො දෙන** පදයක් ඇතුළත් වරණය තෝරන්න.

(1) අවසාන - අනන්ත, අනවසාන, මුල, ආරම්භය
(2) කනිෂ්ඨ - ජ්‍යෙෂ්ඨ, මහලු, වෘද්ධ, වයසක
(3) අවුල් - නිරවුල්, ව්‍යාකූල, පැහැදිලි, නිරාකුල
(4) කෲර - ශාන්ත, දැමුණු, සංවර, සන්සුන්
(5) ශබ්ද - නිහඬ, නිශ්ශබ්ද, නිශ්චල, නිසංසල (……)

1.9. මුලින් දී ඇති පදයට **සමානාර්ථ පදයක්** ඇතුළත් **නො වන** වරණය තෝරන්න.

(1) මාර්ගය - පාර, මඟ, පථය, වීථිය (2) වස්ත්‍රය - රෙද්ද, වත, සළුව, සාටකය

(3) හිස - ශීර්ෂය, ඔළුව, මුදුන, සිරස (4) පර්වතය - ගිරි, පව්ව, කන්ද, අචල

(5) හස්තය - බාහුව, කර, අත, අල්ල (......)

1.10. **අවදි, අදර, සපදන්** හා **සබඳ** යන **විභක්ති සමාස** පද **පිළිවෙළින්** දක්වා ඇති වරණය තෝරන්න.

(1) විදේශාධාර, අතදරුවා, දේවපූජාව, කුරුලුගීත

(2) දේවපූජාව, විදේශාධාර, අතදරුවා, කුරුලුගීත

(3) අතදරුවා, කුරුලුගීත, දේවපූජාව, විදේශාධාර

(4) විදේශාධාර, දේව පූජාව, කුරුලුගීත, අතදරුවා

(5) කුරුලුගීත, අතදරුවා, විදේශාධාර, දේවපූජාව (......)

1.11. **කෘදන්තයක් නො වන පදයක් අන්තර්ගත** වරණය තෝරන්න.

(1) විසිරුම්, ඇසිරුම්, ඉසිරුම්, හැසිරුම් (2) උතුළ, වපුළ, අතුළ, හළ

(3) වැසිලි, බැසිලි, කිසිලි, නැසිලි (4) ලිඛිත, සංශෝධිත, රචිත, දේශිත

(5) පාරන, ආරන, මෝරන, සුරන (......)

1.12. පහත සඳහන් උද්ධෘතවල **තද කළු අකුරෙන්** මුද්‍රිත පද **අයත් ක්‍රියා වර්ගය පිළිවෙළින්** දක්වා ඇති වරණය තෝරන්න.

(අ) '**එන්න** මඳ නලේ ....' (ආ) 'කෙත් වත් සාර **වේවා**!'

(ඉ) 'රොන් **අරගෙන** සෙමින්' (ඊ) '**කියමින්** සොඳ ගී සින්දු'

(1) ආශීර්වාදක්‍රියා, විධික්‍රියා, මිශ්‍රක්‍රියා, පූර්වක්‍රියා (2) විධික්‍රියා, ආශීර්වාදක්‍රියා, මිශ්‍රක්‍රියා, පූර්වක්‍රියා

(3) මිශ්‍රක්‍රියා, විධික්‍රියා, ආශීර්වාදක්‍රියා, පූර්වක්‍රියා (4) විධික්‍රියා, ආශීර්වාදක්‍රියා, පූර්වක්‍රියා, මිශ්‍රක්‍රියා

(5) ආශීර්වාදක්‍රියා, විධික්‍රියා, පූර්වක්‍රියා, මිශ්‍රක්‍රියා (......)

1.13. **උක්ත පද දෙකක්** හා **අනුක්ත පද දෙකක්** අන්තර්ගත වරණය තෝරන්න.

(1) පාලකයන්, වටුවකු, හෙදියක, ගෙම්බෝ (2) සිවුපාවෙක්, ගොවියකු, තරුණයන්, බැතිමතෙක්

(3) උපාසිකාවන්, වෙළෙන්දෝ, නරියෙක්, අපි (4) රචකයකු, තිරිඳෙක්, කපටියකු, නෑයකු

(5) ලේඛිකාවක්, වඳුරකු, නැණවතෙක්, වැසියෙක් (......)

1.14. **උපසර්ගයක් යෙදී නැති** පදයක් සහිත පද පේළිය තෝරන්න.

(1) අවමංගල, අවභාවිත, අවනීති, අවපීඩන (2) අනුමෝදනා, අනුකම්පා, අනුමාන, අනුවේදන

(3) විගමන, විදුර, විශුද්ධි, විදේශ (4) දූලඳ, දුමන, දුසිල්, දුගුණ

(5) නිර්වින්දන, නිර්ලජ්ජිත, නිර්දෝෂ, නිර්මාංස (......)

1.15. "සද්ධර්ම **රත්නාවලිය** වනාහි ධර්මසේන හිමියන් විසින් **රචිත ප්‍රබන්ධයකි**." යන වාක්‍යයෙහි වචන යෙදී ඇති පිළිවෙළ අනුව **තද කළු අකුරෙන් ඇති පද** අයත් වන්නේ කුමන ව්‍යාකරණ අංගවලට ද?

(1) කෘදන්ත, සමාස හා සන්ධි (2) සමාස, සන්ධි හා කෘදන්ත

(3) සන්ධි, සමාස හා කෘදන්ත (4) කෘදන්ත, සන්ධි හා සමාස

(5) සන්ධි, කෘදන්ත හා සමාස (......)

1.16. **ව්‍යාකරණානුකූල ව නොගැළපෙන** පදයක් ඇති වරණය කුමක් ද?

(1) තල්ලරඹ, කොස්සැට, රුක්කත්තන, කරුමක්කාර

(2) ළමාලෝකය, වැදිබණ, ශාක්‍යවංශය, යක්ෂවිමානය

(3) දම-දමා, කප-කපා, හාර-හාරා, ලිය-ලියා

(4) පැසසිණි, ලියැවිණි, බැලිණි, කැපිණි

(5) දිරිමත්, රුමත්, අසිරිමත්, ඉසුරුමත් (......)

1.17. **සමාසයක් නො වන පදයක් ඇතුළත්** වරණය තෝරන්න.

(1) යකඩදම්වැල්, ගල්පඩි, කොහුලනු, පුහුල්දෝසි
(2) මුහුණත, දකුණත, නිලුපුල්, මැදගිල්ල
(3) නිවැරදි, නිකැලැල්, නිහඬ, නිදොස්
(4) දෙමහල්, සිවුපද, සතරවාසල්, දෙතිස්වද
(5) නගරසභාව, වනබඹරා, දොරගුළු, විදෙස්පුවත් (……)

1.18. **එක ම වර්ගයට අයත් සන්ධි පද** අන්තර්ගත වරණය තෝරන්න.

(1) සමුද්‍රාසන්න, හස්තාභරණ, ස්වදේශාලය, පද්මාකර
(2) මිගිඳු, ගුරුළිඳු, මුනිඳු, රජිඳු
(3) ජාත්‍යභිමානය, රත්‍යුත්සව, නීත්‍යුපදේශ, අත්‍යාසන්න
(4) බලැති, නැණැති, විකුමැති, රුවැති
(5) අද්දැකීම, අස්සන, රද්දැල්ලො, පත්තිරු (……)

1.19. ව්‍යාකරණානුකූල ව **නිවැරදි වැකිය** තෝරන්න.

(1) පත්තරකරුවෝ අසත්‍ය පතුරවති'යි පාලකයෝ දෝෂාරෝපණය කරති.
(2) ප්‍රකට විද්වතකු වූ ඩී. බී. ජයතිලක කීර්තිමත් ජාතික නායකයෙක් ද විය.
(3) මෙය ආබාධිත දරුවෝ උදෙසා පරිත්‍යාග කරන ලද රෝද පුටුවකි.
(4) අපගේ දරුවන් විභාගයෙන් ජය ගනිත්වා!
(5) මාර්ටින් වික්‍රමසිංහයන් විසින් විවිධ ග්‍රන්ථයන් රචනා කරන ලදි. (……)

1.20. **වඩාත් ම නිවැරදි පද බෙදීම** සහිත වාක්‍යය තෝරන්න.

(1) එතුමා බලියා ගත් බෙර වාදන යත් උගත්තේ ය.
(2) කාව්‍ය සාහිත්‍ය විෂයයෙහිලා පුරාතන විද්වතුන්ගේ සම් ප්‍රදානය අත්‍යධික ය.
(3) ගුණවත් හා නැණවත් මිනිසුන්ට ගරු බුහුමන් දැක්වී ම අපක්ෂපාතීවත් ක්‍රමානුකූලවත් කළ යුතු ය.
(4) විද්‍යාචක්‍රවර්තීන් ගේ බුත් සරණ වනා හි ප්‍රකට භක්ති කාව්‍යයකි.
(5) ඔහු ශාස්ත්‍රවේදී හා විද්‍යාවේදී යන උපාධි දෙක ම දිනා ගත්තේ ය. (……)

(ලකුණු 20 යි.)

**2.2.3 II පත්‍රයේ I කොටස සඳහා අපේක්ෂිත ලකුණු දීමේ පටිපාටිය**

| ප්‍රශ්න අංකය | පිළිතුර |
|---|---|
| 1.1 | ..1...... |
| 1.2 | ..2...... |
| 1.3 | ..4...... |
| 1.4 | ..5...... |
| 1.5 | ..1...... |
| 1.6 | ..4...... |
| 1.7 | ..2...... |
| 1.8 | ..3...... |
| 1.9 | ..5...... |
| 1. 10 | ..1...... |
| 1. 11 | ..3...... |
| 1. 12 | ..4...... |
| 1. 13 | ..2...... |
| 1. 14 | ..3...... |
| 1. 15 | ..5...... |
| 1. 16 | ..1...... |
| 1. 17 | ..2...... |
| 1. 18 | ..3...... |
| 1. 19 | ..2...... |
| 1. 20 | ..5...... |

නිවැරදි එක් පිළිතුරකට ලකුණු 01 බැගින් මුළු ලකුණු 20කි.

**2.2.4 II ප්‍රශ්න පත්‍රයේ I කොටසට එක් එක් ප්‍රශ්නයෙහි වරණ තෝරා ඇති ආකාරය - ප්‍රතිශත ලෙස**

| ප්‍රශ්න අංකය | නිවැරදි වරණය | එක් එක් වරණය තෝරා ඇති ශිෂ්‍ය ප්‍රතිශතය | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | | 1 | 2 | 3 | 4 | 5 | Missing |
| 1.1 | 1 | **72.40** | 11.67 | 4.33 | 6.70 | 4.83 | 0.07 |
| 1. 2 | 2 | 8.50 | **67.63** | 12.74 | 4.73 | 6.33 | 0.07 |
| 1. 3 | 4 | 9.07 | 2.20 | 3.43 | **84.23** | 1.00 | 0.07 |
| 1. 4 | 5 | 6.30 | 26.40 | 18.00 | 15.47 | **33.70** | 0.13 |
| 1. 5 | 1 | **97.77** | 0.63 | 0.23 | 0.77 | 0.57 | 0.03 |
| 1. 6 | 4 | 19.63 | 17.54 | 40.70 | **15.53** | 5.93 | 0.67 |
| 1. 7 | 2 | 18.20 | **29.77** | 13.93 | 11.30 | 26.53 | 0.27 |
| 1. 8 | 3 | 34.47 | 6.43 | **46.50** | 7.84 | 4.63 | 0.13 |
| 1. 9 | 5 | 1.87 | 6.10 | 1.73 | 39.76 | **50.47** | 0.07 |
| 1. 10 | 1 | **39.10** | 18.93 | 16.44 | 11.83 | 13.43 | 0.27 |
| 1. 11 | 3 | 2.97 | 22.63 | **34.33** | 28.34 | 11.63 | 0.10 |
| 1. 12 | 4 | 0.40 | 10.87 | 1.10 | **87.23** | 0.33 | 0.07 |
| 1. 13 | 2 | 13.27 | **60.77** | 17.47 | 3.43 | 4.86 | 0.20 |
| 1. 14 | 3 | 2.83 | 14.87 | **23.60** | 44.97 | 13.63 | 0.10 |
| 1. 15 | 5 | 5.03 | 6.63 | 17.43 | 3.57 | **67.27** | 0.07 |
| 1. 16 | 1 | **56.23** | 24.13 | 6.54 | 6.90 | 5.90 | 0.30 |
| 1. 17 | 2 | 9.00 | **47.83** | 18.00 | 9.17 | 15.97 | 0.03 |
| 1. 18 | 3 | 12.07 | 16.07 | **21.60** | 40.43 | 9.70 | 0.13 |
| 1. 19 | 2 | 11.97 | **47.97** | 6.23 | 15.80 | 17.96 | 0.07 |
| 1. 20 | 5 | 3.70 | 2.10 | 16.06 | 4.00 | **73.87** | 0.27 |

එක් එක් ප්‍රශ්නය යටතේ නිවැරදි වරණය තෝරා ඇති ශිෂ්‍ය ප්‍රතිශතය අඳුරු කර ඇති කොටුවලින් දැක්වේ.

**2.2.5 II ප්‍රශ්න පත්‍රයේ I කොටසට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :**

බහුවරණ ප්‍රශ්න 20කින් සමන්විත මෙම ප්‍රශ්න පත්‍රය මගින් සිංහල භාෂාව පිළිබඳ අපේක්ෂකයන් සතු නිරවුල් දැනුම, අවබෝධය, ස්මරණ ශක්තිය, භාෂා පරිචය හා භාවිතය යන කුසලතා මැන බැලීම හා ඇගයීම අපේක්ෂිත ය.

මෙම බහුවරණ ප්‍රශ්න 20ට ම ප්‍රශ්න පත්‍රයේ ම පිළිතුරු සැපයීම අනිවාර්ය වේ. සිංහල ප්‍රශ්න පත්‍රයට හිමි පැය තුනක කාලයෙන් නිශ්චිත කොටසක් මෙම I කොටසේ ප්‍රශ්න 20ට පිළිතුරු සැපයීම සඳහා වෙන් කර නොමැති වුවත් සාමාන්‍යයෙන් පැය භාගයක කාලයක් ඒ සඳහා යෙදීම ප්‍රමාණවත් වේ යැයි අපේක්ෂා කෙරේ.

අංක 08 පිටුවේ ඇති ප්‍රස්තාරයෙහි හා 45 පිටුවේ ඇති වගුවේ දැක්වෙන තොරතුරුවලට අනුව එම ප්‍රශ්න 20 අතුරෙන් පහසුතාව 75% ඉක්මවා පෙන්වන්නේ 1.5, 1.12 ප්‍රශ්නය හා 1.3 ප්‍රශ්න යි. එනම් මෙම පත්‍රයට පිළිතුරු සැපයූ අපේක්ෂකයන්ගෙන් 75%කට වඩා වැඩි පිරිසකට ඉහත ප්‍රශ්නවලට නිවැරදි ව පිළිතුරු සැපයීමට හැකි වී තිබේ. එබැවින් එකී ප්‍රශ්න පහසු ම ප්‍රශ්න ලෙස සැලකිය හැකි වේ. එම ප්‍රශ්න අතුරෙන් අංක 1.5 ප්‍රශ්නය වඩාත් පහසු ප්‍රශ්නය වී ඇති අතර එහි පහසුතාව 98%ක් වේ. මීළඟට පහසු ප්‍රශ්නය වී ඇත්තේ අංක 1.12යි. එහි පහසුතාව 87%ක් වේ. අනතුරු ව 84%ක පහසුතාව ඇත්තේ අංක 1.3 ප්‍රශ්නයට ය.

මෙහි දී අංක 1.5 ප්‍රශ්නයෙන් විමසා ඇති අක්ෂර සංකේත යෙදීමේ අනුපිළිවෙළ ඉතා ඉහළ අපේක්ෂකයන් සංඛ්‍යාවකගේ පහසුතාවට ලක් ව ඇත. අංක 1.12 ප්‍රශ්නයෙහි ක්‍රියා වර්ග හඳුනා ගැනීමෙහි ලා අපේක්ෂකයන් වැඩි දක්ෂතාවක් පෙන්නුම් කර ඇත. අංක 1.3 ප්‍රශ්නයෙහි අකාරාදි පිළිවෙළ අවබෝධ කර ගැනීමෙහි ඇති පහසුතාව හේතුවෙන් වැඩි අපේක්ෂකයන් පිරිසක් අදාළ පිළිතුර හඳුනා ගත් බව පැහැදිලි වේ.

අංක 1.1, 1.2, 1.9, 1.13, 1.15, 1.16 හා 1.20 යන ප්‍රශ්නවල පහසුතාව 50% - 75% අතර ප්‍රාන්තරයට අයත් වේ. අනෙකුත් ප්‍රශ්නවලට සාපේක්ෂ ව මෙම ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම අපේක්ෂකයන්ට පහසු වී ඇති බව අනාවරණය වේ. අංක 1.4, 1.8, 1.10, 1.11, 1.17 හා 1.19 යන ප්‍රශ්නවල පහසුතාව 30% - 49% අතර ප්‍රාන්තරයට අයත් වේ.

අංක 1.6, 1.18 හා 1.14 යන ප්‍රශ්නවල පහසුතාව 29%ට වඩා අඩුවන බැවින් එම ප්‍රශ්න බොහෝ අපේක්ෂකයන්ට නිවැරදි ව පිළිතුරු සැපයීමට දුෂ්කර වූ ප්‍රශ්න ලෙස සැලකිය හැකි ය. ඒ අතුරෙන් වඩාත් ම දුෂ්කර වී ඇති ප්‍රශ්නය වන්නේ අංක 1.6 ප්‍රශ්නය යි. එහි පහසුතාව 16%ක් වේ. එසේ සාධන මට්ටම අඩු වීමට හේතු වී ඇත්තේ අපේක්ෂකයන් තුළ තත්සම, තද්භව පද එකිනෙකට අනුරූප ලෙස යෙදීම පිළිබඳ ව පැවති අනවබෝධය බව පෙනී යයි.

මෙම ප්‍රශ්න පත්‍රයෙහි අනිවාර්ය බහුවරණ ප්‍රශ්න 20 පිළිවෙළින් භාෂා කුසලතා, ව්‍යාකරණය, අවබෝධය හා විශ්ලේෂණය යන ප්‍රධාන තේමාවලට යෝග්‍ය ආකාරයෙන් සකස් කර ඇත. භාෂා කුසලතා යටතේ අක්ෂර වින්‍යාසය (1.1, 1.2, 1.4, 1.5), අකාරාදි පිළිවෙළ (1.3), වචන කෝෂය (1.6, 1.7, 1.8 හා 1.9) පද බෙදීම (1.20) යන අංශවලට අදාළ ව ප්‍රශ්න ඉදිරිපත් කර ඇත.

ව්‍යාකරණය යන තේමාව යටතේ 1.10, 1.11, 1.12, 1.13, 1.14, 1.15, 1.16, 1.17, 1.18 හා 1.19 යන ප්‍රශ්න ඇතුළත් කළ හැකි ය. අවබෝධය හා විශ්ලේෂණය මේ සෑම ප්‍රශ්නයක් සමග ම අනුබද්ධ ව පවතී. සෑම ප්‍රශ්නයක් ම යොමු වන්නේ වරණ පහක් යටතේ ය. එම වරණ පහෙන් යෝග්‍ය වරණය තෝරා ගැනීමේ අවබෝධය අපේක්ෂකයන් තුළ තිබිය යුතු ය. එසේ ම එක් එක් වරණය විශ්ලේෂණය කරමින් දැනුම හා අවබෝධය උපයෝගී කර ගෙන වඩාත් යෝග්‍ය වරණය තෝරා ගැනීමට අපේක්ෂකයන් යොමු කෙරෙන බව කිව යුතු ය.

සිංහල II පත්‍රයෙහි I කොටසට අයත් බහුවරණ ප්‍රශ්න 20 පහත දැක්වෙන පරිදි ප්‍රධාන තේමා තුනක් යටතේ වර්ගීකරණය කළ හැකි වේ.

- භාෂා කුසලතා - 1.1, 1.2, 1.3, 1.4, 1.5, 1.6, 1.7, 1.8, 1.9, 1.20
- ව්‍යාකරණය - 1.10, 1.11, 1.12, 1.13, 1.14, 1.15, 1.16, 1.17, 1.18, 1.19
- අවබෝධය හා විශ්ලේෂණය - 1.1 සිට 1.20 තෙක් ප්‍රශ්න 20ම

**භාෂා කුසලතා**

මෙම ප්‍රශ්න පත්‍රයෙහි අඩංගු බහුවරණ ප්‍රශ්න අතුරෙන් ප්‍රශ්න 10ක් ම ඉදිරිපත් කර තිබුණේ භාෂා කුසලතා තේමාව යටතේ ය. II පත්‍රයට හිමි මුළු ලකුණු ප්‍රමාණයෙන් 10%ක් මේ සඳහා වෙන් වන සේ තේමා අතර බර තබා ඇත. බහුවරණ ප්‍රශ්න 20 අතුරෙන් පහසු ම ප්‍රශ්නය අංක 1.5 වන අතර එය භාෂා කුසලතා තේමාවට අයත් වේ. එහි පහසුතාව 98%කි. මීළඟට මෙම තේමාවට අයත් ප්‍රශ්න අතුරෙන් අංක 1.3 සඳහා 84%ක පහසුතාවක් ද ව්‍යාකරණ තේමාවට අයත් අංක 1.12 ප්‍රශ්නය 87%ක පහසුතාවක් ද දක්වා ඇත. ඒ අනුව වඩාත් පහසු ප්‍රශ්න තුනෙන් දෙකක් ඇතුළත් ව ඇත්තේ භාෂා කුසලතා තේමාවට ය. ඒ ප්‍රශ්න දෙකෙහි ම පහසුතාව 75% ඉක්මවා ඇත. මෙම තේමාවට අයත් ප්‍රශ්න අතුරෙන් දුෂ්කර බවක් පෙන්වන්නේ අංක 1.6 හා 1.7 ප්‍රශ්න ය. ඒවායේ පහසුතාව පිළිවෙළින් 16% හා 30% වේ. භාෂා කුසලතා තේමාව යටතේ ඇති ප්‍රශ්න අතුරෙන් අංක 1.6 ප්‍රශ්නයට අපේක්ෂකයන් දී ඇති පිළිතුරු වඩාත් අසාර්ථක වී ඇත. එම ප්‍රශ්නය සඳහා නිවැරදි පිළිතුර අයත් සිවුවන වරණය තෝරා ඇති අපේක්ෂකයන්ගේ ප්‍රතිශතය 15.53%කි. අපේක්ෂකයන්ගෙන් 19.63%ක් පළමු වරණය ද, 17.53%ක් දෙවන වරණය ද, 40.70%ක් තුන්වන වරණය ද, 5.93%ක් පස්වන වරණය ද පිළිතුර ලෙස තෝරා ඇත.

අංක 1.6 යටතේ දී ඇති ප්‍රශ්නය වන්නේ 'එකිනෙකට අනුරූප වන සේ වචන යුගල යෙදී ඇති වරණය දී ඇති වරණ අතුරෙන් තෝරා ගැනීම යි''. අනුරූප වචන යුගල හඳුනා ගැනීමට අපේක්ෂකයන්ගේ දැනුම මෙහි දී ප්‍රමාණවත් වී නොමැති බව මින් අනාවරණය වේ.

භාෂාවක් අධ්‍යයනය කිරීමේ දී පොත් පත් සඟරා මෙන් ම ශාස්ත්‍රීය ලිපි ලේඛන පරිශීලනයට ගුරුවරුන් යොමු වීම සහ සිසුන්ට අවශ්‍ය මග පෙන්වීම ලබා දීම මෙහි දී වැදගත් වේ. මෙම ප්‍රශ්න දහයෙහි ම පහසුතාව සලකා මධ්‍ය පහසුතාව ගණනය කළ විට භාෂා කුසලතා තේමාවේ සමස්ත කුසලතාව 57%කි.

**ව්‍යාකරණ**


සිංහල II පත්‍රයෙහි I කොටසෙහි ව්‍යාකරණ තේමාව යටතේ ප්‍රශ්න 10ක් අඩංගු වී ඇති අතර මුළු ප්‍රශ්න පත්‍රයේ ලකුණුවලින් 10%ක් එම තේමාවට වෙන් ව තිබේ. එම ප්‍රශ්න 10 අතුරෙන් වැඩි ම පහසුතාව වන 87%ක අගයක් ලබා ගෙන ඇත්තේ අංක 1.12 ප්‍රශ්නය යි. මීට අමතර ව අංක 1.13, 1.15, 1.16, 1.17 හා 1.19 යන ප්‍රශ්න පිළිවෙළින් 61%, 67%, 56%, 48% යනාදි වශයෙන් පහසුතා අගයක් පෙන්වා ඇත. ව්‍යාකරණ තේමාව යටතේ අඩු ම පහසුතාවක් පෙන්වා ඇත්තේ 1.18 වන ප්‍රශ්නය යි. එහි පහසුතාව 22%කි. මෙම ප්‍රශ්නයේ නිවැරදි පිළිතුර අයත් වන්නේ තුන්වන වරණයට වුවත් එය තෝරා ගෙන ඇත්තේ අපේක්ෂකයන්ගෙන් 21.60%ක් වන අතර අපේක්ෂකයන්ගෙන් 12.07%ක් පළමුවන වරණය ද, 16.07%ක් දෙවන වරණය ද, 40.43%ක් හතරවන වරණය ද, 9.70%ක් පස්වන වරණය ද තෝරා ගෙන ඇත.

ව්‍යාකරණ අංග නිවැරදි ව හඳුනා ගැනීම පිළිබඳ ව අපේක්ෂකයන් හට මනා අවබෝධයක් නොමැති වීම මෙහි දී කැපී පෙනේ. මේ අතර එම ප්‍රශ්නය නිරවුල් ව හඳුනා ගත් අපේක්ෂකයන් පිරිසක් ද සිටි බව පැහැදිලි වේ. මෙම ප්‍රශ්න දහයෙහි ම පහසුතාව සලකා මධ්‍ය පහසුතාව ගණනය කළ විට ව්‍යාකරණ තේමාවේ සමස්ත පහසුතාව 48%කි.

**අවබෝධය හා විශ්ලේෂණය**


සිංහල II පත්‍රයේ I කොටසෙහි ඇතුළත් ප්‍රශ්න 20 ම අවබෝධය හා විශ්ලේෂණය පාදක කොටගෙන ඉදිරිපත් කෙරේ. අපේක්ෂකයන් නිවැරදි වරණය තෝරා ගැනීමේ දී දක්වා ඇති සියලු වරණ විශ්ලේෂණය කොට නිවැරදි වරණය පමණක් තෝරා ගැනීම සඳහා යෝග්‍ය අවබෝධයකින් යුක්ත විය යුතු ය. මේ කරුණු දෙක කෙරෙහි ම අනවධානයෙන් යුක්ත ව වැරදි වරණයක් තෝරා ගත් අවස්ථා කිහිපයක් දක්නට ඇත. අංක 1.6, 1.7, 1.14 හා 1.18 යන ප්‍රශ්න නිදසුන් වශයෙන් දැක්විය හැකි ය. අපේක්ෂකයන් විසින් භාෂා භාවිතය පිළිබඳ ව ලියැවුණු පොතපත මෙන් ම නිර්දිෂ්ට සාහිත්‍ය ග්‍රන්ථ ද මැනවින් පරිශීලනය කරනු ලැබීමේ අවශ්‍යතාව මෙහි දී පැහැදිලි වේ.

**2.2.6 II ප්‍රශ්න පත්‍රයේ I කොටසට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ (වර්ගීකරණය අනුව) :**




ඉහත වර්ගීකරණය අනුව 50%ට වැඩි පහසුතා ලබා ඇති ප්‍රශ්න අතර අක්ෂර වින්‍යාසය යටතේ ප්‍රශ්න 4න් 3ක් ද අකාරාදි පිළිවෙළ යටතේ දී ඇති එක ම ප්‍රශ්නය ද, පද බෙදීම යටතේ දී ඇති එක ම ප්‍රශ්නය ද, පද වර්ගීකරණය යටතේ දී ඇති ප්‍රශ්න නවයෙන් 4ක් ද වේ. වචන කෝෂය යටතේ දී ඇති ප්‍රශ්නවල උපරිම මට්ටම වනුයේ 50% වන අතර අවම මට්ටම 16%කි. පද වර්ගීකරණය යටතේ ඇති ඉතිරි ප්‍රශ්න 5හි උපරිමය 48%ක් වන අතර අවමය 22%ක් වේ. වාක්‍ය නිර්මාණය හා සම්බන්ධ ව ඇති එක ම ප්‍රශ්නය වන 1.19හි පහසුතා මට්ටම 48% කි.

| වර්ගීකරණය | ප්‍රශ්න සංඛ්‍යාව | පහසුතාව වැඩිම | | පහසුතාව අඩුම | |
|---|---|---|---|---|---|
| | | ප්‍රශ්නය | පහසුතාව | ප්‍රශ්නය | පහසුතාව |
| 1. අක්ෂර වින්‍යාසය | 4 | 1.5 | 98% | 1.4 | 34% |
| 2. අකාරාදි පිළිවෙළ | 1 | 1.3 | 84% | - | . |
| 3. වචන කෝෂය | 4 | 1.9 | 50% | 1.6 | 16% |
| 4. පද බෙදීම | 1 | 1.20 | 74% | - | - |
| 5. පද වර්ගීකරණය | 9 | 1.12 | 87% | 1.18 | 22% |
| 6. වාක්‍ය නිර්මාණය | 1 | 1.19 | 48% | - | - |




II ප්‍රශ්න පත්‍රයේ I කොටසේ වර්ගීකරණය අනුව පහසුතාව ඉහත ප්‍රස්තාරයෙන් නිරූපණය කෙරේ. 50 පිටුවේ පහසුතා වර්ගීකරණ ප්‍රස්තාරයට අනුව අක්ෂර වින්‍යාසය යටතේ 1.5 ප්‍රශ්නය සඳහා වැඩි ම පහසුතාවක් ලබා ගෙන ඇත. එය 98%ක් වේ. ඊළඟට වැඩි ම පහසුතාව 87%ක් ලබා ගෙන ඇත්තේ පද වර්ගීකරණය යටතේ ඇති 1.12 ප්‍රශ්නයට ය. සමස්ත පහසුතාව සැලකූ විට අක්ෂර වින්‍යාසය යටතේ දී තිබූ ප්‍රශ්න 4 සඳහා පහසුතාව වනුයේ 68%කි. අඩු ම පහසුතාව ලබා ඇත්තේ වචන කෝෂය යටතේ අසා ඇති ප්‍රශ්න 4ට ය. එහි සමස්ත පහසුතාව 36%කි.

**2.2.7 II ප්‍රශ්න පත්‍රයේ II කොටස හා අපේක්ෂිත පිළිතුරු, ලකුණු දීමේ පටිපාටිය, පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ, නිගමන හා යෝජනා :-**

## II කොටස

02 **ප්‍රශ්නය**

**2.** (අ) පහත සඳහන් පාඨය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

මිනිස් ශ්‍රමශක්තිය දියුණු කිරීම සහ උපයෝජනය පිළිබඳ සියලු ම මූලික ක්‍රියාවලීන්හි පදනම වනුයේ අධ්‍යාපනය යි. අධ්‍යාපනය මිනිස් ශ්‍රමශක්ති ඉල්ලුමෙහි සහ සැපයුමෙහි වර්ධනයට ඉවහල් වන ක්‍රම විවිධ මෙන් ම සංකීර්ණ ය. පුහුණු කළ හැකි නව මිනිස් ශ්‍රමය ආර්ථික හා සමාජ සංවර්ධනය උදෙසා පුහුණු කිරීමෙහි ලා අධ්‍යාපනය සතුව ඇත්තේ සෘජු කාර්යයකි. එමගින් මිනිස් ශ්‍රමශක්තිය මෙහෙයවීමෙහි සහ පතුරුවාලීමෙහි මෙන් ම නිපුණතාවන් ලබා ගැනීමෙහි ලා වූ මූලික පෙලඹීම් සාධක ක්‍රියාත්මක කෙරේ. අන් සෑම කරුණකට ම වඩා එමගින් මිනිස් විචල්‍යයන් ක්‍රියාත්මක ව සංස්කෘතික සහ සමාජ සැකැස්ම සැපයේ.

පොදු අධ්‍යාපන ක්‍රමයක් සතු කාර්යය ඒ ඒ පුද්ගලයන් විශේෂිත රැකියා අවශ්‍යතාවන් සඳහා යොදා ගත හැකි මෙන් ම 'පුහුණු කළ හැකි' බවට පත් කරන මූලික අධ්‍යාපනික පසුබිමක් ඔවුනට ලබා දීම යි. ප්‍රාථමික අධ්‍යාපන තත්ත්වයේ දී පිළිබිඹු වන මෙම ප්‍රවීණතාව චූකලී අකුරු ඇනීමෙහි වැඩි දියුණුව සඳහා වූ වෙනස පිළිබඳ අවබෝධයෙහි ප්‍රතිඵලය යි. ඇතැම් පර්යේෂකයන් විසින් මූලික අධ්‍යාපන මට්ටම් සහ ආර්ථික සංවර්ධන දර්ශකයන් අතර නියත අන්‍යෝන්‍ය සම්බන්ධතාවක් ඇති බව පෙන්වා දී තිබේ. ද්විතීයික මට්ටමේ දී අධ්‍යාපනය, ලිපිකාර සහ අලෙවි කටයුතුවල නියුක්තවූවන් සහ ගුරුවරුන් යනාදි විශාල පුද්ගල සංඛ්‍යාවක් ඇතුළු පුහුණු කළ හැකි නා නා මාදිළියේ ශ්‍රමිකයන් බිහි කිරීමට ඉවහල් වනු පමණක් නොව, එහි අන්තර්ගත වෘත්තීය සහ විවිධීකෘත අංශ මගින්, නොයෙක් ශිල්පීන්ටත් පහළ ශ්‍රේණිවල පරිපාලකයන්ටත් අවශ්‍ය මූලික දැනුම ලබා දෙයි. පැහැදිලි වශයෙන් ම මධ්‍ය සහ ඉහළ අධ්‍යාපන මට්ටම්වල දී කාර්මික සහ වෘත්තීය අධ්‍යාපනය සතු මිනිස් ශ්‍රමශක්ති සම්පාදන කාර්යය වනුයේ ආර්ථික ක්‍රමයේ සංවර්ධනයට අත්‍යවශ්‍ය වන විද්‍යාඥයන්, ඉංජිනේරුවන්, වෛද්‍යවරුන්, කාර්මික විද්‍යාඥයන් සහ පර්යේෂකයන් බිහි කිරීම යි. උසස් අධ්‍යාපනයෙහි ප්‍රතිඵලයක් වශයෙන් රටෙහි ප්‍රභූ පිරිස එනම් නානාවිධ කාර්ය ක්ෂේත්‍රයන්හි නියුක්ත නායක සහ උසස් පරිපාලක සංඛ්‍යාව වැඩි වේ. මෙපරිද්දෙන්, සෑම මට්ටමක දී ම, අධ්‍යාපනික අවස්ථා, සමාජ සහ ආර්ථික සංවර්ධන අවශ්‍යතාවට සීමා නොකොට ම ඒ හා සම්බන්ධ කර ලීම වැදගත් බව පැහැදිලි ය.

(i) අධ්‍යාපනය සතුව ඇති සෘජු කාර්යභාරයක් වශයෙන් මෙහි දැක්වෙන්නේ කුමක් ද?

(ii) මූලික අධ්‍යාපන පසුබිම යනුවෙන් මේ ලේඛකයා හඳුන්වන්නේ කුමක් ද?

(iii) ඇතැම් පර්යේෂකයන් විසින් දක්වනු ලැබ ඇති ආකාරයට අධ්‍යාපන මට්ටම් සහ ආර්ථික සංවර්ධන දර්ශකයන් අතර පවතින්නේ කෙබඳු සබඳතාවක් ද?

(iv) මධ්‍ය හා ඉහළ අධ්‍යාපන මට්ටම්වල දී කාර්මික සහ වෘත්තීය අධ්‍යාපනය සතු මිනිස් ශ්‍රමශක්ති සම්පාදන කාර්යය කුමක් ද?

(v) උසස් අධ්‍යාපනයේ ප්‍රතිඵලයක් ලෙස ලේඛකයා දක්වන්නේ කුමක් ද? (ලකුණු 10 යි.)

(i) පුහුණු කළ හැකි නව මිනිස් ශ්‍රමය ආර්ථික හා සමාජ සංවර්ධනය උදෙසා පුහුණු කිරීම

(ii) ඒ ඒ පුද්ගලයන් විශේෂිත රැකියා අවශ්‍යතාවන් සඳහා යොදා ගත හැකි මෙන් ම පුහුණු කළ හැකි බවට පත් කිරීම

(iii) නියත අන්‍යෝන්‍ය සබඳතාවක්

(iv) ආර්ථික ක්‍රමයේ සංවර්ධනයට අත්‍යවශ්‍ය වන විද්‍යාඥයන්, ඉංජිනේරුවන්, වෛද්‍යවරුන්, කාර්මික විද්‍යාඥයන් සහ පර්යේෂකයන් බිහි කිරීම

(v) රටේ ප්‍රභූ පිරිස එනම් නානාවිධ කාර්ය ක්ෂේත්‍රයන්හි නියුක්ත නායක සහ උසස් පරිපාලක සංඛ්‍යාව වැඩිවීම

**(ලකුණු 10යි)**

(ආ) පහත දැක්වෙන උද්ධෘතය කියවා, එහි වචන සංඛ්‍යාව **තුනෙන් එකක් පමණ වන සේ** සාරාංශ කොට ලියා, සාරාංශය අග, වචන සංඛ්‍යාව ද සඳහන් කරන්න.

අද බලවත් ම සමාජ ආයාචනය බවට පත්ව ඇත්තේ සමාජීය හා පාරිසරික මිනිසකු තැනීම හෙවත් තිරසර සංවර්ධනය සඳහා මානවයා සූදානම් කිරීම බව පැවසේ. එක්සත් ජාතීන් විසින් දස වසරින් දස වසර ලෝක සංවර්ධනයට තේමාවක් ලබා දෙන ලදි. එක්සත් ජාතීන්ගේ සංවර්ධන දශකවලින් විස්තර වන පරිදි 90 දශකයේ ලෝක සංවර්ධන උපාය මාර්ගවල එක් ප්‍රධාන ක්‍රමෝපායක් වූයේ තිරසර සංවර්ධනය කරා යන ගමන සඳහා ලෝක ජනතාව සූදානම් කිරීමේ කාර්යභාරය ඒ ඒ රටවලට පවරමින් තම සහාය ද ප්‍රදානය කිරීම යි.

සංවර්ධනය, මානව හා පරිසර කේන්ද්‍රීය ම වෙයි. ඒ අනුව මානව සුබසාධනය ද පරිසර සුබසාධනය (සංරක්ෂණය) ද වැදගති. එයින් පෙනෙන්නේ පරිසරය සුරක්ෂණය කිරීම අවසාන වශයෙන් මානවයාගේ පැවැත්ම සනාථ කරන බව යි. ඒ අනුව සංවර්ධනයේ පරම අරමුණ මිනිසාගේ සුබසාධනය නම් 'පරම සම්පත' ද මිනිසා ම වනු නියති. එහි අනෙක් අන්තය නම් මිනිස් සම්පත සතු පරම සම්පත පරිසරය බව යි.

පාරිසරික වශයෙන් තිරසර වූත්, ආර්ථික වශයෙන් පවත්වා ගෙන යා හැකි වූත් සමාජීය වශයෙන් සර්ව සාධාරණ වූත් සංවර්ධනයක් ලබා ගත හැක්කේ මිනිසා තුළින් ම නම් මිනිසා තැනීම හැර අන් කාර්යයක් ලෝක ජනතාවට නැත. ජගත් සංවිධානවලට නැත. සැබවින් ම ඒ කවරකට වුව එම අදහසින් මිදිය හැකි ද නොහේ.

මානව සම්පත් සංවර්ධනය යනු විසින් අර්ථ ප්‍රමාණික කරනු ලබන්නේ පාරිසරික, ආර්ථික, සාමාජික හා දේශපාලනික වශයෙන් ඇති වන අභියෝගවලට සාර්ථක ව මුහුණ දිය හැකි ලෝක ජනතාවක්, ලෝක ජන සමාජයක් බිහි කිරීම යි. (ලකුණු 15 යි.)

- සමාජීය හා පාරිසරික මිනිසකු තැනීම හෙවත් තිරසර සංවර්ධනය සඳහා මානවයා සූදානම් කිරීමේ අවශ්‍යතාව
- 90 දශකයේ දී එක්සත් ජාතීන්ගේ සංවර්ධන උපාය මාර්ගවල තිරසර සංවර්ධනය අත්පත් කර ගැනීමේ දී ලෝක ජනතාව සූදානම් කරවීමේ කාර්යභාරය ඒ ඒ රටවලට පැවරීම
- සංවර්ධනය, මානව හා පරිසර කේන්ද්‍රීය වන හෙයින් මානව සුබසාධනය හා පරිසර සුබසාධනය ද එක සේ වැදගත් වීම
- පරිසර සංරක්ෂණය මගින් මානව පැවැත්ම සනාථ වීම
- පාරිසරික, ආර්ථික හා සමාජීය වශයෙන් සර්වසාධාරණ වූ සංවර්ධනයක් ලබා ගත හැකි වන්නේ මිනිසා තුළින් ම නම් මිනිසා තැනීම හැර අන් කාර්යයක් ලෝක ප්‍රජාවට හා ජගත් සංවිධානවලට නැති බව අවබෝධ කර ගැනීම
- පාරිසරික, ආර්ථික, සාමාජික හා දේශපාලනික අභියෝගවලට මුහුණ දිය හැකි ලෝක ජන සමාජයක් බිහි කිරීම මානව සම්පත් සංවර්ධනය නම් වීම


ඉහත කරුණු ඇතුළත් ව ලේඛන ව්‍යවහාරයෙන් සාරාංශය ලියා තිබිය යුතු ය. සාරාංශය එක් ඡේදයක් ලෙස දක්වා තිබිය යුතු අතර ඡේදවලට බෙදා ඇත්නම් සමස්තයෙන් ලකුණු 02ක් අඩු වේ. වචන සංඛ්‍යාව 65 - 75 අතර තිබිය යුතු ය. එම ප්‍රමාණය අඩු හෝ වැඩි වේ නම් ලකුණු 3ක් අඩු වේ.

**සාරාංශයේ නියමිත වචන ප්‍රමාණයට - ලකුණු 03යි**

**අක්ෂර වින්‍යාසයට - ලකුණු 04යි**

**අන්තර්ගතයට - ලකුණු 08යි**


**2 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :**




මෙය අනිවාර්ය ප්‍රශ්නයක් වන අතර ඒ සඳහා පිළිතුරු සපයා ඇති ප්‍රතිශතය 97%කි. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 25ක් හිමි වේ.

ඉන් ලකුණු 00 - 06 ප්‍රාන්තරයේ 1%ක් ද
ලකුණු 07 - 12 ප්‍රාන්තරයේ 6%ක් ද
ලකුණු 13 - 18 ප්‍රාන්තරයේ 36%ක් ද
ලකුණු 19 - 25 ප්‍රාන්තරයේ 57%ක් ද

ලෙස ලකුණු ලබා ගෙන ඇත. මෙම ප්‍රශ්නයට ලකුණු 18ට වඩා ලබා ගත් අපේක්ෂකයන් 57%ක් වන අතර 7%ක් ලබා ගෙන ඇත්තේ ලකුණු 13ට අඩුවෙනි. 93%ක අපේක්ෂකයන් සංඛ්‍යාවකට 13 - 25 ප්‍රාන්තරයේ ලකුණු ලබා ගැනීමට හැකි වී ඇත.




මෙම ප්‍රශ්නයේ (අ), iv අනුකොටසෙහි උපරිම පහසුතාව 98%ක් වන අතර අවමය 76%කි. (ආ) කොටසෙහි පහසුතාව 66%කි.

**පිළිතුරු පිළිබඳ නිරීක්ෂණ**

කොටස් දෙකකින් සමන්විත මෙම ප්‍රශ්නයේ පළමු කොටසෙන් දී ඇති පාඨය ඇසුරෙන් ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සැපයීම අපේක්ෂා කරන අතර දෙවන කොටසෙන් කිසියම් පාඨයක් දී එය තුනෙන් එකක් වන සේ සාරාංශ කොට ලිවීම අපේක්ෂා කෙරේ.

මෙයින් (අ) කොටසේ, අපේක්ෂකයන්ගේ සාධන මට්ටම ඉහළ අගයක් ගෙන තිබූ අතර, ඊට සාපේක්ෂ ව (ආ) කොටසේ සාධන මට්ටම අඩු වී තිබිණි.

දී ඇති පාඨය පහසුවෙන් අවබෝධ කර ගෙන අසා ඇති ප්‍රශ්නවලට සාර්ථක ව පිළිතුරු සැපයීමට අපේක්ෂකයන්ට පහසු වී තිබිණි. එනිසා ම එම කොටස් පහේ ම පහසුතා මට්ටම 75% ඉක්මවා තිබිණි. එහෙත් (අ) කොටසේ (ii) (iii) අනුකොටස්වලට පිළිතුරු සැපයීම, ඉතිරි අනුකොටස් 3ට පිළිතුරු සැපයීම තරම් සාර්ථක නො වූ බව පෙනේ. ඊට හේතුව ලෙස පෙනෙන්නේ නිශ්චිත ව ඉදිරිපත් කෙරෙන ප්‍රශ්නයකට ඍජු පිළිතුරු සැපයීමට අපේක්ෂකයන් කුසලතාවක් දැක්වුව ද ප්‍රශ්නයක් විශ්ලේෂණය කරමින් පිළිතුරු ලිවීමේ දී ඔවුන් දුර්වලතාවක් පෙන්නුම් කරන බව යි.

දෙවන ප්‍රශ්නයේ (ආ) කොටසෙහි පහසුතා මට්ටම 66%ක් විය. මෙය සාරාංශකරණයට අදාළ ප්‍රශ්නයක් වන බැවින් (අ) කොටසට සමාන්තර ව මෙහි අඩු පහසුතාවක් පිළිබිඹු කරයි. මීට හේතු වී ඇත්තේ කරුණු සම්පිණ්ඩනය කර ප්‍රකාශ කිරීමේ දුර්වලතා, අක්ෂර වින්‍යාසය හා විරාම ලක්ෂණ භාවිතයේ අනවබෝධතා හා උක්තාඛ්‍යාත සම්බන්ධ රීති පිළිබඳ අපේක්ෂකයන්ගේ අල්ප අවබෝධය මෙන් ම නියමිත වචන ප්‍රමාණය අඩුවීම හා ඉක්මවීම ආදිය යි.

**නිගමන හා යෝජනා**

පාඨයක් ඇසුරෙන් පිළිතුරු සැපයීමේ දී නිශ්චිත පිළිතුරු ඉදිරිපත් කිරීමට මෙන් ම ප්‍රශ්න විශ්ලේෂණය කරමින් කරුණු දැක්වීමට අපේක්ෂකයන් තුළ ප්‍රාගුණ්‍යයක් ඇති කළ යුතු ය. එසේ ම පාඨයෙහි සම්පිණ්ඩනාර්ථයට හානි නො වන පරිදි වචන සංශ්ලේෂණය කර දැක්වීමටත්, භාෂා රීති අනුල්ලංඝනය කිරීමටත් අපේක්ෂකයන් වග බලා ගත යුතු ය.
සාරංශ ලිවීම සඳහා අනුගමනය කළ යුතු ක්‍රමවේද පිළිබඳ ව ශිෂ්‍යයන් දැනුවත් කිරීම අවශ්‍ය වේ.සාරංශකරණය සඳහා සුදුසු උද්ධෘත හඳුනා ගෙන ඒවා සාරංශකරණය කිරීමේ සතතාභ්‍යාසයෙහි යෙදීමට උනන්දු කළ යුතු අතර එහි දී පහත සඳහන් කරුණු කෙරෙහි අවධානය යොමු කිරීමේ අවශ්‍යතාව අවධාරණය කළ යුතු ය.

- ප්‍රධාන අදහස තමාට ග්‍රහණය වන තුරු ඡේදය කීප වතාවක් කියවීම
- ප්‍රධාන කරුණු කෙරෙහි අවධානය යොමු වන සේ සලකුණු යොදා ගැනීම
- ප්‍රධාන අදහස් පහක්වත් සාරංශයෙහි අන්තර්ගත කිරීම
- ප්‍රධාන අදහස් කෙටි වැකිවලින් ලිවීමට හුරු කිරීම
- දී ඇති ඡේදයේ වචන සංඛ්‍යාවෙන් 1/3 වන සේ සාරාංශ ගොනු කිරීම
- ව්‍යාකරණ දෝෂවලින් තොර ව වැකි ලිවීමට හුරු කිරීම
- අත් අකුරු, විරාම ලක්ෂණ කෙරෙහි සැලකිලිමත්වීම
- වර්ණනා, අර්ථකථන, ප්‍රකාශන, උපුටා ගැනීම්, උපමා ඇදිය ඉවත් කිරීම
- හැකි සෑම අවස්ථාවක ම වචන සන්ධි කිරීම හා සමාස කිරීම
- සාරාශ ලිවීමේ දී හැකිතාක් තමන්ගේ ම වචන භාවිතා කිරීම
- ප්‍රශ්නය ඡේද කිහිපයකින් දී ඇතත් පිළිතුර එක් ඡේදයක් ලෙස ගොඩ නැගීම

**අපේක්ෂකයන්ගේ සාධන මට්ටම් අවබෝධ කර ගැනීම සඳහා සාරාංශය ඇමුණුම 7 හා සාරාංශය ඇමුණුම 8 බලන්න.**

**03 ප්‍රශ්නය**

**3.** දී ඇති මාතෘකාවලින් **එකකට** අදාළ ව වචන **300 - 350** අතර වන සේ විශ්ලේෂණාත්මක රචනාවක් ව්‍යාකරණානුකූල ව ලියන්න.

(i) ශ්‍රී ලංකාවේ විදේශ ආයෝජන දිරිමත් කිරීම සඳහා ගත හැකි ක්‍රියාමාර්ග

(ii) ලෝක බලවතුන්ගේ මූල්‍ය අර්බුදය නිසා ගෝලීය ප්‍රජාව මුහුණ පාන අභියෝග

(iii) රුපියල අවප්‍රමාණය වීම මගින් මෙරට ආර්ථිකය කෙරෙහි ඇති වන බලපෑම

(iv) රටක සංහිඳියාව උදෙසා සංස්කෘතික උත්සව මගින් ලැබෙන දායකත්වය

(v) ප්‍රමාණාත්මක භාවයෙන් මෙන් ම ගුණාත්මක භාවයෙන් ද අධ්‍යාපනය අනූන විය යුතු ය.

(vi) සිංහල සිනමාව ජාත්‍යන්තර තලයට ගෙන ඒමේ අවශ්‍යතාව (ලකුණු 25 යි.)

**වචන සංඛ්‍යාව 300-350 අතර වේ නම් ඉහළ ලකුණු ප්‍රදානය කළ හැකි ය. වචන 400ට වැඩි වේ නම් හෝ 250ට අඩු වේ නම් ලකුණු 03ක් අඩු කළ යුතු වේ.**

(i) රචනය සඳහා තෝරා ගත් මාතෘකාව යටතේ ප්‍රමාණවත් ලෙස කරුණු ඒකාරාශීකරණය

(ii) එම කරුණු සංවිධානාත්මක ව ඉදිරිපත් කිරීම

(iii) කරුණුවල පැහැදිලි බව

(iv) නිරවද්‍ය අක්ෂර වින්‍යාසය අනුගමනය කර තිබීම

(v) ව්‍යාකරණ දෝෂ රහිත වීම

(vi) භාෂාව ව්‍යක්ත ලෙස හැසිරවීම


(vii) සුදුසු ලෙස ඡේද වෙන් කිරීම

(viii) කියවිය හැකි සේ අත් අකුරු පැහැදිලි වීම

(ix) විවිධ භාෂාත්මක ප්‍රයෝග භාවිතය (මෙහි දී උපමා, රූපක, ආප්තෝපදේශ, ප්‍රස්තාව පිරුළු වැනි අංග ගැන සැලකිල්ල යොමු කරන්න. එහෙත් ඒ වෙනුවෙන් වෙන වෙන ම ලකුණු දීම අනවශ්‍ය ය. සමස්තයක් වශයෙන් රචනාවෙහි මෙකී අංග සලකා ලකුණු ප්‍රදානය කළ හැකි ය.) **(ලකුණු 25යි)**

**3 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ. නිගමන හා යෝජනා :**


**3 ප්‍රශ්නය සඳහා ලකුණු ලබා ඇති ආකාරය**





මෙය අනිවාර්ය ප්‍රශ්නයක් වන අතර ඒ සඳහා පිළිතුරු සපයා ඇති ප්‍රතිශතය 96%කි. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 25ක් හිමි වේ.

ඉන් ලකුණු 00 - 06 ප්‍රාන්තරයේ 4%ක් ද
ලකුණු 07 - 12 ප්‍රාන්තරයේ 24%ක් ද
ලකුණු 13 - 18 ප්‍රාන්තරයේ 62%ක් ද
ලකුණු 19 - 25 ප්‍රාන්තරයේ 10%ක් ද

ලෙස ලකුණු ලබා ගෙන ඇත. මෙම ප්‍රශ්නයට ලකුණු 18ට වඩා ලබා ගත් පිරිස 10%ක් වන අතර 28%ක් ලබා ගෙන ඇත්තේ ලකුණු 13ට අඩුවෙනි.




මෙම ප්‍රශ්නයට පිළිතුරු සැපයූ අපේක්ෂකයන්ගෙන් 31%ක් වූ වැඩිම ප්‍රතිශතයක් "රටක සංහිඳියාව උදෙසා සංස්කෘතික උත්සව මගින් ලැබෙන දායකත්වය" රචනය තෝරා ගෙන ඇති අතර 7%ක් වූ අඩුම ප්‍රතිශතයක් (ii) මාතෘකාව වූ "ලෝක බලවතුන්ගේ මූල්‍ය අර්බුදය නිසා ගෝලීය ප්‍රජාව මුහුණ පාන අභියෝග" රචනය ද තෝරා ගෙන ඇත.




මෙම ප්‍රශ්නයට අනුව දී ඇති රචනා මාතෘකා හයෙන් එකක් තෝරා ගෙන රචනයක් ලිවිය යුතු ව තිබුණු අතර, එයින් (ii) රචනා මාතෘකාව සඳහා 7%ක අඩුම සාධන මට්ටමක් පෙන්නුම් කර ඇත. එයින් (iv) රචනා මාතෘකාව සඳහා 51%ක උපරිම සාධන මට්ටමක් පෙන්වා ඇත.

**පිළිතුරු පිළිබඳ නිරීක්ෂණ**

අපේක්ෂකයන්ගේ සාධන මට්ටම ඉහළ අගයක් ගෙන ඇත්තේ (iv) රචනා මාතෘකාව යි. එහි පහසුතාව 51%කි. සෙසු මාතෘකා සම්බන්ධයෙන් විභාග අපේක්ෂකයන්ගේ පහසුතාව මධ්‍යස්ථ මට්ටමක පවතින ආකාරය නිරූපණය වෙයි. ඒ අතර (i) හා (v) යන මාතෘකාවල පහසුතාව පිළිවෙළින් 35%ක් හා 47%ක් ද, (ii), (iii) හා (vi)හි පහසුතා පිළිවෙළින් 7%ක්, 24%ක් හා 29%ක් ද වේ. මේ අනුව අඩු පහසුතා මට්ටමක් ප්‍රදර්ශනය වන්නේ (ii) (iii) හා (vi) යන අංක දරන රචනා මාතෘකාවල ය. එම මාතෘකා අතුරෙන් (ii) රචනා මාතෘකා සඳහා ඉතාමත් අඩු සාධන මට්ටමක් පෙන්නුම් කර ඇත. මෙයින් පෙනී යන්නේ ලෝක බලවතුන්ගේ මූල්‍ය අර්බුදය නිසා ගෝලීය ප්‍රජාව මුහුණ පාන අභියෝග පිළිබඳ ව හා රුපියල අවප්‍රමාණ වීම මගින් මෙරට ආර්ථිකය කෙරෙහි ඇතිවන බලපෑම් පිළිබඳ ව විභාග අපේක්ෂකයන් තුළ එතරම් අවබෝධයක් නොමැති බව යි.

**නිගමන හා යෝජනා**

මෙම රචනා මාතෘකා ජාත්‍යන්තර තලයෙහි සිදු වන වෙනස්වීම් පාදක කර ගෙන ඇති වන විවිධ ගැටලු පිළිබඳ ව සහ නූතන සමාජ තත්ත්ව පාදක කර ගත් එහි විවිධ පැතිකඩ නිරූපණය කරන ඒවා වේ. නමුත් සමාජයේ සුලභ ව දක්නට ලැබෙන ඇතැම් අංශ පිළිබඳ ව අවධානය මඳ වීමක් රචනා මාතෘකාවල පහසුතා දෙස බැලීමේ දී පෙනී යයි. මේ තත්ත්වය මග හරවා ගැනීමට කාලීන මාතෘකා ඔස්සේ වැඩි වශයෙන් රචනා ලිවීමටත් සඟරා හා ප්‍රවෘත්ති පත්‍ර කියවීමටත් විද්‍යුත් මාධ්‍ය ප්‍රවෘත්තිවලට සවන් දීමටත් අපේක්ෂකයන් යොමු කරවීම සුදුසු ය. ප්‍රකාශන ශක්තියේ දුර්වලතා මග හරවා ගැනීමට විවිධ මාතෘකා ඔස්සේ ලියවී ඇති ගද්‍ය රචනා කියවීමට යොමු කිරීම ද සුදුසු ය. රචනා ලිවීම සඳහා තොරතුරු සපයා ගැනීමට සුදුසු සම්පත් ශිෂ්‍යයන්ට හඳුන්වා දීම අවශ්‍ය ය. පොත් පත් , සඟරා, පුවත්පත්, ගුවන් විදුලි, රූපවාහිනී, ප්‍රවෘත්ති, සාකච්ඡා මෙන් ම අන්තර්ජාලය මගින් ද තොරතුරු ගවේෂණයට මග පෙන්වීම අවශ්‍ය ය. ස්වකීය ලේඛන ශෛලියක් ගොඩ නගා ගැනීම සඳහා පොතපත කියවීමේ පරිචයක් ඇතිකර ගත යුතු බව ශිෂ්‍යයන්ට පෙන්වා දීම සුදුසු ය. රචනා ලිවීමේ දී නිවැරදි ව්‍යාකරණය, අක්ෂර වින්‍යාසය, පද බෙදීම ආදී ශිල්පීය ප්‍රයෝග නිවැරදි ව භාවිතා කිරීමට යොමු කළ යුතු ව ඇත. නිර්මාණාත්මක රචනා තුළ භාෂාමය කුසලතා ප්‍රදර්ශනය විය යුතු බැවින් ශිෂ්‍යයන් මෙතෙක් ඉගෙන ගෙන ඇති යුගල පද, ආප්තෝපදේශ, ප්‍රස්තාව පිරුළු, ඉඟි වැකි ආදිය උචිත පරිදි භාවිතා කරමින් රචනා ලිවීමට හුරු කළ යුතු ය. සංවිධානාත්මක ව රචනා ලිවීම සඳහා සැකිල්ලකට අනුව ලිවීමේ හුරුව ලබා දීම අවශ්‍ය ය.

- **අපේක්ෂකයන්ගේ සාධන මට්ටම් අවබෝධ කර ගැනීම සඳහා රචනය ඇමුණුම 9 හා රචනය ඇමුණුම 10 බලන්න.**

**4.** (අ) පහත සඳහන් වාක්‍යවල **සදොස් තැන් ඇතොත් නිදොස් කොට** ලියන්න.

(i) සිරකරුවන් මනුෂ්‍යයෝ වෙති.

(ii) රජය විසින් නාවික හමුදාවට නවක සෙබළුන් බඳවා ගැනෙති.

(iii) මහනාහිමියන් කුලපති ධූරයෙන් පිදුම් ලැබූහ.

(iv) මැන්ඩිස් ගුණසේකර මුදලිතුමාණෝ භාෂා පරිවර්තකයකු මෙන් ම සාහිත්‍යධරයෙක් ද වූහ.

(v) ප්‍රවීණ ලේඛකයකු වූ ඇරැව්වල නන්දිමිත්‍රයන් නොබෝදා දැයෙන් සමු ගත්හ. (ලකුණු 05 යි.)

(i) සිරකරුවෝ මනුෂ්‍යයෝ වෙති.

(ii) රජය විසින් නාවික හමුදාවට සෙබළු බඳවා ගැනෙති.

(iii) මහනාහිමියෝ කුලපති ධූරයෙන් පිදුම් ලැබූහ.

(iv) නිවැරදි වැකියකි.

(v) ප්‍රවීණ ලේඛකයකු වූ ඇරැව්වල නන්දිමිත්‍රයෝ නොබෝදා දැයෙන් සමු ගත්හ. **(ලකුණු 05යි)**

(ආ) පහත සඳහන් වාක්‍ය **කර්මකාරකයට** හරවන්න.

(i) ඇමතිතුමා සාහිත්‍යධරයන් අගය කරයි.

(ii) පක්ෂ ලේකම්වරු නගරසභාවලට අපේක්ෂකයන් නම් කළහ.

(iii) ආරක්ෂක භටයෝ නගරයේ දී අප පරීක්ෂා කළහ.

(iv) මහජන සෞඛ්‍ය පරීක්ෂකවරු අපිරිසිදු ආපණශාලා හිමිකරුවන් අධිකරණයට ඉදිරිපත් කරති.

(v) විභාගය උසස් ලෙස සමත් වීමෙන් පසු ගුරුවරු මා පැසසූහ. (ලකුණු 05 යි.)

(i) ඇමතිතුමා විසින් සාහිත්‍යධරයෝ අගය කෙරෙති/කෙරෙත්/ කරනු ලබත්/ලැබෙත්/ලබති/ලැබෙති.

(ii) පක්ෂ ලේකම්වරුන් විසින් නගරසභාවලට අපේක්ෂකයෝ නම් කෙරුණු/ කෙරුණහ/කෙරුණාහ/ කරන ලදහ/ කරන ලද්දෝ ය/ කරනු ලැබූහ/ කරනු ලැබුවෝ ය.

(iii) ආරක්ෂක භටයන් විසින් නගරයේ දී අපි පරීක්ෂා කෙරුණුමු/ කරන ලදුමු/කරන ලද්දෙමු/කරනු ලැබූමු/ ලැබුණෙමු/ ලැබුවෙමු.

(iv) මහජන සෞඛ්‍ය පරීක්ෂවරුන් විසින් අපිරිසිදු ආපණශාලා හිමිකරුවෝ අධිකරණයට ඉදිරිපත් කෙරෙති/ කෙරෙත්/ කරනු ලබත්/ ලැබෙත්/ ලබති/ ලැබෙති.

(v) විභාගය උසස් ලෙස සමත් වීමෙන් පසු ගුරුවරුන් විසින් මම පැසසුණෙමි/ පැසසිණිමි/ පසසන ලදිමි/ පසසන ලද්දෙමි/ පසසනු ලැබුවෙමි/ ලැබුණෙමි/ලැබීමි. **(ලකුණු 05යි)**

(i) රීතීන්

(ii) කැඳවයි


(iii) දරුවෝ

(iv) කරන ලදි

(v) කිඹුලන් **(ලකුණු 05යි)**

**4 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :**

**4 ප්‍රශ්නය සඳහා ලකුණු ලබා ඇති ආකාරය**





මෙම ප්‍රශ්නය තෝරා ගෙන ඇති ප්‍රතිශතය 73%කි. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 15ක් හිමි වේ.

ඉන් ලකුණු 00 - 03 ප්‍රාන්තරයේ 5%ක් ද
ලකුණු 04 - 07 ප්‍රාන්තරයේ 24%ක් ද
ලකුණු 08 - 11 ප්‍රාන්තරයේ 33%ක් ද
ලකුණු 12 - 15 ප්‍රාන්තරයේ 38%ක් ද


ලෙස ලකුණු ලබා ගෙන ඇත. මෙම ප්‍රශ්නයට ලකුණු 11ට වඩා ලබා ගත් අපේක්ෂකයන් 38%ක් වන අතර 29%ක් ම ලබා ගෙන ඇත්තේ ලකුණු 8ට අඩුවෙනි.

**4 ප්‍රශ්නයේ කොටස්වල හා අනුකොටස් පහසුතාව**




**4 ප්‍රශ්නයෙහි කොටස් හා අනුකොටස්**

**4 ප්‍රශ්නයේ කොටස්වල පහසුතාව**




**4 ප්‍රශ්නයෙහි කොටස්**

★ මෙම කොටස් 3 අතුරෙන් (අ), (ආ), (ඉ) උපරිම පහසුතාව දක්වා ඇත්තේ (ඉ) කොටසේ (iv) වන කොටසට වන අතර, අවම පහසුතාව දක්වා ඇත්තේ (අ) කොටසේ (iv) වන කොටසට වේ. (අ), (ආ), (ඉ) යන කොටස් තුන අතුරෙන් උපරිම පහසුතාව දක්වා ඇත්තේ (ඉ) කොටසට වන අතර එහි සමස්ත පහසුතා මට්ටම 77%කි. අවම පහසුතාව දක්වා ඇත්තේ (අ) කොටසට වන අතර එහි සමස්ත පහසුතා මට්ටම 57%කි. (ආ) කොටසේ සමස්ත පහසුතා මට්ටම 66%කි.

**පිළිතුරු පිළිබඳ නිරීක්ෂණ**

කොටස් තුනකින් සමන්විත මෙම ප්‍රශ්නය උක්ත ආඛ්‍යාත සම්බන්ධ වාක්‍ය රීති හා කර්තෘකාරක වාක්‍ය, කර්මකාරකයට පරිවර්තනය කිරීමේ හැකියාව මැන බැලෙන්නකි. එහි (අ) කොටසෙන් දී ඇති වාක්‍යවල සදොස් තැන් ඇතොත් නිදොස් කිරීමත්, (ආ) කොටසෙන් කර්තෘකාරක වාක්‍ය කර්ම කාරකයට හැරවීමත්, (ඉ) කොටසෙන් නිවැරදි වාක්‍යයක් නිර්මාණය කිරීම සඳහා සුදුසු පදය වරහන් තුළින් තෝරා ලිවීමත් අපේක්ෂා කෙරේ.

අපේක්ෂකයන් පිළිතුරු සැපයීමේ දී (ඉ), (ආ), (අ) කොටස් සඳහා පිළිවෙළින් 77%ක්, 66%ක් හා 57%ක් වශයෙන් පහසුතා මට්ටම් දක්වා ඇත. මෙයින් පැහැදිලි වන්නේ වරහන් තුළින් වචන තෝරා වාක්‍යයක් නිවැරදි ව ලිවීමට අපේක්ෂකයන් වැඩි කුසලතාවක් දක්වා ඇති බව යි. ඊට සාපේක්ෂ ව වාක්‍ය කර්මකාරකයට හැරවීම හා සදොස් තැන් නිදොස් කිරීමට දක්වන්නේ අඩු සාධන මට්ටමකි.

**නිගමන හා යෝජනා**

සිංහල ව්‍යාකරණයේ ලේඛන රීතිය සම්බන්ධ වැදගත් ම අංගය වන වාක්‍ය රටා නිර්මාණය කිරීමේ දී එහි ඇති සරල මෙන් ම සංකීර්ණ වාක්‍ය රීති පිළිබඳ අපේක්ෂකයන් මනා ව දැනුවත් කිරීම වැදගත් ය. එසේ ම කර්මකාරක වාක්‍ය රටා රීතිය ද අපේක්ෂකයන්ට නිවැරදි ව අවබෝධ කර දීම කෙරෙහි සැලකිලිමත් විය යුතු ය. තව ද ශාස්ත්‍රීය ලිපි ලේඛන කියවීම කෙරෙහි අපේක්ෂකයන්ගේ අවධානය යොමු කළ යුතු අතර එමගින් ලේඛන වාක්‍ය රටා පිළිබඳ අවබෝධයක් ලබා ගැනීමට ඔවුන් පෙලඹ විය යුතු ය.

**5.** (අ) පහත දැක්වෙන වාක්‍යවල **තද කළු අකුරෙන්** දක්වා ඇති පදවල **අර්ථ විග්‍රහ කර** ලියන්න.

(i) ජාතීන් අතර **අන්‍යෝන්‍ය** අවබෝධය ඉතා අගනේ ය.

(ii) අධිකරණය **චූදිතයා** නිදහස් කරයි.

(iii) චිරන්තන සිංහල ගද්‍ය සාහිත්‍යයේ **දුරවබෝධ** පද නිතර හමු වෙයි. (ලකුණු 03 යි.)

(i) ඔවුනොවුන් (අතර) / එකිනෙකා/ උනුන්

(ii) චෝදනාවට ලක්වූ පුද්ගලයා / චෝදනා ලැබූ පුද්ගලයා

(iii) අවබෝධ කර ගැනීමට අපහසු/ දුෂ්කර / අමාරු

**(ලකුණු 03යි)**

(ආ) පහත දැක්වෙන යෙදුම්වලට **වඩාත් සුදුසු තනි පද** ලියන්න.

(i) විද්‍යාව දැනගත් පුද්ගලයා

(ii) කෘතියක ගැටලු සහිත පද පහදා දෙන සාහිත්‍ය ග්‍රන්ථ

(iii) විචාර බුද්ධියෙන් තොරව කිසියම් මතයක එල්බ ගැනීම (ලකුණු 03 යි.)

(i) විද්‍යාඥයා

(ii) ගැටපද

(iii) ආධානග්‍රාහී **(ලකුණු 03යි)**

(ඉ) පහත දැක්වෙන වාක්‍යවල **හිස්තැනට වඩාත් ම ගැළපෙන පදය පහත වරහන තුළ දී ඇති පද අතුරෙන් තෝරා** ලියන්න

(i) ඩෙංගු රෝගය මැඩීම සඳහා පාසල් ...................... පිරිසිදු ව තබා ගත යුතු ය.

(ii) අඩු මිල විදුලි ...................... නිෂ්පාදනයෙන් චීනය ඉදිරියෙන් සිටී.

(iii) අනුරාධපුර නගරයේ දී ගොවි ...................... පැවැත්විණි.

(iv) වීරෝදාර සෙබළ යුද්ධ ...................... වෙත අවතීර්ණ වූහ.

(v) ලෝක සාමය පිළිබඳ ජාත්‍යන්තර ...................... ජිනීවාහි දී පැවැත්වේ.

(vi) තාක්ෂණික ...................... මිනිසාගේ බුද්ධිබලය හීන කරයි.

(මෙවලම්, බිම, සම්මන්ත්‍රණය, භූමිය, සමුළුව, උපකරණ) (ලකුණු 03 යි.)

(i) බිම

(ii) මෙවලම්

(iii) සමුළුව

(iv) භූමිය

(v) සම්මන්ත්‍රණය

(vi) උපකරණ **(ලකුණු 03යි)**

(ඊ) **තද කළු අකුරෙන්** දක්වා ඇති **බහු අර්ථ පදය යොදු වෙනත් අරුතක් දෙන ලෙස** වාක්‍යය බැගින් තනන්න.

(i) භාණ්ඩයක **කල්** පැවැත්ම කෙරෙහි කවුරුත් අවධානය යොමු කරති.

(ii) **ලද** යන්නෙහි ලැබූ අර්ථය ඇත.

(iii) ඔහු සභික ධුරයකට **පත්** කෙරෙයි.

(iv) **පුර** පොහොය සෑම මසක් පාසා ම උදා වෙයි.

(v) සොරා **පැන** දුවයි.

(vi) යුද්ධය නිසා බොහෝ දරුවන්ට **පිය** සෙනෙහස අහිමි විය. (ලකුණු 06 යි.)

(i) කල් (කාලය) ප්‍රිය, මනෝහර, යහපත්, කාන්තාව, වල්ලභයා, ලීලාව, විලාසය, විනාශය, ආදරය

(ii) ලද (ලැබූ) ලබ්ධිය, ලජ්ජාව, විලඳ, අලුත්

(iii) පත් (ප්‍රාප්ත/පැමිණි) පත්‍රය, කොළය, පාත්‍රය, පිහාටුව, යෝග්‍ය, මාර්ගය, ලියමන, විජිනිපත, නැළිය, බොකු ගැසූ අතට අල්ලන ප්‍රමාණය, කන් පෙත්ත


(iv) පුර (පුර පක්ෂය / පිරුණු) නගරය, අන්තඃපුරය, රට, දේශය, පුර (විවිධ ක්‍රියා අර්ථය)

(v) පැන (පලායාම / පැනයාම) ප්‍රශ්නය, ප්‍රඥාව, ජලය, කලස, කළය, පැන පැන (මිශ්‍ර ක්‍රියා), පූර්ව ක්‍රියා අර්ථය

(vi) පිය (පියා) පාදය, අඩිය, පාදුකාව, පිහිට, ප්‍රිය, ප්‍රියාව, කාන්තාව, ස්වාමි පුරුෂයා, පියාපත, ඇස් පිහාටුව, මොරගස, ප්‍රීතිය, ජාතිය, භවය, බීම, අත් හැරීම යන ක්‍රියාර්ථය

**(ලකුණු 06යි)**


**5 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :**





මෙම ප්‍රශ්නය තෝරා ගෙන ඇති ප්‍රතිශතය 30%කි.
මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 15ක් හිමි වේ.
ඉන්

ලකුණු 00 - 03 ප්‍රාන්තරයේ 24% ක් ද
ලකුණු 04 - 07 ප්‍රාන්තරයේ 51% ක් ද
ලකුණු 08 - 11 ප්‍රාන්තරයේ 19% ක් ද
ලකුණු 12 - 15 ප්‍රාන්තරයේ 6% ක් ද

ලෙස ලකුණු ලබා ගෙන ඇත. මෙම ප්‍රශ්නයට ලකුණු 11ට වඩා ලබා ගත් අපේක්ෂකයන් 6%ක් වන අතර 75%ක් ලබා ගෙන ඇත්තේ ලකුණු 8ට අඩුවෙනි.




මෙම ප්‍රශ්නය කොටස් 4කින් හා අනුකොටස් 18කින් ද යුක්ත වේ. එයින් 42%ක් වූ වැඩි ම පහසුතාවක් දක්වනුයේ (ආ) කොටසට වන අතර, 19%ක් වූ (ඉ) කොටස අඩු ම පහසුතාවක් පෙන්නුම් කරයි. (අ) සහ (ඊ) කොටස්වල පහසුතාව පිළිවෙළින් 35% සහ 37% වේ. මෙම කොටස් හතරෙන් (ආ) කොටසේ (i) අනුකොටසෙහි පහසුතාව 89%කි. එය වැඩි ම පහසුතාව වන අතර අවම පහසුතාව ලබා ගෙන ඇත්තේ එම කොටසෙහි ම (iii) වන අනුකොටසට ය. එය 3%කි.

**පිළිතුරු පිළිබඳ නිරීක්ෂණ**

(අ), (ආ), (ඉ), (ඊ) යන අනුකොටස් හතරක් යටතේ ඉදිරිපත් කෙරෙන මෙම ප්‍රශ්නයේ අරමුණ ලෙස පෙනෙන්නේ භාෂාවේ අර්ථ විභාගය සහ වචන කෝෂ භාවිතය පිළිබඳ අපේක්ෂකයන්ගේ අවබෝධය මැන බැලීම යි.

මෙහි (අ) හා (ඊ) කොටස් යොමු වන්නේ අර්ථ විභාගය කෙරෙහි ය. (අ) කොටසෙන් වාක්‍යයක යෙදී ඇති වචනවල අර්ථ විග්‍රහ කිරීම අපේක්ෂිත ය. (ඊ) කොටසෙන් අපේක්ෂා කරන්නේ බහු අර්ථ පදවලින් නිරූපිත අර්ථ විභාග කිරීම සඳහා අපේක්ෂකයන් දක්වන කුසලතා විමර්ශනය කිරීම යි. (ආ) හා (ඉ) යන කොටස් වචන කෝෂය සඳහා යොමු වේ. (ආ) කොටසෙන් යම් යම් යෙදුම් සඳහා යෝග්‍ය තනි පද විමසීමත් (ඉ) කොටසෙන් හිස්තැනට යෝග්‍ය ආකාරයෙන් පද තේරීමත් අපේක්ෂිත ය.

අර්ථ විභාගය යටතේ එන (අ) කොටසෙහි පහසුතාව 35%කි. (ඊ) කොටසෙහි පහසුතාව 37%කි. වචන කෝෂය යටතේ එන (ආ) කොටසෙහි පහසුතාව 42%කි. අනෙක් කොටස්වලට සාපේක්ෂව එය හොඳ සාධන මට්ටමක පවතී. එහෙත් (ඉ) කොටසෙහි පහසුතාව 19%කි. එය පහළ සාධන මට්ටමක පවතී.

**නිගමන හා යෝජනා**

විදග්ධ භාවිතයේ පවතින වචනවල අර්ථාවබෝධයත් විවිධ යෙදුම්වලට යෝග්‍ය තනි පද තෝරා ගැනීමත් පිළිබඳ අපේක්ෂකයන්ගේ දැනුම තරමක් ඉහළ මට්ටමක පවතින බව පෙනේ. අර්ථ විග්‍රහ කිරීම සම්බන්ධ (අ) කොටසේ දී අපේක්ෂකයාගේ සාධන මට්ටම පහළ මට්ටමක පවතී. අනුරූපී පද භාවිතයෙන් කිසියම් වාක්‍යයක යෝග්‍ය ආකාරයෙන් හිස්තැන් පිරවීමට අපේක්ෂකයන් තුළ පවත්නා පරිචය ප්‍රමාණවත් නො වේ. එසේ ම බහු අර්ථවත් පද ඒ ඒ අර්ථයට අනුරූපී ව යෙදීම පිළිබඳ ව ද මධ්‍යස්ථ අවබෝධයක් ඔවුන් සතු ව ඇත. ප්‍රශස්ත ගණයේ කෘති පරිහරණය, ශාස්ත්‍රීය ලිපි ලේඛන ඇසුරු කිරීම හා පොතපත පරිශීලනය කෙරෙහි ශිෂ්‍යයන් යොමු කිරීමට ගුරුභවතුන් උත්සුක වීමෙන් මෙවැනි ප්‍රශ්නවලට උසස් ප්‍රතිචාර දැක්වීමේ ප්‍රාගුණ්‍යය අපේක්ෂකයන් තුළ වර්ධනය කළ හැකි ය.

6. පහත දැක්වෙන වාක්‍යවල **තද කළු අකුරෙන් මුද්‍රිත පදවල ව්‍යාකරණ අංගය** දක්වා ඇත. ඒවායෙහි **අනු අංගය** දක්වන්න.

(i) ප්‍රියයාගේ **වියෝගය** දරනු නොහැකි ව **මුවගන** තම නුවනත කඳුළින් පුරවා ගත්තා ය. (**වියෝගය** - උපසර්ග, **මුවගන** - සන්ධි, **නුවනත** - තද්ධිත)

(ii) වැද්දා **ඔබිනොබ සරන වනසතුන්** ඉලක්ක කර හීයක් විද්දේ ය. (**ඔබිනොබ** - සන්ධි, **සරන** - කෘදන්ත, **වනසතුන්** - සමාස)

(iii) **ජ්‍යෙෂ්ඨ** ශිෂ්‍යයන්ගේ නොමනා ක්‍රියා නිසා ඇතැම් **නවක ශිෂ්‍යයෝ** සරසවිය අත් **හැර** යති. (**ජ්‍යෙෂ්ඨ**-තද්ධිත, **නවක ශිෂ්‍යයෝ** - සමාස, **හැර** - ක්‍රියා)


(iv) **සුරාසුර යුද්ධයෙහි** දී පරාජය වූවෝ **දෙව්ලොව** හැර පලා ගියහ. (**සුරාසුර** - සන්ධි, **යුද්ධයෙහි** - විභක්ති, **දෙව්ලොව** - සමාස)

(v) "**අනේ**! එ විපත සිදු වුණි. නො **දනිමි කාගෙ** දොසා" (**අනේ** - නිපාත, **දනිමි** - ක්‍රියා, **කාගෙ** - විභක්ති)

(ලකුණු 15 යි.)

| | | | |
|---|---|---|---|
| (i) | වියෝගය | උපසර්ග | විරුද්ධාර්ථයේ/ නිෂේධාර්ථයේ උපසර්ග |
| | මුවගන | සන්ධි | පරස්වර ලෝප සන්ධිය/ පරසර ලොප් සඳ/ පූර්ව ස්වර ලෝප සන්ධිය |
| | නුවනත | තද්ධිත | ස්වාර්ථයේ/ එය ම යන අර්ථයේ |
| | ඔබිනොබ | සන්ධි | ස්වර සන්ධි/ සර සඳ/ ආරෝහණ සන්ධිය |
| | සරන | කෘදන්ත | වර්තමාන කෘදන්ත/ වර්තමාන කර්තෘ කාරක කෘදන්ත |
| | වන සතුන් | සමාස | විභක්ති සමාස/ විබත් සමස්/ ආධාර විභක්ති සමාස/ අදර විබත් සමස් |
| | ජ්‍යෙෂ්ඨ | තද්ධිත | උත්කෘෂ්ටාර්ථයේ (ඉහළ යන/ උසස් යන/ වඩා යන අර්ථයේ) |
| | නවක ශිෂ්‍යයෝ | සමාස | විශේෂණ සමාස/ වෙසෙසුන් සමස්, විශේෂණ පූර්ව පද සමාසය |
| | හැර | ක්‍රියා | පූර්ව ක්‍රියා / පෙර කිරිය |
| | සුරාසුර | සන්ධි | සමාන ස්වර දීර්ඝ සන්ධිය/ සවර්ණ ස්වර දීර්ඝ සන්ධිය/ ස්වරාදේශ සන්ධිය |
| | යුද්ධයෙහි | විභක්ති | ආධාර විභක්ති/ අදර විබත් (සප්තමී විභක්ති) |
| | දෙව්ලොව | සමාස | විභක්ති සමාස/ විබත් සමස්, සම්බන්ධ විභක්ති සමාස / සබඳ විබත් සමස් |
| | අනේ | නිපාත | ඛේදාර්ථයේ/ භාවාර්ථයේ (ශෝකය ප්‍රකාශ කිරීම් අර්ථයේ) |
| | දනිමි | ක්‍රියා | වර්තමාන ක්‍රියා/ ත්‍රෛකාලික ක්‍රියා/ ශුද්ධ ක්‍රියා /අවසාන ක්‍රියා |
| | කාගෙ | විභක්ති | සම්බන්ධ විභක්ති/ සබඳවිබත් (ෂෂ්ඨී විභක්ති) |


**6 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :**





මෙම ප්‍රශ්නය තෝරා ගෙන ඇති ප්‍රතිශතය 13%කි. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 15ක් හිමි වේ.

ඉන් ලකුණු 00 - 03 ප්‍රාන්තරයේ 5%ක් ද
ලකුණු 04 - 07 ප්‍රාන්තරයේ 27%ක් ද
ලකුණු 08 - 11 ප්‍රාන්තරයේ 44%ක් ද
ලකුණු 12 - 15 ප්‍රාන්තරයේ 24%ක් ද

ලෙස ලකුණු ලබා ගෙන ඇත. මෙම ප්‍රශ්නයට ලකුණු 11ට වඩා ලබා ගත් අපේක්ෂකයන් 24%ක් වන අතර 32%ක් ලබා ගෙන ඇත්තේ ලකුණු 8ට අඩුවෙනි.




මෙම ප්‍රශ්නයේ සමස්ත පහසුතාව 55%කි. උපරිම පහසුතාව වන 64% (ii) කොටසට හිමි වී ඇති අතර අවම පහසුතාව 39% ලැබී ඇත්තේ (i) කොටසට ය.

**පිළිතුරු පිළිබඳ නිරීක්ෂණ**

මෙම ප්‍රශ්නයෙහි අන්තර්ගත කොටස් 5හි පහසුතාව මට්ටම 64%, 63%, 56%, 51%, හා 39% වශයෙන් වන අතර ප්‍රශ්න අංකයට සාපේක්ෂ ව එය II, III, V, IV හා I වශයෙනි. පහසුතා මට්ටමේ උපරිමය 64%ක් වන අතර අවමය 39%ක් වේ.

**නිගමන හා යෝජනා**

ව්‍යාකරණ අංග පිළිබඳ ව මනා අවබෝධයක් ඇති අපේක්ෂකයන්ට මෙය ඉතා පහසුවෙන් ලකුණු උපයා ගත හැකි ප්‍රශ්නයක් බව පැහැදිලි වේ. එබැවින් එක් එක් ව්‍යාකරණ අංග නිවැරදි ව හඳුනා ගැනීම අවශ්‍ය වන අතර ම ඒවායේ අනුප්‍රභේද පිළිබඳ අවබෝධය ලබා ගැනීම ද අවශ්‍ය වේ.

මෙම ප්‍රශ්නයේ සාධනය ඉහළ මට්ටමකට ගෙන යාමට කළ යුතු වැදගත් ම කාර්යය වන්නේ අපේක්ෂකයන් හැකිතාක් අභ්‍යාසකරණය සඳහා යොමු කරවීම යි. මෙහි දී ප්‍රස්තුත පද විවිධාකාරයෙන් සන්දර්ශනය කොට විග්‍රහ කිරීමේ හැකියාවක් ලබා ගැනීමට අපේක්ෂකයන් උත්සාහ ගත යුතු වේ.

**07 ප්‍රශ්නය**

**7. (අ)** පහත දැක්වෙන යෙදුම්වලට **වඩාත් ගැළපෙන** ප්‍රස්තාව පිරුළ ලියන්න.

(i) වැරදි කරන්නා කාටත් වැරදි කරයි.

(ii) තනතුරට වඩා හැසිරෙන ආකාරය වෙලාවක දී වටින්නේ ය.

(iii) තමාගේ දියුණුව තමා ම සලසා ගන්න.

(iv) වැඩ දෙකක් ම එකවර කර ගැනීම

(v) යහපත් දේ කළත් නපුරු මිනිසා යහපත් ගති ඇත්තෙකු නොවීම

(vi) කෙනෙකුගේ ගති ගුණ වෙනස් කළ නොහැකි වීම (ලකුණු 03 යි.)

(i) විදින ගුල්ලා රත්තරන් භාජනේ උනත් විදිනව ලු

(ii) ලැජ්ජ නැතිකම මහමුදලිකමටත් වඩා ලොකුයි ලු.

(iii) තමන් හිසට තම අතම ය සෙවණැල්ල / වැයම් මිසක් නැයන් මොට ද කලියුගේ

(iv) දඹුලු ගොහින් තලගොයිත් මරාගෙන ආවා වගේ
එක ගලෙන් කුරුල්ලො දෙන්නෙක් මරාගත්තා වගේ
බුදුන් වැඳ ගෙන කෙමනත් බලා ගෙන ආවා වගේ

(v) කිරෙන් සේදුවත් අඟුරු සුදු වෙන්නෙ නෑ වගේ

(vi) වඳුරා හැට පිරුණත් බිම ගමන් නැතුවා වගේ
කොටියගෙ පුල්ලි මකන්න බැරුවා වගෙ
ආරේ ගුණ නැරේ
උණ පුරුකේ දැමුවත් බලු වලිගේ ඇද නැරේ
උපන්ගෙයි සිරිත බලි ඇරියත් අරින්න බැහැ වගේ

**(ලකුණු $\frac{1}{2} \times 6 = 03$යි)**

(ආ) පහත දී ඇති **රූඪීවල අදහස පැහැදිලි වන සේ** වාක්‍යවල යොදන්න.

| | |
|---|---|
| (i) අමු කැවිලා | (ii) අං මතුවෙලා |
| (iii) දෝරේ යනවා | (iv) වැදි බණ |
| (v) දෙකට දෙවාරම් | (vi) අකලට මෝරලා |

(ලකුණු 03 යි.)

(i) තාවකාලික ව පියවි සිහියෙන් තොර වීම / සිහිය විකල් වීම

(ii) අහංකාරකම ඉස්මතු වීම

(iii) පිරී ඉතිරී යාම

(iv) තමන් නො පිළිපැද අනුන්ට දෙන අවවාද

(v) තීන්දුවක් නො ගෙන / පැත්තක් නො ගෙන / තීරණයකට නො පැමිණ

(vi) සුදුසු කාලයට නො පැමිණ මුහුකුරා යාම (ලකුණු $\frac{1}{2} \times 6 = 03$යි)

(ඉ) පහත දී ඇති **එක් එක් යුගල පදය සෑදී ඇති රටාව** කුමක් දැයි දක්වන්න.

| | |
|---|---|
| (i) දිග - පළල | (ii) චං - හූං |
| (iii) බැළ - මෙහෙවර | (iv) හයි - හක්තිය |
| (v) හැල - හැප්පුම් | (vi) දෙගුණ - තෙගුණ |

(ලකුණු 03 යි.)

(i) එකිනෙකට විරුද්ධ පද දෙකක් යෙදීම

(ii) අර්ථ රහිත පද දෙකක් යෙදීම

(iii) පද දෙකේ ම අර්ථ සමාන ව යෙදීම

(iv) මුල් පදයේ අර්ථය දෙවන පදයෙන් තීව්‍ර කිරීම / අර්ථයෙන් සමීප වන පද දෙකක් යෙදීම

(v) වචන යුගලය එක් ව අර්ථය තීව්‍ර කිරීම

(vi) මුල් පදයේ අර්ථය දෙවන පදයෙන් තීව්‍ර කිරීම / එකිනෙකට වෙනස් අරුත් දනවන පද දෙකක් යෙදීම (ලකුණු $\frac{1}{2} \times 6 = 03$යි)

(ඊ) පහත දී ඇති **ප්‍රාදේශික ව්‍යවහාර සඳහා පොදු භාවිතයේ යෙදෙන පද** ලියා දක්වන්න.

| | |
|---|---|
| (i) දිය කැට පහණ | (ii) කෝණම |
| (iii) තිහව | (iv) පිරිවැස්ස |
| (v) ඇන්න යනවා | (vi) රෑනා |

(ලකුණු 03 යි.)

(i) ජල මාපකය / වැවේ ජලය මනින ස්තම්භය

(ii) අලුත් අවුරුද්ද

(iii) තිස්සමහාරාමය

(iv) ආන/ අලුව / හළුව

(v) අරගෙන යාම

(vi) බළලා/ පූසා (ලකුණු $\frac{1}{2} \times 6 = 03$යි)

(උ) පහත දී ඇති **ප්‍රාස්තාවික ව්‍යවහාර සඳහා පොදු භාවිතයේ යෙදෙන අරුත්** ලියන්න.

| | |
|---|---|
| (i) තොත්තෙ | (ii) දහ අට හොඳයි |
| (iii) මුදුනා | (iv) පුබ්බරු |
| (v) බය්යනවා | (vi) දෙයියන්ගේ බෝව |

(ලකුණු 03 යි.)

(i) පස්සට යාම

(ii) දහනවය

(iii) හරක් බානේ මුලට ම සිටින හරකා


(iv) බත්

(v) නිදා ගන්නවා

(vi) කමතේ දී දෙවියන්ට වෙන් කරන වී

(ලකුණු ½ × 6 = 03යි)


**7 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :**




මෙම ප්‍රශ්නය තෝරා ගෙන ඇති ප්‍රතිශතය 4%කි. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 15ක් හිමි වේ.

ඉන් ලකුණු 00 - 03 ප්‍රාන්තරයේ 22%ක් ද
ලකුණු 04 - 07 ප්‍රාන්තරයේ 40%ක් ද
ලකුණු 08 - 11 ප්‍රාන්තරයේ 24%ක් ද
ලකුණු 12 - 15 ප්‍රාන්තරයේ 14%ක් ද,

ලෙස ලකුණු ලබා ගෙන ඇත. මෙම ප්‍රශ්නයට ලකුණු 11ට වඩා ලබා ගත් අපේක්ෂකයන් 14%ක් වන අතර 62%ක් ලබා ගෙන ඇත්තේ ලකුණු 8ට අඩුවෙනි.




මෙම ප්‍රශ්නයේ 29%ක වැඩි ම පහසුතාව (අ) කොටසට ද 6% ක අඩු ම පහසුතාව (ඊ) කොටසට ද හිමි වී ඇත.

**පිළිතුරු පිළිබඳ නිරීක්ෂණ**

II පත්‍රයේ ප්‍රශ්න අතුරෙන් අවම තෝරාගැනීමක් සහිත ප්‍රශ්නය මෙයයි. මෙම ප්‍රශ්නයේ ඉහළ ම සාධනය දක්වා ඇත්තේ ප්‍රස්ථාව පිරුළු සම්බන්ධයෙන් විමසා ඇති ප්‍රශ්නයට ය. එය 29%කි. අඩුම සාධන මට්ටමක් ප්‍රාදේශීය ව්‍යවහාර සම්බන්ධයෙන් විමසා ඇති ප්‍රශ්නයට හිමි වී ඇත. එය 6%කි. රූඪී සම්බන්ධයෙන් විමසා ඇති (ආ) කොටසට 24%ක් ද යුගල පද සම්බන්ධයෙන් විමසා ඇති (ඉ) කොටසට 22%ක් ද ප්‍රාස්තාවික ව්‍යවහාර සම්බන්ධයෙන් විමසා ඇති (උ) කොටසට 11%ක් ද වශයෙන් හිමි වී ඇත.

**නිගමන හා යෝජනා**

යුගල පද සෑදී ඇති රටා, ප්‍රාස්තාවික ව්‍යවහාර සඳහා පොදු භාවිතයේ යෙදෙන අරුත් දැක්වීම, ප්‍රාදේශික ව්‍යවහාර සඳහා පොදු භාවිතයේ යෙදෙන පද ලියා දැක්වීම හා ප්‍රස්තාව පිරුළු හා රූඪී හෙවත් ඉඟිවැකි පිළිබඳ ව අපේක්ෂකයන් සැපයූ පිළිතුරුවල පැවැති දුර්වලතා හා පහසුතා මට්ටම්වලින් පෙනී යන්නේ මේවා ගැන නිරවුල් දැනුමක් අපේක්ෂකයන් තුළ නොමැති බව යි. එබැවින් යථෝක්ත අංශ පිළිබඳ ව මනා අවබෝධයක් ඇති කර ගැනීම මෙන් ම භාවිතය කෙරෙහි ද අපේක්ෂකයන්ගේ අවධානය යොමු විය යුතු ය. එසේ ම මේ හා බැඳුණු පොතපත පරිශීලනයට ද පියවර ගැනීම සුදුසු ය. එසේ ම සිසුන් ව අභ්‍යාසකරණයට යොමු කිරීම ද වැදගත් වේ.

**08 ප්‍රශ්නය**

**8.** පහත සඳහන් ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

චිත්‍රාකුමරියරූපයෙන්අග්‍රප්‍රාප්තයසියලුස්ත්‍රීමායමින්පාරප්‍රාප්තයමදමුදුලලිතභාෂණයෙන්දනෙත්කොන්බැල්මහා
මුසුවූමන්දස්මිතයෙන්දයෞවනයන්උන්මාදයටපත්කරනහෙයින්ඇඋන්මාදචිත්‍රානම්වූවායනෛමිත්තිකයන්
ගේඅනාවැකිඅසාභීතියටපත්දෙමවුපියන්විසින්ඇඑක්ටැම්ගෙයකසිරකරනුලැබූවායඅහෝඇදුක්මුසුවඑහිහුදකලා
වදිවිගෙවූවායඑකලගාමිණීනම්වූඅභිරූපසම්පන්නයෞවනයෙක්වූයේයඋත්තුංගදේහධාරියකුවූහෙයින්හෙ
තෙමදීඝගාමිණීනම්වීයදෛවෝපගතවමෙන්ඔවුන්දෙදෙනාඅතරප්‍රේමසම්බන්ධයක්ඇතිවියමාප්‍රේමියකෙදිනක
හෝඔබමාගේපාදපරිචාරිකාවකරගනිමියිඔහුඇයටපොරොන්දුවූයේයමාපෙම්බරකුමරාණමාගේඒකායනප්‍රාර්ථන
යදඑයමුත්මමමේසිරකුටියෙන්කෙසේමිදෙම්දැයිඇශෝකයෙන්බරවවිචාළායසොඳුරියමමඔබදකිනුපිණිසහැකිවිග
සින්එන්නෙමියිකියාඔහුඇයගේදර්ශනපථයෙන්ඉවත්වගියේයදිනසතිමාසගෙවීගියේයවසන්තකාලයදඋදාවියපූර්ණච
න්ද්‍රයානභෝතලයශෝභාවත්කෙළේයපුලපුලාබලාසිටිරූපකායඇයඇස්මානයේපෙනීසිටියේයමූරසේවිකා
වක්අදරාත්‍රියේකුමරුන්ඔබවෙතඑතියිදැනුම්දුන්නායඔහුකක්කටකයන්ත්‍රයකකකුළුවකුගේආකාරයෙන්තැනූයන්ත්‍රයක
ආධාරයෙන්එක්ටැම්කුලුනනැග්ගේයසඳවරින්වරවලාකුළුඅතරසැඟවගියේයඅරුණෝදයේළාහිරුරැස්ඔවුන
ගේකුටියආලෝකවත්කෙළේයඇහඬමින්මඳසුසුම්හෙළමින්නෙතුකඳුළින්පුරමින්ඔහුටසමුදුන්නාය

(i) ඉහත ඡේදය අර්ථාවබෝධයට අනුකූල වන සේ වචන වෙන් කොට, අවශ්‍ය විරාම ලක්ෂණ යොදා නැවත ලියන්න.

(ii) **ගෞරවාර්ථ ප්‍රත්‍යයක්** සහිත ආමන්ත්‍රණ පදයක් ඡේදයෙන් උපුටා දක්වන්න.

(iii) '**ක**' වර්ගයට අයත් **ඝෝෂ මහාප්‍රාණ** අක්ෂරයක් සහිත පදය උපුටා ලියන්න.

(iv) **අස්ත්‍යර්ථයේ තද්ධිත** ප්‍රත්‍යය සහිත පද **දෙකක්** ඡේදයෙන් තෝරා ලියන්න.

(v) **දේහධාරියකු** යන්නෙහි ඇති පිල්ලම් නම් කරන්න.

(ලකුණු 15 යි.)

(i) චිත්‍රා කුමරිය රූපයෙන් අග්‍රප්‍රාප්ත ය; (අග්‍රප්‍රාප්ත ය,) සියලු ස්ත්‍රීමායමින් පාරප්‍රාප්ත ය. මද මුදු ලලිත භාෂණයෙන් ද නෙත්කොන් බැල්ම හා මුසු වූ මන්දස්මිතයෙන් ද යෞවනයන් උන්මාදයට පත් කරන හෙයින් ඈ උන්මාදචිත්‍රා නම් වූවා ය. නෛමිත්තිකයන්ගේ අනාවැකි අසා භීතියට පත් දෙමවුපියන් විසින් ඈ එක්ටැම් ගෙයක සිරකරනු ලැබුවා ය. අහෝ! ඈ දුක්මුසු ව එහි හුදකලා ව දිවි ගෙවුවා ය. එකල ගාමිණී නම් වූ අභිරූප සම්පන්න යෞවනයෙක් වූයේ ය. උත්තුංග දේහධාරියකු වූ හෙයින් හෙතෙම දීඝගාමිණී නම් වී ය. දෛවෝපගත ව මෙන් ඔවුන් දෙදෙනා අතර ප්‍රේම සම්බන්ධයක් ඇති විය. " මා ප්‍රේමිය, කෙදිනක හෝ ඔබ මාගේ පාදපරිචාරිකාව කර ගනිමි"යි ඔහු ඇයට පොරොන්දු වූයේ ය. "මා පෙම්බර කුමරාණ, මාගේ ඒකායන ප්‍රාර්ථනය ද එය මුත් මම මේ සිරකුටියෙන් කෙසේ මිදෙම් ද"යි ඈ ශෝකයෙන් බර ව විචාළා ය. "සොඳුරිය, මම ඔබ දකිනු පිණිස හැකි විගසින් එන්නෙමි"යි කියා ඔහු ඇයගේ දර්ශනපථයෙන් ඉවත් ව ගියේ ය. දින, සති, මාස (දිනසතිමාස) ගෙවී ගියේ ය. වසන්ත කාලය ද උදා විය. පූර්ණ චන්ද්‍රයා නභෝතලය ශෝභාවත් කෙළේ ය. පුල පුලා බලා සිටි රූපකාය ඇය ඇස්මානයේ පෙනී සිටියේ ය. මුරසේවිකාවක් "අද රාත්‍රියේ කුමරුන් ඔබ වෙත එති"යි දැනුම් දුන්නා ය. ඔහු කක්කටක යන්ත්‍රයක ( කකුළුවකුගේ ආකාරයෙන් තැනූ යන්ත්‍රයක) (-කකුළුවකුගේ ආකාරයෙන් තැනූ යන්ත්‍රයක) ආධාරයෙන් එක්ටැම් කුලුන නැග්ගේ ය. සඳ වරින්වර වලාකුළු අතර සැඟව ගියේ ය. අරුණෝදයේ ළාහිරු රැ ස් ඔවුනගේ කුටිය ආලෝකවත් කෙළේ ය. ඈ හඬමින්, මඳසුසුම් හෙළමින්, නෙතු කඳුළින් පුරමින් ඔහුට සමුදුන්නා ය. **(පද බෙදීමට ලකුණු 03යි)**

**(විරාම ලක්ෂණවලට ලකුණු 04යි)**

(ii) කුමරාණ


(iii) දීඝගාමිණී

(iv) ශෝභාවත් / ආලෝකවත්

(v) කොම්බුව සහ දීර්ඝත්ව ලක්ෂණය / හල් කිරීම, ඇලපිල්ල, කෙටි ඉස්පිල්ල, කෙටි පාපිල්ල


**(ලකුණු 2 × 4 = 08යි)**


**8 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :**




මෙම ප්‍රශ්නය තෝරා ගෙන ඇති ප්‍රතිශතය 79%කි. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 15ක් හිමි වේ.
ඉන්
ලකුණු 00 - 03 ප්‍රාන්තරයේ 3%ක් ද
ලකුණු 04 - 07 ප්‍රාන්තරයේ 27%ක් ද
ලකුණු 08 - 11 ප්‍රාන්තරයේ 50%ක් ද
ලකුණු 12 - 15 ප්‍රාන්තරයේ 20%ක් ද

ලෙස ලකුණු ලබා ගෙන ඇත. මෙම ප්‍රශ්නයට ලකුණු 11ට වඩා ලබා ගත් අපේක්ෂකයන් 20%ක් වන අතර 30%ක් ලබා ගෙන ඇත්තේ ලකුණු 8ට අඩුවෙනි.




8 වන ප්‍රශ්නයේ කොටස් අතුරෙන් වැඩි ම පහසුතාව දක්වා ඇත්තේ (i) කොටසට වන අතර අඩු ම පහසුතාව දක්වා ඇත්තේ (iv) කොටසට ය. එම කොටස්වල පහසුතා ප්‍රතිශතය අනුපිළිවෙළින් 67% හා 25% ලෙස ප්‍රස්තාරයෙහි දැක් වේ. මෙම ප්‍රස්තාරයේ සමස්ත පහසුතාව වන්නේ 59%කි.

**පිළිතුරු පිළිබඳ නිරීක්ෂණ**

කොටස් 5කින් සමන්විත මෙම ප්‍රශ්නයේ (i) කොටසින් පද බෙදා නැති ඡේදයක් විරාම ලක්ෂණ භාවිත කොට විධිමත් අයුරින් පද බෙදා වෙන් කර නැවත ලිවීම අපේක්ෂා කෙරේ. ඉතිරි කොටස් හතරෙන් භාෂා ව්‍යාකරණ ලක්ෂණ කීපයක් පිළිබඳ අපේක්ෂකයන්ගේ දැනුම විමසා බැලෙයි.

මෙම ප්‍රශ්නයට පිළිතුරු සැපයීමේ දී (i) කොටසට 67%ක සාධන මට්ටමක් දැක්වුව ද, ඊට සාපේක්ෂ ව ඉතිරි කොටස්වලට අඩු සාධන මට්ටම් පෙන්නුම් කරයි. ඒ අනුව (ii) කොටසට 66%ක් ද, (iii) කොටසට 62%ක් ද, (iv) කොටසට 25%ක් ද, (v) කොටසට 57%ක් වශයෙන් පහසුතාව දක්වා ඇත.

මෙයින් පැහැදිලි වන්නේ දී ඇති ඡේදය විරාම ලක්ෂණ යොදා නැවත පද බෙදා ලිවීමට අපේක්ෂකයන් දක්වන කුසලතාවට සාපේක්ෂ ව ව්‍යාකරණ අංග පිළිබඳ දක්වන කුසලතාව අඩු බව යි.


**නිගමන හා යෝජනා**

සිංහල ලේඛන සම්ප්‍රදායය හා සම්බන්ධිත විරාම ලක්ෂණ භාවිතය පිළිබඳ නිවැරදි අවබෝධයක් අපේක්ෂකයන්ට ලබා දීමට කටයුතු කිරීම වැදගත් ය.

එසේ ම ලේඛනයේ දී සම්මත ආකාරයෙන් පද බෙදීම පිළිබඳ අවබෝධයක් ද, අක්ෂර, පිලි භාවිතය, හා ඒ ඒ ව්‍යාකරණ අංග පිළිබඳ ව මනා අවබෝධයක් ද අපේක්ෂකයන්ට තිබිය යුතු ය. මේ සඳහා යෝග්‍ය පොතපත පරිශීලනය කිරීම අත්‍යවශ්‍ය වේ. පද බෙදීම පිළිබඳ ව සතතාභ්‍යාසයට සිසුන් යොමුකිරීම මගින් එහි සාධන මට්ටම උපරිමයට ගෙන ඒමට හැකි වනු ඇත.


**2.2.8 II ප්‍රශ්න පත්‍රයේ II කොටසට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :**

**අ.පො.ස. (උ.පෙළ) විභාගය - 2018**
**71 - සිංහල**
**II ප්‍රශ්න පත්‍රයේ II කොටසේ ප්‍රශ්න සඳහා වර්ගීකරණය අනුව පහසුතාව**




II ප්‍රශ්න පත්‍රයේ II කොටසේ ඇතුළත් ප්‍රශ්න අතුරෙන් භාෂා අවබෝධය හා සංශ්ලේෂණය පිළිබඳ ව දෙවන ප්‍රශ්නය ද විශ්ලේෂණාත්මක රචනා ලිවීමේ හැකියාව පිළිබඳ ව තුන්වන වන ප්‍රශ්නය ද දී ඇති අතර ඒවායේ පහසුතා පිළිවෙළින් 75% හා 55% වේ. ඉතිරි ප්‍රශ්න 5 භාෂා විග්‍රහයට ඇතුළත් වන අතර එයින් හත්වන ප්‍රශ්නය 18%ක අවම පහසුතා මට්ටමක් පෙන්නුම් කරයි. ඉතිරි ප්‍රශ්න 4හි පහසුතා මට්ටම් 34% හා 77% අතර පරාසයක පවතී.

**අ.පො.ස. (උ.පෙළ) විභාගය - 2018**
**71 - සිංහල**
**II ප්‍රශ්න පත්‍රයේ II කොටස සඳහා වර්ගීකරණය**




වර්ගීකරණය අනුව සමස්ත පහසුතාව සැලකීමේ දී භාෂා අවබෝධය හා සංශ්ලේෂණයට 75%ක් වන ඉහළ ම පහසුතාව ද රචනය හා නිර්මාණකරණ හැකියාවට 55%ක අඩු පහසුතාවක් ද භාෂා විග්‍රහය ඇසුරෙන් සැකසී ඇති ප්‍රශ්න සඳහා 56% පහසුතාවක් ද හිමි වී ඇත. විශ්ලේෂණාත්මක රචනා ලිවීමේ හැකියාව සඳහා ඉහළ පහසුතාවක් අපේක්ෂකයන්ගෙන් බලාපොරොත්තු වුවත් 55%ක අඩු පහසුතා මට්ටමක් පෙන්නුම් කර තිබිණි. එබැවින් රචනා මාතෘකා කෙරෙහි ඔවුන් තුළ ඇති දැනුම, වචන කෝෂය හා ඉදිරිපත් කිරීම මෙන් ම ගලා යාමේ ස්වරූපය ද කෙරෙහි වැඩි අවධානයක් යොමු කළ යුතු බවත් කියවීමෙන් කරුණු රැස් කර ගත යුතු බවත් අවධාරණයෙන් සඳහන් කළ යුතු ය.

## III කොටස

**3.0 පිළිතුරු සැපයීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු හා යෝජනා :**

**3.1. පිළිතුරු සැපයීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු :**

**පොදු උපදෙස් :**

* පිළිතුරු සැපයීම ආරම්භ කිරීමට පෙර ප්‍රශ්න පත්‍රයේ ඇති මූලික උපදෙස් කියවා හොඳින් තේරුම් ගත යුතු ය. එක් එක් කොටසින් කොපමණ ප්‍රශ්න සංඛ්‍යාවකට පිළිතුරු සැපයිය යුතු ද කුමන ප්‍රශ්න අනිවාර්ය ද කොපමණ කාලයක් ලැබේ ද කොපමණ ලකුණු ලැබේ ද යන කරුණු පිළිබඳ ව සැලකිලිමත් විය යුතු වෙයි. එසේ ම ප්‍රශ්න හොඳින් කියවා නිරවුල් අවබෝධයක් ඇති ව ප්‍රශ්න තෝරා ගත යුතු ය. I, II පත්‍ර සඳහා ලබා දී ඇති අමතර කියවීම් කාලය මේ සඳහා යොදා ගත හැකිය.
* I පත්‍රයට සහ II පත්‍රයේ II කොටසට අයත් ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේ දී සෑම ප්‍රධාන පිළිතුරක් ම අලුත් පිටුවකින් ආරම්භ කළ යුතු ය.
* II පත්‍රයේ I කොටසේ ප්‍රශ්න අංකයට ඉදිරියෙන් ඇති වරහන තුළ නිවැරදි වරණයට හිමි අංකය ප්‍රශ්න පත්‍රයේ ම සටහන් කළ යුතු ය.
* ප්‍රශ්න අංක, කොටස් හා අනුකොටස්වල සංකේත නිවැරදි ව ලිවිය යුතු ය.
* ප්‍රශ්නයක කිසියම් අනුකොටසකට පිළිතුරු නොසපයන්නේ නම් එම අනුකොටසට හිමි අක්ෂරය හෝ රෝම ඉලක්කම ලියා ඉදිරියෙන් ඉරක් ඇඳිය යුතු ය.
* අනිවාර්ය ප්‍රශ්න හැරුණු විට අනෙකුත් ප්‍රශ්න එක්වරක් කියවා ඔබ පිළිතුරු ලිවීමට අපේක්ෂිත ප්‍රශ්න මොනවා දැයි ලකුණු කරන්න.
* ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න අංක අනුපිළිවෙළට නො ව ඔබට ඉතා ම හොඳින් පිළිතුරු ලිවිය හැකි ප්‍රශ්නයකින් පිළිතුරු ලිවීම ආරම්භ කරන්න.
* ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස්වලට අනුගත ව ප්‍රශ්න තෝරා ගැනීම කළ යුතු අතර අමතර ව තවත් ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමෙන් වැළකිය යුතු ය.
* පිළිතුරු පත්‍රයේ සෑම පිටුවක ම විභාග අංකය සටහන් කළ යුතු ය.
* ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේ දී කාලය මනා ව කළමනාකරණය කර ගැනීමට වග බලා ගත යුතු ය.
* පිළිතුරු සැපයීමේ දී රතු සහ කොළ පාට පෑන් භාවිත කිරීමෙන් වැළකිය යුතු ය.
* කෙටි පිළිතුරු අපේක්ෂිත ප්‍රශ්නවලට දීර්ඝ පිළිතුරු ලිවීමත්, දීර්ඝ පිළිතුරු අපේක්ෂිත ප්‍රශ්නවලට කෙටි පිළිතුරු ලිවීමත් නො කළ යුතු ය.
* දීර්ඝ පිළිතුරු අපේක්ෂිත ප්‍රශ්නවල දී තර්කානුකූල ව හා විශ්ලේෂණාත්මක ව කරුණු ඉදිරිපත් කළ යුතු ය.

**විශේෂ උපදෙස්**

* I පත්‍රයේ සාහිත්‍ය විචාර ප්‍රශ්න සඳහා පිළිතුරු සැපයීමේ දී උද්ධෘත නිවැරදි ව යෙදීමට සැලකිලිමත් විය යුතු ය.

* ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේ දී නිසි පරිදි කාලය කළමනාකරණයට හුරු විය යුතු ය.

* පැහැදිලි අත් අකුරු ලිවීමටත්, නිවැරදි ලෙස අකුරු යොදා ගැනීමටත් හුරු විය යුතු ය.

* I පත්‍රයට අදාළ සාහිත්‍ය නිදසුන් දැක්වීමේ දී ප්‍රශ්නයට යෝග්‍ය ආකාරයෙන් නිදසුන් තෝරා ගත යුතු ය. එක සමාන නිදසුන් සෑම ප්‍රශ්නයකට ම යෙදීමට උත්සාහ නො කළ යුතු ය.

* II පත්‍රයේ I සහ II කොටස්වල ඇතුළත් ව්‍යාකරණ අනුකොටස්වලට පිළිතුරු සැපයීමේ දී යෝග්‍ය පිළිතුර ම තෝරා ගැනීමට උත්සාහ කළ යුතු ය. මෙහි දී අවබෝධය, දැනුම මෙන් ම තර්කානුකූල චින්තනය ද යොදා ගත හැකි විය යුතු ය.

* තමාගේ හිතුමතය පරිදි යෝග්‍ය යැයි සිතා අංක යෙදීම නො කළ යුතු ය.

* I පත්‍රයේ විචාර ප්‍රශ්නවල දී මෙන් ම II පත්‍රයේ රචනා ප්‍රශ්නයේ දී කරුණු ගැළපීම විධිමත් ව කළ යුතු ය. පිළිතුරෙහි මුල, මැද හා අග අතර විධිමත් ගැළපීමක් පැවතිය යුතු ය.

* ප්‍රශ්නයට අදාළ සෑම කරුණක් ම කිසියම් හේතුවක් නිසා පිළිතුරෙහි ඇතුළත් කිරීමට දුෂ්කරතා ඇති වන අවස්ථාවල දී ලියා ඇති පිළිතුරු මගින් තමන් තුළ පවත්නා දැනුම අනාවරණය කළ යුතු ය.

### 3.2 ඉගෙනුම් හා ඉගැන්වීම් පිළිබඳ අදහස් හා යෝජනා

**අයදුම්කරුවන් සඳහා යෝජනා :**

* විෂය නිර්දේශයට අදාළ පොත්පත් අධ්‍යයනය කිරීමේ දී වැදගත් කරුණු මතකයේ තබා ගැනීමත් ග්‍රන්ථ ආශ්‍රිත කරුණු විචාරාත්මක වශයෙන් විමර්ශනය කිරීමත් අවශ්‍ය වේ.
* නිර්දිෂ්ට ග්‍රන්ථ ආශ්‍රයෙන් ඇසිය හැකි ප්‍රශ්න ගැන විචාරාත්මක ව සිතා බලා පිළිතුරු සෙවීමට උත්සාහ ගැනීම අවශ්‍ය ය. මෙහි දී පැරණි ප්‍රශ්න පත්‍ර කියවා ඒවායේ අඩංගු කරුණු විශ්ලේෂණය කිරීම වැදගත් ය.
* නිර්දිෂ්ට ග්‍රන්ථ හොඳින් කියවා ඒවායේ චරිත නිරූපණය, පරිසර හා අවස්ථා වර්ණනා ගැන මනා අවබෝධයක් ලබා ගැනීම සුදුසු ය.


**ගුරුභවතුන් සඳහා යෝජනා :**

* ප්‍රශ්න පත්‍රවල ආකෘතිය පිළිබඳ ව මනා වැටහීමක් අපේක්ෂකයන් තුළ ඇති කිරීම අවශ්‍ය වේ.
* විෂය නිර්දේශයේ සියලු ම කොටස් පිළිබඳ ව මනා පරිචයක් අපේක්ෂකයන් තුළ ඇති කිරීම සුදුසු ය.
* නිර්දිෂ්ට සාහිත්‍ය ග්‍රන්ථ පරිශීලනයේ අවශ්‍යතාව අපේක්ෂකයන්ට වටහා දී මනා මග පෙන්වීමක් සිදු කිරීම අවශ්‍ය වේ.
* ප්‍රශ්න පත්‍රවල දී ඇති උපදෙස් අනුව ක්‍රියා කිරීමේ අවශ්‍යතාව හා එම උපදෙස් අබිබවා යෑමෙන් විය හැකි හානි පෙන්වා දීම සුදුසු ය.
* පිළිතුරු ලිවීමේ දී කාලය මනා ව කළමනාකරණය කර ගැනීම සඳහා පිළිතුරු ලිවීමේ අභ්‍යාසවල නිරත කරවීම අවශ්‍ය වේ.
* හැකි සෑම විට ම පෙරහුරු පරීක්ෂණවල යොදවමින් විභාගයට මුහුණ දීමේ ශක්තිය අපේක්ෂකයන් තුළ වර්ධනය කිරීම අවශ්‍ය වේ.
* අතිරේක පොත්පත් කියවීමට සිසුන් ධෛර්යවත් කිරීම සුදුසු ය.
* තර්කානුකූල හා විශ්ලේෂණාත්මක චින්තනයට ශිෂ්‍යයන් යොමු කරවීම අවශ්‍ය වේ.
* පොත්පත්වල ඇතුළත් යෝග්‍ය චරිත ශිෂ්‍යයන්ගේ පෞරුෂ වර්ධනයට යොදා ගත හැකි ආකාරය පැහැදිලි කරදීම ද අවශ්‍ය වේ.

**සිසුන්ගේ පිළිතුරුවල ඇති දුර්වලතා හා සාර්ථක පිළිතුරු ලිවීමේ දී අවධානය යොමු කළ යුතු කරුණු**

ඇමුණුම 01


අවස්ථා සම්බන්ධය - (1) ප්‍රශ්නය - (උ) කොටස



අවස්ථා සම්බන්ධය යටතේ ලියා ඇති මෙම පිළිතුර අපේක්ෂිත කරුණු අන්තර්ගත ව ඇති බැවින් සාර්ථක වී ඇත.

ඇමුණුම 02

අවස්ථා සම්බන්ධය - (1) ප්‍රශ්නය - (උ) කොටස




★ මෙම පිළිතුර අසාර්ථක වීමට හේතු වී ඇත්තේ එක් එක් පාඨය උපුටාගත් කතාව, කතුවරයා මෙන් ම එය කවුරුන් විසින්, කා හට, කුමන අවස්ථාවක දී කියන ලද්දක් දැයි පැහැදිලි ව හා නිරවුල් ව සඳහන් නොවීම යි.

එබැවින් නිවැරදි වාක්‍ය ගැළපීම කෙරෙහි අවධානය යොමු කරමින් ඉහත කරුණු පරිපූර්ණ වශයෙන් ඉදිරිපත් කිරීම වැදගත් වේ.

ඇමුණුම 03

රසාස්වාදය - (උෟ) කොටස

(ඉ)


නන්දන චිරසිංහයන් විසින් රචිත මෙම පද්‍ය පන්තිය වලව්වට වැඩි ඇවිත් යන මාතෘකාව ලෙසින් නම් කොට තිබේ. මෙම පද්‍ය පන්තිය මගින් ඈ'රෙ ගැමෙනුගේ ඉහළ සමාජයක වෙසෙන වලව් කුලවතුන්ගේ අභිමානික ක්‍රියා දාමයන් හා ඔවුන්ගේ ගත නැවතුම් නව පරම්පරාවේ සාමාජිකයන් විසින් ගිලිහී ගොස් ඔවුන් නූතන සමාජය හා සමගව ජීවිතයේ බැඳ ගන්නා ආකාරයයි. මනුෂ්‍යත්වයේ ගුණ සුවඳ හඳුනන නව පරම්පරාවක් බිහිව සමාජට ඒ වලව් කුලවතුන්ගේ ගය ඉවතා දුරුගත නොහැකි වූ දෙයකි. මෙහිදී වැඩිය ලෙසින් සැලකිය ගන්වා තිබෙන්නේ මෙහිවි ඇත මනුෂ්‍යත්වය සහිත නව පරම්පරාවයි. ඒ පිළිබඳ විමසා බලමු.


" පරපුරක නම් බුමුල් නඹා විසිවිදු කරන
මෙකවල සැ උළු පිහිල් සෝද සෝදා හරින
දුලක් වැස්සක ඇවිත් සහ සිටියෙත් තිකන
වෙන්න දැන් පෙරකතට ඇවිත් තිබ්බද පිහින"


වලව් කුලවතියක් උරුමය ආකල්ප හා අභිමානික ක්‍රියා හේතුවෙන් දුප්පත් ජනතාව සැමදාම ජීවත්ව සිටියේ බියෙන් සහ හැකිලෙමින්ය. ඔවුන්ගේ නිදහස නැතත් විදීමටත් සමාජයේ ඉහළ ස්ථානයක වැජඹෙන්නෙක් නොහැකි තත්වයක් එකල විදාවී කලුත් සමින් දිනාවට පත් සියල්ලන්ම සැමදාම ප්‍රවේශ කර සිටිනුයේ සම උළුවු යටත් වූලන තුමය ගිලිහී ගොසින් ඔවුන්ටද නිදහසේ දිවිගෙවීමට දිනක් උදාවෙන ලෙසටය. එම බලාපොරොත්තු සියල්ල වර්තමානයේදී සාර්ථක වී ඇති ආකාරය මෙමගින් ගම්‍යය කෙරේ.

" දැනුම නූතන දොර ජනෙල ගානේ විවෘතව
තුව සිතල නිදහසේ එහා මී යන එද්දත
- ලොකයේ සුළඟ ඇවිත් තිරෙන ලෙස එරි වුත
වලව්වට අවු දිනක් සුදු පැලි එක් තනන"

මෙමගින් පෙනෙන ඔවුනගේ වලව්වේ දොර ජනෙල් එක මානයක් විවෘතවත් සිව හිතර ඒ සැකල ඒ වලව් කුලවතියන් ඔවුනට කුහු වාත්තයෙන් කොරළ කෙරෙව් සුව විඳිමින් විප්ලවයක් සහා දැමූ ආකාරය පිළිබඳවෙනි. වලව්වට සෙනෙබ වද්දා හැකිවෙන් විප්ලවයක් ජනිතයෙන ගෙබ වද්දා හැකිවක් වත් එකල ඔවුන් නොහැල අතර වර්තමානයේ ජනතාව විසින් කුලු ප්‍රභව භේද නොසලකා සියල්ලන්ටම එක වූ වලව්වක් සාදා දී ඇත. " සව දෙසක් සුදු ෆ. දැලි එක් තනත" යනුවෙන් ඒය අගැඳිලි වේ.










ලකුණු 16න් 11ක් ලබා ගත් මෙම පිළිතුර බොහෝ දුරට සාර්ථක ව ඇත.

⋆ එහෙත් කවි පන්තියේ ඇතුළත් ව්‍යංග්‍යාර්ථ මෙන් ම " මාන්දම් බිත්ති බඩ නෙරා කොරපොතු ඉහෙන" " වලවුවේ විය ගසින් මීදී රිසි ලෙස හාන", " මහ පෙට්ටගම හායි ගා මහලු කට අරින" ආදි රූපකාර්ථ ද " පරපුරක කළු දුඹුල් ", "සෙවල කෑ උළු පිහිලි" ආදි සංකේතාර්ථ ද අනුප්‍රාස රසය ද කවි පන්තියේ සාර්ථකත්වයට බලපා ඇති ආකාරය පෙන්වා දිය යුතු ය.

## ඇමුණුම 04
## රසාස්වාදය - (ඌ) කොටස








★ රසාස්වාදය සම්බන්ධයෙන් ලියවුණු මෙම පිළිතුර කාව්‍ය රසාස්වාදයේ මූලධර්ම පිළිබඳ ව අබෝධයෙන් තොර ව ලියැවී ඇත.

එහි දී පද්‍ය පන්තියේ සමස්ත අර්ථය අවබෝධ කර නොගැනීම කැපී පෙනෙන දුබලතාවකි. එසේ ම විවිධ කාව්‍යෝපක්‍රම හා කවියා ඒවා යොදා ගන්නා ආකාරය ද විමසුමට ලක් කර නැත. පද්‍ය පමණක් වැඩි වශයෙන් උපුටා දැක්වීම, ලිවීම සඳහා කථ්‍ය ව්‍යාවහාරය යොදා ගැනීම, වාක්‍ය නිර්මාණය නිරවුල් නොවීම හා පිළිතුර ප්‍රමාණවත් නොවීම යන දුබලතාවලින් ගහණ වූ පිළිතුරක් ලෙස මෙය පෙන්වා දිය හැකි ය.

ඇමුණුම 05

සාහිත්‍ය විචාර - (3) ප්‍රශ්නය

[illegible]



සද්ධර්මාලංකාරය ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නයට ලියැවුණු මෙම පිළිතුර බොහෝ දුරට සාර්ථක ය. ලියා ඇති කරුණුවලට අමතර ව,

- අශෝකමාලාවගේ පුණ්‍ය ශක්තිය හා ආත්ම දමනය හේතුවෙන් දුටුගැමුණු රජුගේ ආශීර්වාදය ලැබීම.
- ආරක්ෂකයා අභය තෙරුන්ගේ ආත්ම දමනය හේතුවෙන් තම පිළි සොරකම් කළ හරන්තිකට පවා පිහිට වීම යන කරුණු ඇතුළත් කළ හැකි ය.

සද්ධර්මාලංකාරය දෙවන ධර්මකීර්ති හිමියන් විසින් රචනා කරන ලදි. සාලියරාජ වස්තුව හා ආරක්ඛක අභය ස්ථවිර වස්තුව ඇසුරෙන් මෙම කථා වස්තු නිර්මාණය වී ඇත. පුණ්‍ය ශක්තියට හා ආත්ම දමනයට අනුරූපව පුද්ගලයාගේ මෙලොව හා පරලොව ජීවිත හැඩ ගැසෙන අයුරු මෙම කථා වස්තු වලින් පැහැදිලි දෙන අයුරු සාකාල් වේ.

සාලියරාජ වස්තුව :—

මෙහි එන සාලියරාජ වස්තුවෙහි එන සාලියරාජ කුමාරයා ඉතා දැහැමි පාලකයෙකි. ඔහු විසින් මෙලොව පරලොව සඳහා කුසල් රැස් කිරීමේ අරමුණ ඇති හෙයින් ඔහු රටෙන් බැහැරව යමක් කරමින් ජීවත් වී ඇති හෙයින් බොහෝ විහාරස්ථාන තනා ඇත. බොහෝ නොයෙකුත් දී කරමින් රටට යහපත් සිදු කර ඇති බව පහත අයුරු වෙතේ.

බොහෝ විහාර තැනීම.
වැව් තැනීම.
නිවාස තැනීම.
දුප්පත් ජනතාවට ආහාර සැපයීම.
දන් දීම

යනාදී දින් කරමින් ඔහු ඔහුගේ ජීවිතය සාර්ථක කරනවා. එසේ ම අන් අයගේ ද ජීවිත සාර්ථක කළ අයුරු මෙයින් පෙනේ. දන් දීමෙන් ඇති පුණ්‍ය කර්මයන් පහත ලෙස වේ.

කොටම තව තවත් ශක්තිය ලැබේ.
කුසල් ලැබීම.
මෙලොව පරලොව සඳහා ජීවිතය හැඩ ගැසෙයි.

ලෙස ඔහුගේ ජීවිතය සාර්ථක කර ගැනීමට මේ සියල්ල දේ උපයෝගී වී ඇත. ඔහුගේ මෙම දින් මහිමයෙන් මෙලොව ද පරලොව ද යහපත් ලෙස පාලනය ඇති බව මෙයින් ගමය වේ. ~~ආරක්ඛක අභය~~

ආරක්ඛක අභය ස්ථවිර වස්තුව :—

මෙහි එන භාරත්තික නම් සොරකු නිසා ගම්වාසී ඉතාමත් බියෙන් ජීවත් වේ. මොහුට නොයෙකුත් පීඩාවලට හසු වීමට සිදු වී ඇත. තම ~~සිඳු~~ බිරිඳගෙන් පවා [illegible]යකක් නොලැබී විය. මොහුට ගම්වැසියන් කිසිම නිවසකට පැමිණීමට ඉඩ ලබා නොදී ය. එහෙයින් මොහු විහාරයට යාමට තීරණය කරමින් සිටී.

"ස්වාමීනි, ගැත්තාට පිහිටවහල් වුව මැනව"

යනාදී ලෙස කියමින් ස්වාමින් වහන්සේගේ පිහිට ඉල්ලා සිටී. එවිට උන්වහන්සේ විසින් මොහු හට උපදේශන කළ අයුරු මෙසේ ය.

"ඒට බැඳි ... මළ මිනිය උනා ගෙන ගොස් දුර දමා ඔහු
උණු වතුරින් නහවා කුලාගෙන් තෙල් ගෙන සකල ශරීරය
තෙල් ගල්වා, ඇඳුරෙන් ඇගළ නැත් තමන් ය"
[illegible]

උන්වහන්සේගේ ඇති මෛත්‍රිය, කරුණාව මෙයින් පැහැදිලි වේ. උන්වහන්සේ ඉතා කරුණාවෙන් සලකන ආකාරය මෙයින් මනාවින් පිළිබිඹු වේ. ඔහුට බාලදුන් උපාසකයා උදෑසනින් ම ඔහු සොයමින් විහාරයට පැමිණියේ ය. එවිට සොරා ද තෙරුන් වහන්සේ ද දකිමින් ඔහු විස්මයට පත් විය.

උපාසක මහතෙකු ද. ඔහු ද ඔහු තුළ ශෝන්තිය ඇති හෙයින් ඔහුගේ ක්‍රියාපටිපාටිය ද තෙරුන් වහන්සේගේ ක්‍රියාපටිපාටිය ගත් කල එකිනෙකට බොහෝ සෙයින් වෙනස් ආකාරය පෙනේ. මෙයින් කියවෙන්නේ අනවෝතා මෙයන්ට ගරු කිරීම ඉතා උසස් ගුණයක් ලෙස ය. තෙරුන් වහන්සේ කියා කල ආකාරයට කියා කළ යුතු ය.

පුණ්‍ය ශක්තියට හා ආත්ම දමනයට අනුරූපව පුද්ගලයාගේ මෙලොව පරලොව ජීවන භාවය ගත්තා ආකාරය මෙම කතා වස්තුවලින් මනා ලෙස පැහැදිලි කර දී ඇත. කතුවරයාගේ විශ්වාසනීයත්වය තුළයේ පරලොව ජීවිතයට ද ලකිත්වයක් දීමයි.

නිමුව අත්සනෙක

(3) 07/15

★ මෙම පිළිතුර අදාළ කරුණු ප්‍රමාණවත් ව ඇතුළත් කර, මනා සංවිධානාත්මක ස්වරූපයෙන් ලියා නැත. එහෙත් පහත දැක්වෙන කරුණු නිරවුල් ලෙස පිළිතුරට ඇතුළත් කළ හැකි ව තිබිණි.

සාලිරාජ වස්තුව -


★ තිස්ස නැවැමියාගේ දානමය පුණ්‍යකර්ම හේතුවෙන් ඊළඟ ආත්ම භවයේ දී දුටුගැමුණු රජුට පුත් ව ඉපදීම හා එහි දී නොයෙකුත් ආශ්චර්යයන් ලොවට පහළ කිරීම.
★ සාලිය කුමරා ප්‍රසාද ගුණයෙන් පිරිපුන් වීම.
★ අශෝකමාලාවගේ පුණ්‍ය ශක්තියෙන් උසස් රූප සම්පත්තියක් හා ඖෂධීය කැඳ සැළියක් ලැබීම.
★ ඇයගේ ආත්ම දමනයෙන් දුටුගැමුණු රජුගේ ආශීර්වාදය ලබා ගැනීම.

ආරඤ්ඤක අභය වස්තුව

★ තිස්ස තෙරුන්ගේ ආත්ම දමනය නිසා හරන්තිකට පිහිට වීම.
★ හරන්තිකගේ ආත්ම දමනය හේතුවෙන් සසුන් ගතවීම හා රහත්භාවයට පත් වීම.

ඇමුණුම 07


සාරංශ - (1) ප්‍රශ්නය - සාර්ථක සාරාංශය




- ⋆ මෙම සාරංශය සාර්ථක මට්ටමක පවතියි.
- ⋆ අක්ෂර වින්‍යාසය, පිළි භාවිතය පිළිබඳ දෝෂ අන්තර්ගතය.
- ⋆ කරුණු සංවිධානය කිරීමේ දී පරිපූර්ණභාවය පිළිබඳ ව සැලකිලිමත් වී නැත.

ඇමුණුම 08

සාරංශ - (1) ප්‍රශ්නය - අසාර්ථක සාරාංශය



★ වචන ගණන නියමිත සීමාව ඉක්මවා ඇත. (ලකුණු 03ක් අහිමි විය)


★ ඡේද බෙදා ඇත. ( ලකුණු 2ක් අහිමි විය)


★ භාෂා රටාව හා විධිමත් ව භාෂාව හැසිරවීමේ දෝෂ ඇත.

★ අක්ෂර වින්‍යාසයේ වැරදි ද ඇත.

ඇමුණුම 09

රචනාව - (3) ප්‍රශ්නය





රත්න වර්ණ රැකිරියයි. ඔවුන් සම්ප්‍රදායිකව ආගම දහම අනුව මෙන්ම චාරිත්‍ර වාරිත්‍ර අනුව විවිධත්වයක් පෙන්වූවද මේ ඇඳුමයේ සඟ සමාන අයිතිකාරියන් ඉමුණ. [බෞද්ධ - අබෞද්ධ] වෙසක් මංගල්‍යය මේ වගේ බෞද්ධ නොබෞද්ධ සියල්ලන්ටම විශේෂත්වයක් ගනී. ඒ මෙවර ප්‍රකාශන්කාර වෙසක් මංගල්‍යය ලංකාවේ පැවැත්වීම හේතු වෙති. එම අවස්ථාවට බෞද්ධ ජනයා මෙන්ම වෙනත් ජාතීන්ද සහභාගීවෙමින් පෙළගැස්මෙන් ඇති වූ වෙසු. ඒ සංහිඳියාව නොවේද? සංහිඳියාවය. මන්දයත් සංස්කෘතිය සංහිඳියාව ගොඩ නැගීමේ විශ්ව බලයක් නිතැතින්ම කම් වන නිසාවෙනි. සංහිඳියාව හා සංස්කෘතික උත්සව සිහිපත් කර වන විට නිතැතින්ම අපේ සිතට නැගෙන්නේ කතරගමය. බොදුනුවන් මෙන්ම හින්දුන්ද මහත් විශ්වාසයෙන් අදහන පුදබිමකි. කතරගම පෙරහැර සිහිපත් වන විටම සිතට නැගෙන්නේ මේ රටේ සැරවස් සංස්කෘතිය නොවේද?

සීතල සුළං හමමින් නිදුරා කාමරවලට වී රටේ සංහිඳියාවක් සහතායි කට මැත දොඩවන මහත්වරුන් නොදන්නේද අයවිය. රටේ සමාජනාගම ජනී කුල මල භේද වලින් තොරව සහභාගීව සංහිඳියාවෙන් ජීවත් වෙති. නමුත් ඔවුන්ගේ එම සංහිඳියාව බිඳ හැරීම තුවකෙකුට වාර්ගිකයා විය හැකිය. මන්දයත් තිස් වසරක කුරිරු යුද්ධයෙන්ද වාර්ග කලහයන් පවු හා තවිවු අරමුණු ඉටු කරගත් බොහෝ දෙනෙක් සිටි නාවිණ. ඉංග්‍රීසි පාලකයන් ශ්‍රී ලාංකික ජනතා බෙදා වෙන් කොට අනුව ජය අනාගත් [illegible] [illegible] මෙන් නම අරමුණු ඉටු කරගත් ආකාරයටම වත්මන් අභිප්‍රාය සමූහවාදෙ නොකද රටේ සංහිඳියාව විනාශ කිරීමට කොතෙක් උත්සාහ ගත්තද ජය ඉතේ සිදු නොවේ. සුබනම හේතුවක් ලෙස මෙම සංස්කෘතික උත්සව සැලකිය හැකිය. ජනතාව භේද භින්න කිරීමේ සෑම උත්සාහයක්ම ව්‍යර්ථ වන්නේ රටේ පවතින සංස්කෘතික උත්සව මගින් බව අපේ ඇස් හමා විටම සනාථ වී ඇති කාරණයකි.

අතීතයේ සිටම විශිෂ්ට [illegible] සමකාලීන නොයෙකුත් සංස්කෘතීන් අපට හිමිව ඇති බව [illegible]. එ විශිෂ්ට සංස්කෘතිය විදහා පෙන්වන්නේ විවිධ උත්සව මගිනි. සිංහල හින්දු අලුත් අවුරුද්ද [illegible] සිංහල හින්දු ජනයා සමරද්දී ඔවුන් සියලු දෙනාම සංහිඳියාවෙන් නොවෙසෙන්නේද? ඔවුන් සිදුකරන නම් එකම සංස්කෘතික උත්සවයකදී අප [illegible] දකින කරුණක් නම් එම උත්සවය සැමරීමට සියලු ජාති ආගම් නියෝජනය කරන ආගමික නායකයින් ඇමතීම සිදුවෙයි. ස්වාමීන් වහන්සේලා කතෝලික පියතුමන්ලා, හින්දු පූජකවරු මෙන්ම ඉස්ලාම් ආගමික නායකයින්ද මෙම උත්සව වෙත තමන්ගේ නම සහෝදරත්වයේ දෑත් දිගු කරමින්. එසේ නම් මේ රට තුළ සංහිඳියාව ඇති කිරීමේ [illegible] [illegible] සංස්කෘතික උත්සව නොවන්නේද? සංහිඳියාවේ මුල බීජය වන්නේ සංස්කෘතික උත්සව නොවේද? සංස්කෘතික උත්සවය. එය [illegible] කාරණාවක්. එසේනම් සංස්කෘතික උත්සවයකදීද සංහිඳියාව [illegible] [illegible] [illegible] [illegible] [illegible] [illegible] [illegible] [illegible] [illegible] [illegible] [illegible] [illegible] [illegible]. [illegible] [illegible] [illegible] [illegible] [illegible]. "[illegible] [illegible] [illegible]" [illegible] [illegible] [illegible] [illegible] [illegible] [illegible].

17/25


22/25 − 3 = 19


1/3

- ★ අක්ෂර වින්‍යාසයේ දෝෂ අල්ප ය.
- ★ වාක්‍ය රීතිවල වැරදි ඇත්තේ අල්ප වශයෙනි.
- ★ භාෂාවේ නිර්මාණාත්මක භාවය හොඳ මට්ටමක පවතී.
- ★ කරුණු ප්‍රමාණවත් ව දක්වා ඇත.
- ★ හැඳින්වීම හා නිගමන ඉදිරිපත් කිරීම ද සාර්ථක ය.
- ★ වචන ගණන අධික හෙයින් ලකුණු 03ක් අහිමි වී ඇත

ඇමුණුම 10

රචනාව - (3) ප්‍රශ්නය





* අක්ෂර වින්‍යාසයේ අඩු පාඩු රාශියක් පවතී.
* වාක්‍ය රටාවල වැරදි ද ඇත.
* පිළිගත් ක්‍රමවේදයට අනුව පද බෙදීම ද සිදු කර ඇත.
* මාතෘකාවට අදාළ වන සේ කරුණු අන්තර්ගත ව ඇත.
* මාතෘකාවේ අංශ දෙක ගැන ම ප්‍රමාණවත් අවධානයක් යොමු කර නැත.